වාර්ෂික වාර්තාව 2017

කා.සං.ම.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

අපගේ දැක්ම

" සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති
සියලු ම කර්මාන්ත
සංවර්ධනය කිරීම. "

අපගේ මෙහෙවර

" සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති
සියලු ම කර්මාන්ත දිරිමත් කිරීම,
ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම
සඳහා අවශ්‍ය ක්‍රමෝපායික, තාක්ෂණික
සහ වාණිජමය
පදනම සපයා දීම. "

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය

2015 පෙබරවාරි සිට 2017 දෙසැම්බර් දක්වා

මහින්ද ජිනසේන මහතා	-	සභාපති

2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා

සන්ධ්‍යා විජයබණ්ඩාර මහත්මිය	-	නිල බලයෙන් පත්වන සාමාජික

2017 ජනවාරි සිට අගෝස්තු දක්වා

ටී.ඩී.එස්. පෙරේරා මහතා	-	නිල බලයෙන් පත්වන සමාජික

2017 ජනවාරි සිට මැයි දක්වා

දර්ශන විජේසිරිවර්ධන මහතා	-	නිල බලයෙන් පත්වන සාමාජික

2017 ජූනි සිට දෙසැම්බර් දක්වා

එම්.එන්.ඩී. ගුණරත්න මහතා	-	නිල බලයෙන් පත්වන සාමාජික

2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා

රෝයි ජයසිංහ මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල උපදේශක

2015 පෙබරවාරි සිට 2017 දෙසැම්බර් දක්වා

කලීල් රහුමතුල්ලා මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ශ්‍යාමින් පෙරේරා මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
නිෂාධ ගමගේ මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2017 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා

බී.එන්.පී. මෙන්ඩිස් මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2017 ජූලි සිට 2017 දෙසැම්බර් දක්වා

සංජීව දික්වැල්ල මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2017 ජනවාරි සිට ජූනි දක්වා

මාලිකා සමරවීර මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

සභාපතිතුමාගේ පණිවුඩය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2017 මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවට මාගේ පණිවුඩය ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම අතිශය සතුටු වෙමි.

ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ස්ථාපිත කර ඇති ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන කාර්මික සංවර්ධන මණ්ඩලය දශක හතරකට අධික කාලයක් පුරා කාර්මාන්තකරුවන්ට අවශ්‍ය උපකාරක සේවා සහ සහාය සපයා දී ඇති බව මහත් අභිමානයෙන් යුතුව සඳහන් කරමි. මෙම ක්‍රියාවලිය ඉදිරියටත් අඛණ්ඩව පවත්වා ගෙන යාම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය මෙරට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි වර්ධනයට අදාළ විවිධ වූ ගැටළු විසඳා දීම පිණිස 2017 වර්ෂයේදී ද අමාත්‍යාංශයේ සහාය සහ මග පෙන්වීම යටතේ විවිධ ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාත්මක කළේය.

කාර්මික සංවර්ධන මණ්ඩලය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මග පෙන්වීම මත අදියර තුනක් යටතේ රුපියල් මිලියන 140 ක සමස්ත ප්‍රතිපාදනයක් වැය කර ප්‍රතිනය ලත් ආහාර රසායනාගාරයක් ස්ථාපිත කිරීමට පියවර ගත්තේය. එම ව්‍යාපෘතිය මෙරට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට මහත් ප්‍රතිලාභ අත්කර දෙමින්, වඩාත් ම වැදගත් කරුණ ලෙස මෙරට ආර්ථික සංවර්ධනයට ඉමහත් දායකත්වයක් සපයා දෙනු ඇතැයි කර්මාන්ත සඳහා පහසුකම් සලසන්නෙකු වශයෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය විශ්වාස කරයි.

රේඛීය අමාත්‍යාංශය සහ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතියක් වන රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය ඉදි කිරීමේ සමස්ත ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා පියවර ගන්නා ලදී. රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය රොබෝ තාක්ෂණ පද්ධති සැලසුම් කිරීම, සකස් කිරීම සහ පරීක්ෂා කිරීම සිදු කරන තාක්ෂණය ලබාදීමේ සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වනු ඇති අතර, එය පෞද්ගලික අංශයේ කර්මාන්ත සහ රජයේ සේවාදායකයින් සඳහා තාක්ෂණය සපයා දෙන මාධ්‍යයක් වනු ඇත.

2017 වර්ෂය තුළදී අපි මණ්ඩලයේ එක් එක් අංශයෙහි විෂය පථය පුළුල් කර, පාරිභෝගිකයින්ට සපයා දෙන සේවාවන්හි ගුණාත්මක භාවය ඉහළ නැංවීම මගින් තිරසර ආකාරයකට කර්මාන්තකරුවන් සඳහා සේවා සැපයීමේ ධාරිතාවය වැඩි දියුණු කළෙමු. එමෙන් ම, ක්‍රියාවලි සංවර්ධනය, නිෂ්පාදන සංවර්ධනය, මානව ප්‍රාග්ධන සංවර්ධනය, සැපයුම් දාම සංවර්ධනය, නිෂ්පාදන පද්ධති සංවර්ධනය ආදී ක්ෂේත්‍රවල ව්‍යාපෘති සඳහා සපයා දෙන ලද අමාත්‍යාංශ අරමුදල් උපයෝජනය කිරීමේදී අපි වඩාත් ම පිරිවැය ඵලදායී ආකාරයට අපගේ මෙහෙයුම් කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කළෙමු. තවද, ප්‍රීතිමත් සහ තෘප්තිමත් මානව ප්‍රාග්ධනයක් බිහි කිරීමට හේතු වන සුභදායී වාතාවරණයක් සහතික කිරීම පිණිස සේවා ස්ථානයෙහිදී පිළිපැදිය යුතු ආචාර ධර්ම උගන්වන අතර ම උසස් වීම් සහ දිරි දීමනා ආදිය සඳහා වන නිර්ණායක ලෙස අනුගත කර ගත යුතු, නූතන මානව සම්පත් පරිවයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය අන්තර් මහාද්වීපික මානව සම්පත් කළමනාකරණ ආයතනය (IIHRM) නැමති ආයතනයට පවරන ලදී. එයට අමතරව, කාර්මික සංවර්ධන මණ්ඩලය ව්‍යවසායකත්ව ගම්මාන සහ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනය, නිෂ්පාදන ගම්මාන සංවර්ධනය, බස්නාහිර පළාතේ ආහාර කර්මාන්ත සංවර්ධනය, දැව ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය සහ කාර්මික ජනපදවල පවතින යටිතල පහසුකම් නවීකරණය කිරීම ආදිය පිළිබඳ තවත් වැඩසටහන් ගණනාවක් ද සාර්ථකව නිම කළේය.

පසු ගිය වසර කිහිපය පුරා මෙරට ආර්ථිකය ඉතා විශාල පරිවර්තනයකට භාජනය වෙමින් තිබූ බැවින් මෙම වර්ෂය තුළ සිදු කරන ලද ව්‍යාපෘති සලකා බැලීමේදී එමගින් එක් වර්ෂයක් තුළ අත් කර ගත් ප්‍රතිඵල මත අති විශාල පරිවර්තනාත්මක බලපෑමක් ඇති කර තිබෙන බව පැහැදිලි වේ. පසුගිය වර්ෂයේ යම් අවස්ථාවක අපගේ කාර්ය සාධනයට බලපෑම් ඇති කළ එම සාධක ම ඉදිරියටත් 2018 වර්ෂයේ දී ද අපගේ ලාභ උත්පාදනයන්ට බාධාකාරී වනු ඇතැයි අපි හඳුනා ගෙන ඇත්තෙමු. කෙසේ වෙතත්, ඉදිරි වර්ෂයේදී ද මණ්ඩලයේ ලාභදායීත්වය ඉහළ නැංවීම අපගේ වගකීම වන බැවින් දැනට සිදු කෙරෙමින් පවතින පුළුල් කිරීම් සහ පිරිවැය වැඩි දියුණු කිරීමේ ආයෝජන අපි ඉදිරියටත් අඛණ්ඩව ක්‍රියාත්මක කරන්නෙමු.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සෑම මුඛ්‍ය ප්‍රයත්නයකදී ම කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මහතා විසින් ලබාදෙන ලද අවංක සහයෝගීත්වය, සහාය සහ මග පෙන්වීම වෙනුවෙන් එතුමාට මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි. එමෙන්ම, මණ්ඩලය මෙතෙක් අත් කර ගෙන ඇති බොහෝ ජයග්‍රහණ කරා මණ්ඩලය රැගෙන යාමට නිසැකව ම උපකාරී වූ, අපගේ කැපවීමෙන් යුතු කාර්ය මණ්ඩලය සතු දැක්ම සහ ඔවුන් නිරන්තරයෙන් ලබා දුන් අගනා සහාය මම අවංකව ම දැඩි ඇගයීමට ලක් කරමි.

මහින්ද ජිනසේන
සභාපති

අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ සමාලෝචනය

ආයතනික කාර්ය සාධනයෙහි පුළුල් දෘෂ්ටි කෝණයන් සලකා බැලීමේදී ආයතනයෙහි වාර්ෂික වාර්තාව සකස් කිරීමේ කාර්යය ඉතා භාරදූර වගකීමක් වේ. පැහැදිලිව ම, වාර්ෂික වාර්තාව යනු ආයතනයෙහි සම්පත් කෙතරම් කාර්යක්ෂම ආකාරයෙන් වෙන් කර තිබේද සහ භාවිතා කර තිබේද යන්න පිළිබිඹු කෙරෙන ඇගයීමක් පමණක් ම නොව, එය වර්ෂය සඳහා වන සැලසුම් ක්‍රියාත්මක කිරීමෙහි දී සිදු වී ඇති අඩුපාඩු පිළිබඳ ඇගයීමක් ද වේ. එය ඉදිරියට එළැඹෙන වර්ෂ සඳහා වන උපාය මාර්ග නැවත නිර්වචනය කිරීම සඳහා සහ බාධාවන් මැඩපවත්වා ගැනීම සඳහා ද උපකාරී වේ. එබැවින්, දේශීය කර්මාන්ත සංවර්ධන ක්‍රියාවලිය තුළ සිදු කෙරෙන ආයතනික සහභාගීත්වයන්ට යම් අන්තර්ගතයන් එක් කිරීම සඳහා අවකාශය තබමින්, භෞතික සහ මූල්‍ය අංශවල ආයතනික ප්‍රගතිය අවබෝධ කර ගැනීම පිණිස සකස් කෙරෙන 2017 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවට මාගේ අදහස් එක් කිරීමට ලැබීම පිළිබඳ මම ඉතා සතුටු වෙමි.

2017 වර්ෂය යනු මෙරට ආර්ථිකය දේශීය කර්මාන්තවල තීක්ෂණ සහ උපාය මාර්ගික සංවර්ධන පරිශ්‍රමයක් විසින් ප්‍රධාන වශයෙන් ම ඌනපූරණය කළ යුතු වූ, කඩිනම් ප්‍රකෘතිමත් කිරීමක් අවශ්‍ය කළ වර්ෂයක් විය. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංඛ්‍යාත්මක වශයෙන් දේශීය කර්මාන්ත අංශයෙහි වඩා විශාල කොටසක් නියෝජනය කරන බැවින් කාර්මික සංවර්ධන මණ්ඩලය දේශීය කර්මාන්ත යෝග්‍ය වර්ධන මට්ටමකට නගා සිටුවීම පිණිස ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල ධාරිතාවයන් ශක්තිමත් කිරීමෙහි වැදගත්කම අවබෝධ කර ගෙන තිබේ.

මෙම කාරණයෙහි දී පෞද්ගලික අංශයෙහි තිබෙන වඩා විශාල කර්මාන්තවලට ඒවායෙහි ව්‍යාපාර සීමාවන් අන්තර්ජාතික පරිමාණයේ මට්ටමට පුළුල් කරමින් දළ දේශීය නිෂ්පාදිතයට වැඩි ශක්තියක් ලබාදීම සඳහා විශාල කාර්ය භාරයක් ඉටු කිරීමට තිබේ. එහෙයින්, වඩා විශාල කර්මාන්ත විසින් සැලකිය යුතු මට්ටමේ අගය එකතු කිරීම් සිදු කරමින්, වැඩි ප්‍රතිලාභ ලබා ගත හැකි විශේෂිත මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා අවස්ථාව උදාකර ගනිමින්, ඒවායෙහි සුළු මෙහෙයුම් සිදු කිරීම සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වලට දොරටු විවර කර දෙනු ලැබිය හැක. මෙවැනි ආකාරයේ ක්‍රමවේදයක් තුළ වෙළඳ පොළ විසින් අපේක්ෂා කරනු ලබන පරිදි ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ගුණාත්මක භාවයට, පිරිවැයට, ප්‍රමාණයට සහ සම්මතයන්ට අදාළව අවශ්‍ය කරන නිෂ්පාදන ශක්‍යතාවයන්ට අනුකූල කිරීමේ කාර්ය භාරය කාර්මික සංවර්ධන මණ්ඩලයට පැවරී තිබේ.

මෙම වර්ෂයේ දී කාර්මික සංවර්ධන මණ්ඩලය මූල්‍ය, අලෙවිකරණ, තාක්ෂණ, මානව සම්පත් සහ මෙහෙයුම් කළමනාකරණ යන ක්ෂේත්‍රවල නිපුණතා වැඩි දියුණු කිරීම පිණිස දැනුම ලබාදීම, සම්බන්ධතා ගොඩනැගීම, ක්‍රියාවලි සංවර්ධනය සහ මානව ප්‍රාග්ධනය නගා සිටුවීම වැනි ක්‍රම හරහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට සහාය සපයා දෙමින් ඒවා ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. තවද, කාර්මික සංවර්ධන මණ්ඩලය දිවයින පුරා පිහිටි ආහාර අංශයේ කර්මාන්ත ආවරණය කරමින් සාර්ථක ක්‍රියාවලි වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. ක්‍රියාවලි හැකියාවන් ඉහළ නැංවීම සඳහා මෙම කර්මාන්ත වලට පරිනමනු ලබන මූල්‍ය සහාය සත්‍ය වශයෙන් ම ඵලදායීත්වය වැඩි දියුණු කිරීම සඳහා වන දිරි ගැන්වීමක් වේ. එයට සමගාමීව, වඩාත් උසස් සේවාවක් පිරිනැමීම පිණිස, කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්මික ජනපද ද ඇතුළුව සියලුම සේවා සැපයුම් ඒකක ආවරණය කරමින් ආයතනික පහසුකම් පදනම වැඩි දියුණු කිරීමේ ක්‍රියාමාර්ග මේ වන විට ක්‍රියාත්මක කෙරෙමින් පවතී. එමෙන් ම, රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම, ආහාර නිෂ්පාදන සහ ඒ ආශ්‍රිත රසායනික ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා වන රසායනාගාර පහසුකම් ස්ථාපිත කිරීම, සහ රබර් නිෂ්පාදන සංවර්ධන හා සේවා මධ්‍යස්ථානය සහ ඉංජිනේරු වාත්තු වැඩපොළ සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර සහ පරීක්ෂණ උපකරණ සපයා දීම ආදිය සඳහා ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ හැරෙන්නට, සියලුම ආයතනික සම්බන්ධවීම් වලදී අදාළ මාර්ගෝපදේශ සහ නියමයන්ට අනුකූල වන බව සහතික කිරීම පිණිස කළමනාකරණය විගණනය මගින් සොයා ගෙන ඇති කරුණු කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇත.

මෙම වර්ෂය තුළදී අප විසින් දරන ලද ප්‍රයත්නයන් සාර්ථක කර ගැනීම පිණිස කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමන්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්, ලේකම්තුමා, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ කාර්ය මණ්ඩලය විසින් අප වෙත ලබාදෙන ලද දිරි ගැන්වීම, අවශ්‍ය අනුමැතීන් සහ සහයෝගය වෙනුවෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාව කර ගනිමි.

අප විසින් සැලසුම් කරන ලද පරිදි අපගේ අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීම සඳහා අප වෙත ලබා දුන් මාර්ගෝපදේශකත්වය, උපදෙස් සහ මග පෙන්වීම වෙනුවෙන් සභාපතිතුමාටත්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ටත්, විගණන සහ කළමනාකරණ කමිටුවටත් මාගේ කෘතඥතාවය පළ කරමි. එමෙන් ම, 2017 වර්ෂයෙහි දී අප විසින් දරණ ලද සියලු ප්‍රයත්නයන්හි දී දැක්වූ කණ්ඩායම් පරිශ්‍රමය සහ කැපවීම වෙනුවෙන් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයටත්, සමස්ත කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම කෘතඥතාවය පළ කරමි.

පී.එල්.ඒ. රත්නමලල,

අධ්‍යක්ෂ ජෙනරාල්

පටුන

1.0	ආයතනය	**01-04**
1.1	පසුබිම	
1.2	මණ්ඩලයෙහි අරමුණු	
1.3	මණ්ඩලයෙහි අංශ විසින් සපයනු ලබන සේවා	
1.4	ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර/කර්මාන්ත සඳහා සපයා දෙනු ලබන ප්‍රධාන සේවා, සහ පහසුකම්	
1.5	ආයතනික ව්‍යූහය	
2.0	**2017** වර්ෂයේ ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් පාදක කාර්ය සාධනය	**05-13**
2.1	දළ විශ්ලේෂණය	
2.2	කාර්ය සාධන සමාලෝචනය	
2.3	තාක්ෂණය ලබාදීම්, සේවා දායක අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන්, සහ නිෂ්පාදන සංවර්ධන	
2.4	අංශ අනුව **2017** ක්‍රියාත්මක සැලැස්මෙහි ප්‍රගති සාරාංශය	
3.0	විශේෂ ව්‍යාපෘති / වැඩසටහන් සහ ප්‍රදර්ශන **2017**	**14-16**
3.1	ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ ආහාර කර්මාන්ත නගා සිටුවීම සඳහා මූල්‍ය සහාය	
3.2	පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය **2017**	
3.3	සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා කා.සං.ම. සන්නාමකරණ වැඩසටහන සමග දෙරණ සු.ම.ක. සමාජය	
3.4	පී.යූ.එම්. නෙදර්ලන්ඩ්ස් සීනියර් එක්ස්පර්ට්ස් සංවිධානය සමග අවබෝධතා ගිවිසුම	
3.5	ඇසුරුම්කරණ සංවර්ධන වැඩසටහන **2017** හරහා ආහාර අංශයේ සු.ම.ක. සඳහා පහසුකම් සැලසීම	
3.6	ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය	
3.7	ඉවත ලන කඩදාසි ප්‍රතිචක්‍රීකරණය සහ අතින් සාදන කඩදාසි නිෂ්පාදනය	
4.0	එක් එක් අංශයෙහි ප්‍රමුඛ වැඩසටහන්	**17**
▪	පරිපාලන අංශය **(AD)**	**18**
▪	ප්‍රාදේශීය සංවර්ධන අංශය **(RDD)**	**19-22**
▪	සැලසුම් අංශය **(PD)**	**23**
▪	අලෙවි අංශය **(MD)**	**24-25**
▪	කාර්මික ජනපද අංශය **(IED)**	**26-31**
▪	ඉංජිනේරු අංශය **(ED)**	**32-33**
▪	ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය **(CEDACS)**	**34**
▪	තාක්ෂණ සේවා අංශය **(TSD)**	**35-39**
▪	සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය **(CDLPF)**	**40**
▪	රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය **(RPD & SC)**	**41-43**
5.0	මූල්‍ය ප්‍රකාශන	**44**
▪	විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	**45**
▪	විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	**46**
▪	හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය	**47**
▪	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	**48**
▪	වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු	**49-67**
6.0	මණ්ඩලයේ අදහස් දැක්වීම පිණිස විගණකාධිපතිවරයාගේ වාර්තාව	**68-80**

කෙටි යෙදුම් ලේඛනය

AAT	-	ගණකාධිකාරී ශිල්පීන්ගේ සංගමය
AD	-	පරිපාලන අංශය
ATRDC	-	යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
BHC	-	ව්‍යාපාර සෞඛ්‍ය සහතිකය
CDLPF	-	සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය
CEDACS	-	ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය
CP	-	පිවිතුරු නිෂ්පාදන
CSC	-	පොදු සේවා මධ්‍යස්ථානය
ED	-	ඉංජිනේරු අංශය
EMS	-	පරිසර කළමනාකරණ ක්‍රමවේද
EPC	-	විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය
EPL	-	පරිසර ආරක්ෂණ බලපත්‍රය
EPM	-	ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරු
GP	-	හරිත ඵලදායීතාව
HRD	-	මානව සම්පත් සංවර්ධනය
HRM	-	මානව සම්පත් කළමනාකරණය
ICT	-	තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය
IDB	-	කාර්මික සංවර්ධන මණ්ඩලය
IED	-	කාර්මින ජනපද අංශය
IEs	-	කාර්මික ජනපද
ISO	-	ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය
GMP	-	යහපත් නිෂ්පාදන පරිචය
HM	-	උසස් කළමනාකරණය
HMI	-	මානව යන්ත්‍ර අතුරු මුහුණත
MD	-	අලෙවි අංශය
MM	-	මධ්‍යම කළමනාකරණය
MOU	-	අවබෝධතා ගිවිසුම
MOIC	-	කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
MSMEs	-	ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
MT	-	මෙට්‍රික් ටොන්
NCPC	-	ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය
NGRS	-	ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය
OHSAS	-	වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය
PD	-	සැලසුම් අංශය
PLC	-	සීමිත පොදු සමාගම්
PVC	-	පොලි වීනයිල් ක්ලෝරයිඩ්
RDD	-	ප්‍රාදේශීය සංවර්ධන අංශය
RM	-	අමුද්‍රව්‍ය
RPD & SC	-	රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය
SCP	-	තිරසර පරිභෝජන සහ නිෂ්පාදන
SCX	-	උප කොන්ත්‍රාත් හුවමාරු
SME	-	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
SMI	-	සුළු හා මධ්‍ය පරිමාණ ආයතන
SLIIT	-	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය
SLIM	-	ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය
SOP	-	උසස් වීම් පටිපාටිය
SOR	-	බඳවා ගැනීම් පටිපාටිය
TSD	-	තාක්ෂණ සේවා අංශය
TOT	-	පුහුණුකරුවන් පුහුණු කිරීම
UNOPS	-	ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව

1. ආයතනය

1.1 පසුබිම

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මුලින් ම 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1966 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. පසුව 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය එහි වර්තමාන ස්වරූපයෙන් සංස්ථාගත කරන ලදී. මෙම පනත ප්‍රකාරව කාර්මික සංවර්ධන මණ්ඩලයට ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ වගකීම පැවරී තිබේ.

1.2 මණ්ඩලයෙහි අරමුණු

1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනතෙහි සඳහන් කර ඇති පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ.

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා සහාය වීම.
- මෙරට ආර්ථිකයෙහි පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්ට අයත් සියලුම කාර්මික ව්‍යාපාරයන්හි නිසි සම්බන්ධීකරණය සහ එකිනෙකට සබැඳි වර්ධනය සඳහා සහාය වීම.
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝජනය කිරීම, කර්මාන්ත වලදී භාවිතා කරනු ලබන තාක්ෂණික ක්‍රියාවලීන් සහ ක්‍රමවේද වැඩි දියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා යෝග්‍ය තාක්ෂණයන් සහ උපකරණ සංවර්ධනය කිරීම, සහ උත්පාදනය වන අපද්‍රව්‍ය වඩා යහපත් ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රියාවලි සහ ක්‍රමවේද සකස් කිරීම යන අරමුණු ඇතිව කාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- දේශීය කර්මාන්ත නිෂ්පාදන විදේශීය වෙළඳ පොළට අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය වන හෝ හිතකර වන පරිදි අන්තර් ජාතික වෙළඳාම සහ කලාපීය සහයෝගීතාවය යන ක්ෂේත්‍රවලදී ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා සහාය දීම.
- ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ, සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් සපයා දීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම කාර්මික ව්‍යාපාරයකට හෝ කාර්මික ආයතනකට හෝ ඒවාට අදාළව අවශ්‍ය කරන සෑම ආකාරයකම පහසුකම් සහ සේවා සැපයීම.

1.3 මණ්ඩලයේ අංශ සහ සේවා

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා සේවා පැකේජයක් සපයා දීම පිණිස මණ්ඩලය අංශ නවයකින් සහ සම්භාණ්ඩ සහ රබර් යන අංශ සඳහා ම කැපවූ සේවා මධ්‍යස්ථාන දෙකකින් සමන්විත වේ.

1. පරිපාලන අංශය (AD)
2. ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD)
3. සැලසුම් අංශය (PD)
4. අලෙවි අංශය (MD)
5. කාර්මික ජනපද අංශය (IED)
6. ඉංජිනේරු අංශය (ED)
7. ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය (CEDACS)
8. තාක්ෂණ සේවා අංශය (TSD)
9. මුදල් අංශය (FD)
10. සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLPF)
11. රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RPDSC)

කාර්යාල 25 ක් සහිත දිස්ත්‍රික් කාර්යාල ජාලය ප්‍රාදේශීය සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන අතර, කාර්මික ජනපද 19 කාර්මික ජනපද අංශය යටතේ ක්‍රියාත්මක වේ. ඉංජිනේරු අංශය යටතේ ක්‍රියාත්මක වන සේවා මධ්‍යස්ථාන දෙකක් තිබේ. දේශීය කර්මාන්තකරුවන්ට පහසුකම් සැලසීම පිණිස තාක්ෂණ සේවා අංශය, සම්භාණ්ඩ නිෂ්පාදන සංවර්ධන අංශය, රබර් නිෂ්පාදන සංවර්ධන අංශය සහ ඉංජිනේරු අංශය විසින් තාක්ෂණය ලබාදීම සහ අනෙකුත් අදාළ සේවා සපයා දීම සිදු කරනු ලැබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අනුමත සමස්ත සේවක සංඛ්‍යාව 714 ක් වන අතර එම සේවකයින් කාර්ය මණ්ඩල මට්ටම් 11 ක් යටතේ වර්ග කර ඇත.

1.4 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර / කර්මාන්ත සඳහා සපයා දෙනු ලබන ප්‍රධාන සේවා සහ පහසුකම්



1.5 ආයතනික ව්‍යුහය



2.0 ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් පාදක කාර්ය සාධනය - 2017 වර්ෂය

2.1 සංක්ෂේපය

මෙරට තිබෙන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල වර්ධනයට අදාළ වර්තමාන ගැටළු පිළිබඳව වඩා වැඩි අවධානයක් යොමු කරමින් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙම වර්ෂය තුළදී ක්‍රියාමාර්ග ගණනාවක් දියත් කරන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලය 2017 වර්ෂය වන විටත් ක්‍රියාත්මක කර තිබූ සංවර්ධන වැඩසටහන් තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කරන අතර ම දේශීය කර්මාන්තවල මෙහෙයුම් නගා සිටුවීම මෙම සංවර්ධන ක්‍රියාමාර්ගයෙහි ප්‍රධානතම අරමුණ විය.

අමාත්‍යාංශයෙහි සහයෝගය සහ මග පෙන්වීම මත ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ක්‍රියාවලි සංවර්ධනය, නිෂ්පාදන සංවර්ධනය, මානව ප්‍රාග්ධන සංවර්ධනය, සැපයුම් දාම සංවර්ධනය, නිෂ්පාදන පද්ධති සංවර්ධනය, නිෂ්පාදන ගුණාත්මක භාවය ඉහළ නැංවීම, ව්‍යාපාර නිපුණතා සංවර්ධනය කිරීම, අලෙවිකරණ සහ සන්නාමකරණ සංවර්ධනය, තාක්ෂණය වැඩි දියුණු කිරීම, ව්‍යවසායකත්ව සංවර්ධනය, යහපත් කළමනාකරණ පරිචයන් වැඩි දියුණු කිරීම, විශේෂිත අමුද්‍රව්‍ය සැපයුම සඳහා පහසුකම් සැලසීම, මූල්‍ය සේවා වෙත ප්‍රවේශ වීම සඳහා පහසුකම් සැලසීම, කාර්මික මෙහෙයුම් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, සහ නව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම වැනි ක්ෂේත්‍රවලට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති නිම කිරීම සඳහා අවශ්‍ය කරන අරමුදල් උපයෝජනය කිරීමට හැකි විය.

එයට අමතරව කාර්මික සංවර්ධන මණ්ඩලය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙහි අරමුදල් සැපයීම යටතේ ව්‍යවසායකත්ව ගම්මාන සහ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනය, නිෂ්පාදන ගම්මාන සංවර්ධනය, බස්නාහිර පළාතේ ආහාර කර්මාන්ත සංවර්ධනය කිරීම සහ දැව ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම සම්බන්ධ වැඩසටහන් ගණනාවක් ද ක්‍රියාත්මක කර ඇත.

2.2 කාර්ය සාධන සමාලෝචනය

මෙම වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් 2.1 රූපසටහනෙහි පෙන්වා ඇති පරිදි සාරාංශ කර ඇත. ඒ අනුව එම සංවර්ධන වැඩසටහන් මූලික වශයෙන් පහත සඳහන් ආකාරයට කාණ්ඩ කළ හැක.

01. හැකියා සංවර්ධන, ව්‍යවසායකත්ව සංවර්ධන සහ කළමනාකරණ පුහුණු වැඩසටහන් - වැඩසටහන් 157 ක් පවත්වන ලද අතර ඒවාට සහභාගී වූ නව සහ දැනට සිටින ව්‍යවසායකයින් සංඛ්‍යාව 2,289 ක් විය.

02. ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ මේද ආදී ක්ෂේත්‍ර පිළිබඳ තාක්ෂණය ලබාදීමේ, තාක්ෂණ නිපුණතා සහ සේවාදායකයින්ගේ අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන් - පවත්වන ලද මුළු වැඩසටහන් සංඛ්‍යාව 258 ක් වූ අතර අනාගත ව්‍යවසායකයින් 3,905 දෙනෙකු එයින් ප්‍රතිලාභ ලැබූහ.

03. ව්‍යාපෘති ශක්‍යතා වාර්තා 188 ක් සකස් කරන ලදී.

04. සපයා දෙන ලද වාත්තු වැඩපොළ සහ ඉංජිනේරු සේවා සහ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අලුතින් සැකසීම් - 741

05. අලෙවිකරණ සහාය සපයා දීම් - 704.

06. මූල්‍ය සේවා වෙත ප්‍රවේශ වීම සඳහා පහසුකම් සැලසීම් - 105.

07. වෙළඳපොළ ප්‍රදර්ශන හරහා ප්‍රතිලාභ ලැබූ කර්මාන්තකරුවන් සංඛ්‍යාව - 1,200

08. විශේෂිත අමුද්‍රව්‍ය සැපයීම සඳහා පහසුකම් සැලසීම,

සැකසුම් කළ
- රබර් මිශ්‍රණ - මෙ.ටො. 62
- රබර් කිරි - ලී. 13,750

සැකසුම් නොකළ
- අබලි අමුද්‍රව්‍ය - මෙ.ටො. 1,680
- Kasper බෝතල් - 3,245

09. කාර්මික ජනපද 13 ක කර්මාන්ත මෙහෙයුම් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

10. පද්ධති සහතිකකරණ සහ ප්‍රමිති සහතික ලබා ගැනීම සඳහා සහයෝගය ලබා දෙන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව,
- GMP – කර්මාන්ත 16
- ISO – කර්මාන්ත 13

2.3 තාක්ෂණය ලබාදීම්, සේවා දායක අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන් සහ නිෂ්පාදන සංවර්ධන

ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, සම්භාණ්ඩ, රබර් ආදී කර්මාන්ත ක්ෂේත්‍ර පිළිබඳ තාක්ෂණය ලබා දීමේ වැඩසටහන් 258 ක් පවත්වන ලද අතර, එම වැඩසටහන් වලින් අනාගත ව්‍යවසායකයින් 3,950 ක් දෙනා ප්‍රතිලාභ ලැබූහ. "මුහුදු ශාක සුපෝෂිත විස්කෝතු", "කොස් ඇට දෝසි" සහ "විජලන එළවළු සුප් මිශ්‍රණය" නැමති නිෂ්පාදන තුන අලුතින් සකස් කරන ලද අතර, දැනට සිටින සහ නව කර්මාන්තකරුවන් 843 දෙනෙකු සඳහා සේවා දායක අවශ්‍යතාවය අනුව සකස් කරන ලද පුහුණු වැඩසටහන් 41 ක් පවත් වන ලදී.

තවද, විදේශීය තාක්ෂණයන් 08 ක් අලුතින් ලබාගෙන එම තාක්ෂණයන් විවිධ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වෙත ලබා දෙන ලදී.



රූපසටහන 2.1 - මණ්ඩලය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන් - 2017

2.4 – අංශ අනුව 2017 ක්‍රියාත්මක සැලැස්මෙහි ප්‍රගති සාරාංශය

එක් එක් අංශයෙහි කාර්ය සාධනය

අංකය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශකය	භෞතික ප්‍රගතිය	
			සමුච්චිතය	
			ඉලක්කය	සාධනය
අංශය: ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය				
1	ලබාදෙන ලද තිළිණ සංඛ්‍යාව	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	3	2
		සහභාගී වූ සේවකයින් / කර්මාන්තකරුවන් සංඛ්‍යාව	60	61
2	පුහුණු වැඩසටහන් පැවැත්වීම (ව්‍යවසායකත්ව සංවර්ධන, අලෙවිකරණ සහ මූල්‍ය කළමනාකරණ ආදිය)	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	8	6
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	160	119
3	ඊ-පුවත් සඟරාව පළ කිරීම	පළ කරන ලද ඊ-පුවත් සඟරා සංඛ්‍යාව	4	3
4	කර්මාන්ත සඟරාව සම්පාදනය කිරීම	පළ කරන ලද සඟරා සංඛ්‍යාව	3	2
5	ව්‍යවසායකයින්/කර්මාන්තකරුවන්/රාජ්‍ය සහ බාහිර ආයතන සඳහා සේවාදායක අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද සේවාදායක අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	4	16
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	80	293
6	තොරතුරු ප්‍රචාරණය කිරීම.	සපයා දෙන ලද තොරතුරු සංඛ්‍යාව	700	1647
7	යන්ත්‍ර සූත්‍ර / මාර්ගගත / ග්‍රන්ථ නාමාවලි දත්ත සංචිත යාවත්කාලීන කිරීම.	ඇතුළත් කරන ලද අයිතම සංඛ්‍යාව.	1200	2727
අංශය: ඉංජිනේරු අංශය				
1	තක්සේරු වාර්තා සකස් කිරීම	සකස් කරන ලද තක්සේරු වාර්තා සංඛ්‍යාව	66	95
2	සැකසුම් නොකළ අමුද්‍රව්‍ය සාධාරණ මිලට සපයා දීම (ඇලුමිනියම්, තඹ, පිත්තල, යකඩ සහ වෙනත් අබලි)	අමුද්‍රව්‍ය ලබාගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව	88	195
3	කම්හල් සේවා සපයා දීම - යන්ත්‍ර කර්මය, යන්ත්‍ර සූත්‍ර අලුතින් නිපදවීම, තාප ප්‍රතිකාර	ඉටු කරන ලද වැඩ සංඛ්‍යාව.	66	174
4	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කිරීම සහ විකිණීම.	නිෂ්පාදනය කරන ලද සහ විකුණන ලද යන්ත්‍ර සූත්‍ර සංඛ්‍යාව	44	101
5	වාත්තු සේවා සැපයීම (යකඩ මිශ්‍ර සහ යකඩ මිශ්‍ර නොවන)	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	66	44
6	තඹ, නිකල් ක්‍රෝමියම් සහ දෘඩ ක්‍රෝමියම් විද්‍යුත් ලෝහාලේපන සේවා සපයා දීම	ප්‍රතිලාභ ලබන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව	44	225

අංකය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශකය	භෞතික ප්‍රගතිය	
			සමුච්චිතය	
			ඉලක්කය	සාධනය
7	උපදේශක / උපදෙස් සේවා සැපයීම	සපයා දෙන ලද සේවා සංඛ්‍යාව	44	3
8	තාක්ෂණය ලබා දීමේ වැඩසටහන් පැවැත්වීම (වැඩමුළු සහ පුහුණු වැඩසටහන්)	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	3	15
9	උපාධි අපේක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම (කර්මාන්ත ශාලා තුළ ප්‍රායෝගික පුහුණු)	සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව	22	3
10	යන්ත්‍රසූත්‍ර සහ වෙනත් නිෂ්පාදන සැලසුම් කිරීම සහ අලුතින් නිපදවීම.	සැලසුම් කර නිපදවන ලද නව නිෂ්පාදන සංඛ්‍යාව	7	2
අංශය: කාර්මික ජනපද අංශය				
1	නව කර්මාන්ත නිර්මාණය කිරීම සඳහා සහාය වීම.	නිර්මාණය කරන ලද කර්මාන්ත සංඛ්‍යාව.	20	16
		උත්පාදනය කරන ලද රැකියා අවස්ථා සංඛ්‍යාව	400	356
2	පවතින කාර්මික ජනපදවල යටිතල පහසුකම් සහ නඩත්තු පහසුකම් වැඩි දියුණු කිරීම.	කාර්මික ජනපද සංඛ්‍යාව	16	13
3	පවතින කාර්මික ජනපද පරිසර හිතකාමී සංකල්ප සහිතව සංවර්ධනය කිරීම.	සංවර්ධනය කරන ලද කාර්මික ජනපද සංඛ්‍යාව	1	1
4	පවතින කාර්මික ජනපද පුළුල් කිරීම සඳහා යාබද ඉඩම් හඳුනා ගැනීම.	පුළුල් කරන ලද ඉඩම් සංඛ්‍යාව	1	1
5	එක් එක් කාර්මික ජනපදය සඳහා නව කර්මාන්තකරුවන් තෝරා ගැනීම.	තෝරා ගන්නා ලද කර්මාන්ත සංඛ්‍යාව	30	27
6	තෝරා ගන්නා ලද කර්මාන්තකරුවන් සඳහා සංවර්ධනය කරන ලද ඉඩම් කට්ටි / ගොඩනැගිලි වෙන් කර දීම.	වෙන් කරන ලද ඉඩම් කට්ටි සංඛ්‍යාව.	20	21
7	කල්බදු ගිවිසුම් අත්සන් කිරීම	අත්සන් කරන ලද ගිවිසුම් සංඛ්‍යාව	20	44
8	නව මිනින්දෝරු සැලසුම් සකස් කිරීම (පන්නල, ගලිගමුව, පානළුව)	සකස් කරන ලද සැලසුම් සංඛ්‍යාව	3	4
9	එක් එක් කාර්මික ජනපදය සඳහා නාමාවලියක් (කර්මාන්ත පැතිකඩක්) සකස් කර එය කාර්මික සංවර්ධන මණ්ඩල වෙබ් අඩවියෙහි පළ කිරීම.	සකස් කරන ලද පැතිකඩ සංඛ්‍යාව.	1	2
10	කාර්මික ජනපදවල තිබෙන වසා දමා ඇති කර්මාන්ත ශාලා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත අත්පත් කර ගැනීම.	අත්පත් කර ගෙන ඇති ඉඩම් කට්ටි සංඛ්‍යාව.	8	9
11	දැනට තිබෙන කාර්මික ජනපද වැඩි දියුණු කිරීම සඳහා මීළඟ වර්ෂයට අරමුදල් ඉල්ලා සිටීම පිණිස නව ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම.	යෝජනා සංඛ්‍යාව	1	1

අංකය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශකය	භෞතික ප්‍රගතිය	
			සමුච්චිතය	
			ඉලක්කය	සාධනය
12	කාර්මික ජනපද හරහා ආදායම් උත්පාදනය	උපයා ගන්නා ලද ආදායම– කුලී (රු. මි.)	45.0	51.5
		උපයා ගන්නා ලද ආදායම - ජල සැපයුම් සේවා (රු. මි.)	6.0	4.9
		උපයා ගන්නා ලද ආදායම - හිඟ මුදල් අය කර ගැනීම (රු. මි.)	10.0	22.5
		උපයා ගන්නා ලද ආදායම - කල්බදු ගිවිසුම් අත්සන් කිරීම (රු. මි.)	0.3	0.8
		උපයා ගන්නා ලද ආදායම - කාර්මික ජනපද නඩත්තු කිරීම සඳහා චක්‍රීය අරමුදලක් පිහිටුවීම (රු. මි.)	3.0	6.7
13	යටිතල පහසුකම් සම්බන්ධ ඉදිකිරීම් පිළිබඳ වැඩමුළුව.	වැඩමුළු සංඛ්‍යාව (රු. මි.)	1	1
අංශය: සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය - සම්භාණ්ඩ අංශය				
1	ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	3	7
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	50	121
2	නිෂ්පාදකයින් සඳහා පිරිසැකසුම් පහසුකම් සපයා දීම (පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන)	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	180	131
3	වාර්ෂික පාවහන් සහ සම්භාණ්ඩ වෙළඳ ප්‍රදර්ශනය සංවිධානය කිරීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	1	1
4	සේවාදායක අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	3	3
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	50	46
5	තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම (පාවහන්/සම්භාණ්ඩ) - කටුබැද්ද	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	10	8
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	100	86
6	තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම (පාවහන්/සම්භාණ්ඩ) - ප්‍රාදේශීය	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	7	18
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	100	330
7	පාවහන් යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම පිළිබඳ වැඩසටහන	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	2	1
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	22	9

අංකය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශකය	භෞතික ප්‍රගතිය	
			සමුච්චිතය	
			ඉලක්කය	සාධනය
අංශය: අලෙවි අංශය				
1	ගැණුම්කරු - විකුණුම්කරු හමුවීම් පැවැත්වීම.	පවත්වන ලද ගැණුම්කරු - විකුණුම්කරු හමුවීම් සංඛ්‍යාව	2	4
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	100	245
2	සැකසුම් නොකළ අමුද්‍රව්‍ය සාධාරණ මිලට සපයා දීම (ඇලුමිනියම්, තඹ, පිත්තල, යකඩ සහ වෙනත් අබලි)	සපයා දෙන ලද අමුද්‍රව්‍ය ප්‍රමාණය (මෙ.ටො)	900	1680.6
		අමුද්‍රව්‍ය ලබාගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව	300	413
3	කර්මාන්තකරුවන්ට උප කොන්ත්‍රාත් ලබාදීම	උප කොන්ත්‍රාත් ලබාගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව	35	21
4	ලක්කම් අලෙවිහල් හරහා අලෙවි අවස්ථා සපයා දීම	පහසුකම් සලසා දෙන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව	50	25
5	ප්‍රදර්ශන පැවැත්වීම	පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව	1	7
		ප්‍රතිලාභ ලබන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව	500	1200
6	යහපත් කර්මාන්ත පරිචයන් පිළිබඳව දැනුවත් භාවය ඇති කිරීම සඳහා එළිමහන් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.	සංවිධානය කරන ලද සැසි සංඛ්‍යාව.	2	2
7	බාහිර අලෙවිකරණ වැඩසටහන් පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම	පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	1	2
අංශය: රබර් නිෂ්පාදන සංවර්ධන සේවා මධ්‍යස්ථානය				
1	නිෂ්පාදන තත්ත්ව පරීක්ෂණ සහ සහතිකකරණ සපයාදීම	නිකුත් කරන ලද සහතිකකරණ සංඛ්‍යාව	80	135
		පරීක්ෂා කරන ලද නිෂ්පාදන සාම්පල් සංඛ්‍යාව	3100	1150
2	කර්මාන්තකරුවන්ට උප කොන්ත්‍රාත් ලබාදීම	උප කොන්ත්‍රාත් ලබාගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව.	10	2
3	සේවාදායක අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	2	5
		කර්මාන්තකරුවන් / ආයතන සංඛ්‍යාව	0	5
4	රබර් නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා සහාය වීම.	ඉටු කරන ලද වැඩ සංඛ්‍යාව.	33	12
		ව්‍යාපාර සංඛ්‍යාව	20	9
5	උපදේශක / උපදෙස් සේවා සපයා දීම	සපයා දෙන ලද සේවා සංඛ්‍යාව	96	86
6	සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා රබර් නිෂ්පාදන සංවර්ධනය කිරීම.	සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා සංවර්ධනය කරන ලද නිෂ්පාදන සංඛ්‍යාව.	24	15
7	පිරිසැකසුම් කරන ලද ද්‍රව්‍ය සපයා දීම (කේන්ද්‍රඅපසාරික රබර් කිරි)	සපයා දෙන ලද ප්‍රමාණය (ලීටර්)	13750	9351
		රබර් කිරි ලබාගත් කර්මාන්ත සංඛ්‍යාව	95	473
8	පිරිසැකසුම් කරන ලද ද්‍රව්‍ය සපයා දීම (රබර් සංයෝග)	සපයා දෙන ලද ප්‍රමාණය (කි.ග්‍රෑ.)	62000	26455
		සංයෝග ලබාගත් කර්මාන්ත සංඛ්‍යාව	320	1869

අංකය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශකය	භෞතික ප්‍රගතිය	
			සමුච්චිතය	
			ඉලක්කය	සාධනය
9	ඇඹරුම් කරන ලද රබර් සංයෝග	සපයා දෙන ලද ප්‍රමාණය (කි.ග්‍රෑ.)	38,000	14,354
		සංයෝග ලබා ගත් කර්මාන්ත සංඛ්‍යාව	20	51
10	රබර් නිෂ්පාදන අභ්‍යන්තර වශයෙන් නිෂ්පාදනය කිරීම.	ඉටු කරන ලද වැඩ සංඛ්‍යාව	6	2
11	තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් (වැඩමුළු, පුහුණු වැඩසටහන්)	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	33	14
අංශය: ප්‍රාදේශීය සංවර්ධන අංශය				
1	වෙළඳ ප්‍රදර්ශන සහ ප්‍රදර්ශන හරහා ජාත්‍යන්තර වෙළඳ පොළ වෙත ප්‍රවේශ වීමට කර්මාන්තකරුවන්ට සහාය වීම.	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	35	16
2	ගැණුම්කරු - විකුණුම්කරු හමුවීම් පැවැත්වීම	පවත්වන ලද ගැණුම්කරු - විකුණුම්කරු හමුවීම් සංඛ්‍යාව	10	12
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	500	105
3	අපනයන කර්මාන්ත සඳහා උප කොන්ත්‍රාත් සපයා දීමට පහසුකම් සැලසීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	25	3
4	සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා නව තාක්ෂණයන් ලබා දීම.	ලබාදෙන ලද නව තාක්ෂණයන් සංඛ්‍යාව	5	5
		ප්‍රතිලාභ ලැබූ කර්මාන්තකරුවන් සංඛ්‍යාව	25	5
5	අන්තර්ජාතික ප්‍රමිති සහ සහතිකකරණ ලබාගැනීම සඳහා සහාය වීම.	ප්‍රමිත සහතික ලබාගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව	6	5
6	ණය සහ ප්‍රදානයන් වෙත ප්‍රවේශ වීම සඳහා පහසුකම් සැලසීම.	ණය ලබා ගත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සංඛ්‍යාව	25	8
7	**පුහුණු වැඩසටහන් පැවැත්වීම**			
	7.1 තාක්ෂණ	පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	50	72
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	500	807
	7.2 කළමනාකරණ	පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	25	80
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	500	1112
	7.3 මූල්‍ය	පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	25	41
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	375	508
8	නිෂ්පාදන සංවර්ධනය සහ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා සහාය දීම.	සංවර්ධනය කරන ලද නිෂ්පාදන සංඛ්‍යාව.	15	85
9	තක්සේරු වාර්තා සකස් කිරීම.	සකස් කරන ලද වාර්තා සංඛ්‍යාව.	20	10

අංකය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශකය	භෞතික ප්‍රගතිය	
			සමුච්චිතය	
			ඉලක්කය	සාධනය
10	ණය ලබා ගැනීම සඳහා සහාය වීම.	ණය ලබාගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව	50	73
11	සැකසුම් කළ ද්‍රව්‍ය සපයා දීම (කැස්පර්)	සපයන ලද ප්‍රමාණය (බෝතල්)	4000	3245
		මිශ්‍රණ ලබාගත් කර්මාන්ත සංඛ්‍යාව	100	23
12	කර්මාන්තකරුවන්ට උප කොන්ත්‍රාත් ලබාදීම.	උප කොන්ත්‍රාත් ලබාගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව	25	13
13	ඵලදායීතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	75	14
		සහභාගීවූවන් සංඛ්‍යාව	75	194
14	**පද්ධති සහතිකකරණ සහ නිෂ්පාදන ප්‍රමිති සහතික ලබාගැනීම සඳහා සහාය වීම.**			
	14.1 GMP	සහතිකකරණය ලබා ගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව	20	16
	14.2 ISO		2	13
15	උපාධි අපේක්ෂකයින් සඳහා පුහුණුව ලබා දීම (කර්මාන්ත ශාලා තුළ ප්‍රායෝගික පුහුණුව)	සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව	100	18
16	නුපුහුණු සේවකයින් සහ තරුණයින් සඳහා හැකියා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	25	105
		ප්‍රතිලාභ ලැබූ සේවකයින් සංඛ්‍යාව	500	255
17	ව්‍යාපාර සැලසුම් / ව්‍යාපෘති ශක්‍යතා වාර්තා සකස් කිරීම	සකස් කරන ලද ව්‍යාපාර සැලසුම් සංඛ්‍යාව	125	83
18	ණය පහසුකම් වෙත ප්‍රවේශ වීම සඳහා පහසුකම් සැලසීම	ණය ලබාගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව	125	24
19	අලෙවිකරණය වැඩි දියුණු කිරීම සඳහා සහාය ලබා දීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	50	14
20	තාක්ෂණ සහාය සපයා දීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	50	41
21	විශේෂ වැඩසටහන්		23	675
අංශය: තාක්ෂණ සේවා අංශය				
1	නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම මගින් සුළු පරිමාණ කර්මාන්ත සංවර්ධනය කිරීම - ආහාර කර්මාන්ත	තාක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම මගින් සංවර්ධනය කරන ලද කර්මාන්ත සංඛ්‍යාව	40	43
2	දේශීය සහ විදේශීය තාක්ෂණයන් ලබා ගැනීම	ලබා ගන්නා ලද තාක්ෂණයන් සංඛ්‍යාව	5	8
3	නිෂ්පාදන සංවර්ධන කටයුතු	සංවර්ධනය කරන ලද නිෂ්පාදන සංඛ්‍යාව	4	3
4	පවතින කර්මාන්ත සඳහා හරිත ඵලදායීතා සංකල්පය හඳුන්වා දීම	හරිත ඵලදායීතා සංකල්පය හඳුන්වා දෙන ලද කර්මාන්ත සංඛ්‍යාව	5	5

අංකය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශකය	භෞතික ප්‍රගතිය	
			සමුච්චිතය	
			ඉලක්කය	සාධනය
5	සේවාදායක අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	4	17
		ප්‍රතිලාභ ලැබූ කර්මාන්තකරුවන් / ආයතන සංඛ්‍යාව	40	496
6	කාර්මික සහතික පුහුණු පාඨමාලා පැවැත්වීම	පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	3	6
		පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	30	105
7	යෝග්‍ය විදේශීය සහ දේශීය තාක්ෂණයන් ලබාදීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	6	10
8	තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	48	90

2.4.1. වගුව



රූප සටහන 2.2 - පහසුකම් සපයා දෙන ලද ව්‍යවසායකයින් සංඛ්‍යාව - 2017

3.0 විශේෂ ව්‍යාපෘති / වැඩසටහන් සහ ප්‍රදර්ශන - 2017

3.1 ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ ආහාර කර්මාන්ත නගා සිටුවීම සඳහා මූල්‍ය සහාය

සුළු හා මධ්‍ය පරිමාණ ආහාර කර්මාන්තවල ඵලදායීත්වය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කරන ලද ආහාර කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය නියාමන ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක කරන ලදී. මෙරට සුළු පරිමාණ ආහාර කර්මාන්තවල ඵලදායීත්වය ඉහළ නැංවීම සඳහා සුළු පරිමාණ ආහාර කර්මාන්තකරුවන්ට මූල්‍ය සහාය සපයා දීම සඳහා 2017 වර්ෂයේ අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කර තිබුණි. මූල්‍ය සහාය සපයා දෙන ලද කර්මාන්ත ඒවායෙහි ක්‍රියාවලි පිළිබඳව දැඩි අධීක්ෂණයන් සිදු කිරීමෙන් අනතුරුව සිදු කරන ලද ක්‍රමානුකූල ඇගයීම් ක්‍රමවේදයක් සහිත විශේෂ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියක් තුළින් තෝරා ගන්නා ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලයේ තාක්ෂණ සේවා අංශය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සමග එක්ව බස්නාහිර පළාතේ ව්‍යවසායකයින්ගේ සහයෝගය ඇතිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේය. තෝරා ගැනීමේ කමිටුව විසින් සිදු කරන ලද ඇගයීමට අනුව 2017 වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතියට සහභාගී වීම සඳහා සුළු පරිමාණ ආහාර කර්මාන්තකරුවන් 50 දෙනෙකු තෝරා ගන්නා ලදී.

අවශ්‍ය කරන මට්ටමට වැඩියෙන් ලකුණු ලබාගෙන තිබූ කර්මාන්තවලට ඒවායෙහි නිෂ්පාදන ක්‍රියාවලිය නවීකරණය කිරීම පිණිස අවශ්‍ය කරන යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ මිලදී ගැනීම පිණිස මූල්‍ය ප්‍රදානයන් සපයා දෙන ලදී. මෙම ප්‍රදානය ප්‍රතිලාභියා විසින් අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා ආයෝජනය කරනු ලබන සමස්ත ව්‍යාපෘති පිරිවැයෙන් අවම 50% ක දායකත්වයක් වේ. ඒ අනුව, ව්‍යාපෘතිය නිම කළ විට උපරිමය රු. 200,000 ක ප්‍රදානයක් ප්‍රදානය කරනු ලැබේ. මේ අනුව මෙම නියාමන ව්‍යාපෘතිය සඳහා කර්මාන්තකරුවන් 43 දෙනෙකු සුදුසුකම් ලැබූ අතර එම සියලුම දෙනාට ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලියෙහි නිෂ්පාදන ඵලදායීතාවය වැඩි දියුණු කර ගැනීම සාර්ථකව නිම කිරීමට හැකියාව ලැබුණි.

සංවර්ධනය කරන ලද ක්ෂේත්‍ර අතරින් සමහරක් පහත සඳහන් පරිදි වේ.

- නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම
- නිෂ්පාදන විවිධාංගීකරණය
- නිෂ්පාදනවල තත්ත්වය සහ ඇසුරුම වැඩි දියුණු කිරීම.
- නව රැකියා අවස්ථා නිර්මාණය කිරීම.

3.2 පාවහන් සහ සම්භාණ්ඩ වෙළඳ ප්‍රදර්ශනය - 2017

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය එක්ව ශ්‍රී ලංකා පාවහන් සහ සම් භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමයෙහි සහාය ඇතිව 9 වැනි ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ වෙළඳ ප්‍රදර්ශනය - 2017 කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී 2017 පෙබරවාරි 3, 5 යන දිනවල දී පවත්වන ලදී.

වෙළඳ පොළ අවස්ථා වැඩි දියුණු කිරීම සහ මෙරට ව්‍යාපාරික ප්‍රජාවගේ දැනුම වැඩි දියුණු කිරීම මෙම ප්‍රදර්ශනයෙහි අරමුණු විය. දේශීය සමාගම් 100 ක් සහ විදේශීය සමාගම් 33 ක් ප්‍රදර්ශන කුටි 233 ක් හරහා සිය නිෂ්පාදන ප්‍රදර්ශනය කළහ.

3.3 සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා කා.සං.ම. සන්නාමකරණ වැඩසටහන සමග දෙරණ සු.ම.ක. සමාජය

"දෙරණ රූපවාහිනී" නාලිකාව විසින් සු.ම.ක. සඳහා පවත්වනු ලබන "කා.සං.ම. සමග සු.ම.ක. සමාජය" - සන්නාමකරණ වැඩසටහන දිවයිනෙහි සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි තෝරා ගන්නා ලද අනාගත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 30 දෙනෙකු සඳහා සාර්ථකව පවත්වන ලදී.

- විශේෂ වට්ටම් සහිත ගාස්තු යටතේ දෙරණ මාධ්‍ය ජාලයෙහි වෙළඳ දැන්වීම් පළ කිරීමේ අවස්ථාව.
- ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සහ ගණකාධිකාරී ශිල්පීන්ගේ සංගමය සමග එක්ව අලෙවිකරණය, තොරතුරු තාක්ෂණය සහ ගිණුම්කරණය පිළිබඳ වැඩමුළු පැවැත්වීම.
- ඔවුන්ගේ වෙළඳ සන්නාම ප්‍රවර්ධනය කිරීම පිණිස ප්‍රදර්ශන සංවිධානය කිරීම.
- ඔවුන්ගේ නිෂ්පාදන සඳහා සුපිරි වෙළඳසැල්වල රාක්කවල ඉඩකඩ ලබා ගැනීම සඳහා සහාය වීම.
- නීතිපතා ප්‍රවීනයින් සමග අත්දැකීම් හුවමාරු කර ගැනීමේ සංසද පැවැත්වීම.

3.4 පී.යූ.එම්. නෙදර්ලන්ඩ්ස් සීනියර් එක්ස්පර්ට්ස් සංවිධානය සමග අවබෝධතා ගිවිසුම

විවිධ කර්මාන්ත අංශවල නිෂ්පාදන ගුණාත්මකභාවය ගෝලීය ප්‍රමිතීන්ට අනුව වැඩි දියුණු කිරීම පිණිස බටහිර විශේෂඥතාවය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සමග සම්බන්ධ කිරීම සඳහා වන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය සහ පී.යූ.එම්. නෙදර්ලන්ඩ්ස් සීනියර් එක්ස්පර්ට්ස් සංවිධානය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. පී.යූ.එම්. නෙදර්ලන්ඩ්ස් සීනියර් එක්ස්පර්ට්ස් යනු සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල ව්‍යවසායකත්වය, ස්වයංපෝෂිතභාවය සහ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම පිණිස කටයුතු කරන ලාභ නොලබන ආයතනයක් වේ.

3.5 ඇසුරුම්කරණ සංවර්ධන වැඩසටහන 2017 හරහා ආහාර ක්ෂේත්‍රයේ සු.ම.ක. සඳහා පහසුකම් සැලසීම.

ගුණාත්මක බව සහ සුරක්ෂිත බව ආහාර සැකසුම් කර්මාන්තයෙහි තිබිය යුතු මූලික ම අංග වන බැවින් ආහාර නිෂ්පාදන ඇසුරුම් කිරීම එම කර්මාන්තයේදී ප්‍රමුඛත්වය ලබාදිය යුතු අංගයක් වේ. එබැවින්, මණ්ඩලයේ ප්‍රාදේශීය සංවර්ධන අංශය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සමග එක්ව ආහාර නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ආහාර නිෂ්පාදන අංශයේ කර්මාන්තවලට විශේෂ මූල්‍ය ප්‍රදානයන් පිරිනමන අතර ම ආහාර නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීම පිණිස ප්‍රායෝගික සහ නව්‍ය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.

මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණු පහත සඳහන් පරිදි විය.

1. නිෂ්පාදනවල ගුණාත්මකභාවය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම පිණිස සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වල දැනට පවතින ඇසුරුම් කිරීමේ සහ ලේබල් කිරීමේ ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම.
2. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වලට පහසුකම් සැලසීම පිණිස උපදේශකයින් ලෙස කටයුතු කිරීම සඳහා ඇසුරුම්කරණය පිළිබඳ ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් පුහුණු කිරීම.

පහත සඳහන් වැඩසටහන් හරහා මෙම අරමුණු ඉටුකර ගැනීමට සැලසුම් කරන ලදී.

1. ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් සඳහා ඇසුරුම්කරණය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ උසස් පුහුණු වැඩසටහන.

2. ආහාර ඇසුරුම්කරණ සංවර්ධන වැඩසටහන.

3.6 ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය

ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය ආශ්‍රිත ක්ෂේත්‍රයේ කර්මාන්තයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන අනාගත ව්‍යවසායකයින්ගේ සහභාගීත්වය ඇතිව කාර්මික සංවර්ධන මණ්ඩලයේ තාක්ෂණ සේවා අංශය විසින් ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය පිළිබඳ තාක්ෂණය ලබාදීමේ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන අතරතුරදී එයට සහභාගීවූවන්ට ප්‍රායෝගික දැනුම ලබාදීම පිණිස තැනුම් පොළ නැරඹීමක් සඳහා මොරටුව විශ්ව විද්‍යාලය වෙත රැගෙන යන ලද අතර එමගින් ඔවුන්ට ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමට යොදා ගනු ලබන යන්ත්‍ර සූත්‍ර සහ ඒවායින් සිදු කළ හැකි නිෂ්පාදන පිළිබඳ පුළුල් අත්දැකීමක් ලබා ගැනීමට හැකි විය. තවද, එම වැඩමුළුව තුළින් පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කරන ලදී:

- ‘අපද්‍රව්‍ය’ යන්න හඳුන්වා දීම, අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීමෙහි ඇති වාසි, ප්ලාස්ටික් අපද්‍රව්‍ය වර්ග, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ප්ලාස්ටික් වර්ග, ස්වභාවිකව දිරාපත් වන ප්ලාස්ටික් වර්ග, සහ පෞද්ගලිකව සහ සමාජයක් වශයෙන් ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ඇති වගකීම.
- ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන නීති රීති.
- ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාවලිය
- ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා යොදා ගනු ලබන තාක්ෂණය සහ යන්ත්‍ර සූත්‍ර
- ප්‍රතිචක්‍රීකරණය කළ ප්ලාස්ටික් යොදා ගනිමින් අගය එකතු කළ නිෂ්පාදන සහ ස්වභාවිකව දිරාපත් වන ප්ලාස්ටික් නිෂ්පාදනය කිරීම.

3.7 ඉවත ලන කඩදාසි ප්‍රතිචක්‍රීකරණය සහ අතින් සාදන කඩදාසි නිෂ්පාදනය

ස්වභාවික සම්පත් ක්ෂය වීමට විසඳුමක් වශයෙන් කාර්මික සංවර්ධන මණ්ඩලයේ තාක්ෂණ සේවා අංශය විසින් ‘කඩදාසි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීරණය කිරීම සහ අතින් සාදනු ලබන කඩදාසි නිෂ්පාදනය කිරීම’ පිළිබඳ විශේෂඥයින් දෙදෙනෙකුගේ සහභාගීත්වය ඇතිව තාක්ෂණය ලබාදීමේ වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

4.0 එක් එක් අංශයෙහි ප්‍රමුඛ වැඩසටහන්

4.1 **පරිපාලන අංශය** (AD)

4.2 **ප්‍රාදේශීය සංවර්ධන අංශය** (RDD)

4.3 **සැලසුම් අංශය** (PD)

4.4 **අලෙවි අංශය** (MD)

4.5 **කාර්මික ජනපද අංශය** (IED)

4.6 **ඉංජිනේරු අංශය** (ED)

4.7 **ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය** (CEDACS)

4.8 **තාක්ෂණ සේවා අංශය** (TSD)

4.9 **සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය** (CDLPF)

4.10 **රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය** (RPD & SC)

4.1 පරිපාලන අංශය (AD)

කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සියලුම මානව සම්පත් කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම්, ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්, ආරක්ෂක සහ ප්‍රවාහන කටයුතු සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම මණ්ඩලයෙහි පරිපාලන සහ මානව සම්පත් සංවර්ධන අංශයෙහි වගකීම වේ.

4.1.1 මෙම අංශයට පැවරී ඇති කාර්යයන්:

- කළමනාකරණ චක්‍රලේඛ අංක 30 අනුව ආයතනික සහ ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- වැටුප් විෂමතා ඉවත් කිරීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි පිරිස් බලය ශක්තිමත් කිරීම පිණිස කළමනාකරණ චක්‍රලේඛ අංක 30 අනුව බඳවා ගැනීමේ පටිපාටිය සහ උසස් කිරීමේ පටිපාටිය සකස් කිරීම.
- සාමාන්‍ය බඳවා ගැනීම්, කාර්ය සාධන ඇගයීම්, උසස් කිරීම් සහ විශ්‍රාම ගැනීම් ආදියට අදාළ කටයුතු ඉටු කිරීම.
- විනය පරීක්ෂණ පැවැත්වීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයෙහි දැනුම අපේක්ෂිත මට්ටමට ගැළපෙන පරිදි වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය විදේශීය ශිෂ්‍යත්ව/පුහුණු වැඩසටහන් ආදිය සම්බන්ධීකරණය කිරීම.
- දේශීය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ සපයා දීම.
- සේවක සුභසාධනය සහ සේවක වන්දි යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම.
- දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- අභ්‍යන්තර ආරක්ෂක සේවා සහ ආරක්ෂක කටයුතු කළමනාකරණය කිරීම.
- මණ්ඩලයෙහි ප්‍රසම්පාදන කටයුතු කළමනාකරණය කිරීම.
- මණ්ඩලයෙහි ප්‍රවාහන සේවා කළමනාකරණය කිරීම.
- නීති කටයුතු සහ ගැටළු සම්බන්ධයෙන් මැදිහත් වීම

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සේවකයින්ගේ කාර්ය සාධන මට්ටම් ඉහළ නැංවීම පිණිස ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීමේ සහ හැකියා සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව පරිපාලන සහ මානව සම්පත් සංවර්ධන අංශය විසින් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

මේ සඳහා ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් 26 අතරින් වඩාත්ම වැදගත් වූ වැඩසටහන් පහ පහත සඳහන් පරිදි වේ:

කා.සං.ම. සේවකයින් සඳහා 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන්

අංකය	වැඩසටහනෙහි නම	සහභාගී වූවන් සංඛ්‍යාව
1.	ව්‍යාපාර මූල්‍ය පිළිබඳ විශ්ලේෂණය කිරීම සහ තීරණ ගැනීම	25
2.	කාර්යක්ෂමතා කඩඉම් විභාගය පිළිබඳ පුහුණු වැඩසටහන	32
3.	අලුතින් බඳවා ගන්නා ලද ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් සඳහා හැඩගැස්වීමේ පුහුණුව	17
4.	කා.සං.ම. නායකයින් සඳහා ජන නායකත්ව සංවර්ධනය	60
5.	ඉහළ කළමනාකරණ, මධ්‍යම කළමනාකරණ සහ සියලු විධායක නිලධාරීන් සඳහා අගය එකතු කිරීමේ වැඩසටහන	160

වගුව -*4.1.1*

4.1.2 සේවක පුහුණු වැඩසටහන්

කාර්මික සංවර්ධන මණ්ඩලයේ විධායක නිලධාරීන් සඳහා අගය එකතු කිරීමේ වැඩසටහන

සේවකයින්ගේ හැකියා සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව පහත සඳහන් ශිෂ්‍යත්ව සහ විදේශීය සංචාර පිරිනමන ලදී.

ශිෂ්‍යත්ව ලබා දීම – *2017*

අංකය	පුහුණු ක්ෂේත්‍රය	පිරිවැය (රු.)
1.	ඇසුරුම්කරණය වැඩි දියුණු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන - මුම්බායි	217,936.00
2.	සම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ පිවිතුරු තාක්ෂණය පිළිබඳ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පුහුණු වැඩසටහන - චීනය	199,636.50
එකතුව		**417,572.50**

වගුව -*4.1.2*

4.1.3 ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් බඳවා ගැනීම

කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාවට අනුව කළමනාකරණය, කෘෂිකර්මය, ආහාර තාක්ෂණය, තොරතුරු තාක්ෂණය සහ රසායනික ද්‍රව්‍ය යන ක්ෂේත්‍රවල විශේෂීකරණය සහිත ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් 17 දෙනෙකුට ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල ආවරණය කරමින් පත්වීම් ලබා ඇත.

4.2 ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD)

කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රාදේශීය සංවර්ධන අංශය දිවයිනෙහි සමස්ත දිස්ත්‍රික්ක 25 ම ආවරණය කරමින් ස්ථාපිත කර ඇත. එහි ප්‍රාදේශීය ජාලය හරහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීම සඳහා සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරයි.

ප්‍රාදේශීය කාර්යාලවල රාජකාරී කටයුතු සඳහා නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන් 25 දෙනෙකු සහ ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් 62 දෙනෙකු යොදවා ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වැඩි දියුණු කර ඒවායෙහි ඵලදායීත්වය වර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම පිණිස ප්‍රාදේශීය සංවර්ධන අංශය සඳහා ප්‍රධාන අරමුණු හතරක් පදනම් කර ගත් නව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත.

ඉලක්ක කර ඇති එම ප්‍රධාන අරමුණු හතර පහත සඳහන් පරිදි වේ:

1. දේශීය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ගෝලීය වෙළඳ පොළ සඳහා සුදුසු වන ලෙස වැඩි දියුණු කිරීම.
2. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල ආදායම වර්ධනය කිරීම.
3. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය සඳහා කර්මාන්ත ඉලක්ක කර ගත් හැකියා සංවර්ධනය වැඩි දියුණු කිරීම.
4. ප්‍රාදේශීය වශයෙන් පවතින ආර්ථික අසමානතා විසඳා ගැනීම සඳහා උපකාරී වීම.

කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ උපදේශක සේවා සැපයීම, ශක්‍යතා අධ්‍යයන නිදර්ශනය කිරීම සහ කර්මාන්ත සඳහා අවශ්‍ය තොරතුරු සපයා දීම ප්‍රාදේශීය සංවර්ධන අංශයට සහ එහි දිස්ත්‍රික් කාර්යාලවලට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වේ.

4.2.1 ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් සඳහා ඇසුරුම්කරණය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ උසස් පුහුණු වැඩසටහන.

ඇසුරුම්කරණය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ උසස් පුහුණු වැඩසටහනක් 2017.02.28 දින සිට 2017.03.02 දින දක්වා කොළඹ 07 හි පිහිටි හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනයෙහි දී පවත්වන ලදී. මණ්ඩලය වෙත බඳවා ගන්නා ලද ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් නිෂ්පාදන වැඩි දියුණු කිරීම පිළිබඳව අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා ඔවුන්ව සම්බන්ධ කර ගන්නා කර්මාන්තකරුවන්ට සහාය වීම පිණිස උපදේශකයින් වශයෙන් පුහුණු කරන ලදී.

මෙම පුහුණු වැඩසටහනෙහිදී පහත සඳහන් කරුණු සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලදී:

- ඇසුරුම්කරණයෙහි දී ආහාර තාක්ෂණය
- ආහාර ඇසුරුම්කරණයෙහි තාක්ෂණික ක්ෂේත්‍ර
- ඇසුරුම්කරණය පිළිබඳ ආහාර රෙගුලාසි
- ඇසුරුම්කරණයට අදාළ යන්ත්‍ර සූත්‍ර
- ආහාර ඇසුරුම්කරණය සහ ආහාරවල ආයු කාලය - ප්‍රායෝගික අත් පොත
- ඇසුරුම්කරණය සහ අපනයන වෙළඳ පොළ - අත්දැකීම් හුවමාරු කර ගැනීමේ සැසිය.

4.2.2 ආහාර ඇසුරුම්කරණ සංවර්ධන වැඩසටහන

මණ්ඩලයෙහි ලියාපදිංචි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් 790 දෙනෙකු සම්බන්ධ කර ගනිමින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය නිලධාරීන් විසින් එක් එක් කර්මාන්තකරුවන් පිළිබඳ අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කරන ලදී. "ආහාර ඇසුරුම්කරණ සංවර්ධන වැඩසටහන" සඳහා සහභාගී වීමට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් තෝරා ගැනීමේදී කොන්දේසි සහ නියමයන් කිහිපයක් පමණක් සලකා බලන ලදී.

තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී අවම වශයෙන් වසර තුනකට වැඩි කාලයක් ආහාර ක්ෂේත්‍රයෙහි කර්මාන්තවල නියැළී සිට තිබූ කර්මාන්තකරුවන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලද අතර, ඔවුන්ගේ අදාළ නිෂ්පාදන ක්‍රියාවලීන් හෝ නිෂ්පාදන සඳහා කිසියම් වැඩි දියුණු කිරීමක් සිදු කිරීමේදී ඒ සඳහා රු. 50,000 ක උපරිමයකට යටත්ව 50% ක මූල්‍ය සහයෝගයක් සපයා දෙන ලදී.

මෙම වැඩසටහනෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ.

- ආහාරවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම පිණිස දැනට තිබෙන ඇසුරුම්කරණ සහ ලේබල්කරණ ක්‍රමවේද වැඩි දියුණු කිරීම සඳහා ආහාර ක්ෂේත්‍රයෙහි ඇති සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත 125 ක් සඳහා පහසුකම් සැලසීම.
- ආහාර ඇසුරුම්කරණයෙහි දී කර්මාන්තකරුවන් විසින් මුහුණ දෙනු ලබන අඩුපාඩු / ප්‍රායෝගික ගැටළු හඳුනා ගැනීම සඳහා කර්මාන්තකරුවන්ට අවස්ථාවක් ලබාදීම සහ ඔවුන්ගේ ඇසුරුම්කරණ ක්‍රමවේද වැඩි දියුණු කිරීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා අනුගමනය කරන ලද උපාය මාර්ග පහත සඳහන් පරිදි වේ.

(අ) තෝරා ගන්නා ලද කර්මාන්තවල පවතින ඇසුරුම්කරණ ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා උපදේශක සේවා සපයා දීම.

(ආ) යෝජිත සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය ප්‍රදානයක් සපයා දීම - (උපරිමය රු. 50,000.00)

ව්‍යාපෘතියෙහි ප්‍රගතිය

දිස්ත්‍රික්කය	නිම කරන ලද ක්‍රියාකාරකම්		
	ප්‍රතිලාභීන් තෝරා ගැනීම	සංවර්ධනය කළ ව්‍යාපෘති	ප්‍රදානය (රු.)
අනුරාධපුරය	5	4	200,000.00
බදුල්ල	5	5	250,000.00
මඩකලපුව	6	6	265,000.00
කොළඹ	4	2	100,000.00
ගාල්ල	5	5	250,000.00
ගම්පහ	7	7	323,000.00
හම්බන්තොට	5	5	250,000.00
යාපනය	5	5	250,000.00
කළුතර	5	5	250,000.00
මහනුවර	5	5	250,000.00
කෑගල්ල	8	8	400,000.00
කිලිනොච්චිය	6	4	157,400.00
කුරුණෑගල	10	10	500,000.00
මන්නාරම	2	2	100,000.00
මාතලේ	8	4	200,000.00
මාතර	5	5	250,000.00
මොණරාගල	5	5	216,825.00
මුලතිවු	5	5	232,500.00
නුවරඑළිය	4	4	200,000.00
පොළොන්නරුව	6	2	87,650.50
රත්නපුර	5	4	187,500.00
ත්‍රිකුණාමලය	5	1	31,000.00
වවුනියාව	5	5	205,000.00
එකතුව	**131**	**108**	**5,155,875.50**

වගුව -*4.2.1*

4.2.3 මූල්‍ය ප්‍රදාන ලබාදීමේ උත්සවය

කර්මාන්තකරුවන්ට මූල්‍ය ප්‍රදාන ලබාදීමේ උත්සවය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මහතාගේ අනුග්‍රහය යටතේ 2017 නොවැම්බර් මස 05 වැනි දින කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේදී පවත්වන ලද අතර, එහිදී මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලැබූ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් 108 දෙනෙකු වෙත ක්‍රියාවලි / නිෂ්පාදන සංවර්ධනය සඳහා මූල්‍ය ප්‍රදාන ලබා දෙන ලදී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු මේ දක්වා එම කර්මාන්තකරුවන්ට රු. 5,155,875.00 ක මුදලක් ප්‍රදානය කර ඇත.

4.2.4 පිවිතුරු නිෂ්පාදන පරිවයන් හරහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ISO 14001සහතිකකරණය ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම. 2017/2018

නිෂ්පාදන ක්‍රියාවලියක් තුළදී පරිසරය දූෂණය වීම සහ අපද්‍රව්‍ය උත්පාදනය වීම නොවැළැක්විය හැකි දෙයක් වේ. කර්මාන්තකරුවන්ට පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම මගින් මෙම පිරිවැය අඩු කර ගත හැක:

- ද්‍රව්‍ය, ක්‍රියාවලි සහ මෙහෙයුම් කළමනාකරණය වැඩි දියුණු කිරීම.
- අපද්‍රව්‍ය අවම කිරීම, අපද්‍රව්‍ය අඩු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම.
- නිෂ්පාදන සහ සේවා සැළකිලිමත්ව සැලසුම් කිරීම සහ තෝරා ගැනීම.
- යෝග්‍ය තාක්ෂණයන් සහ සැලසුම් තෝරා ගැනීම මගින් ක්‍රියාවලි, මෙහෙයුම් සහ සම්පත් භාවිතය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම.

කෙසේ වෙතත්, අනෙකුත් කළමනාකරණ ප්‍රමිතීන්ට අනුකූල වන ISO 9001සහ OHSAS ප්‍රමිතීන් ද සමග පාරිසරික කාර්ය සාධනය වැඩි දියුණු කිරීම පිණිස නියම කර ඇති ISO 14001 ප්‍රමිතියට අනුව සම්මත ක්‍රමවේදයක් සහ පැහැදිලිව නිශ්චිත කර ඇති පරිසර කළමනාකරණ ක්‍රමවේද රාමුවක් ලෙස පිවිතුරු නිෂ්පාදන පරිවයන් හඳුන්වා දෙන ලදී.

පිවිතුරු නිෂ්පාදන පරිවයන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් විසින් යොදා ගත යුතු අත්‍යාවශ්‍ය පාරිසරික පරිවයන් ලෙස හඳුනා ගනු ලැබුව ද, එම සංකල්ප ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දීමට සිදු වන යම් යම් ප්‍රායෝගික බාධක කිහිපයක් තිබේ. එම බාධක පහත සඳහන් පරිදි වේ:

(අ). දැඩි පාරිසරික නියමයන් නොතිබීම සහ ඵලදායී බලාත්මක කිරීමේ වැඩසටහන් නොතිබීම.

(ආ). තොරතුරු සහ තාක්ෂණික අඩුපාඩු - පිවිතුරු නිෂ්පාදන පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොතිබීම සහ බොහෝ පිවිතරු තාක්ෂණයන් තිබීම.

(ඇ) මූල්‍ය දිරිගැන්වීම් හිඟකම - කර්මාන්ත පිවිතුරු නිෂ්පාදන ක්‍රමවේදයකට මාරු කිරීම සඳහා අවශ්‍ය කරන යටිතල පහසුකම් සහ අරමුදල් නොමැති කම.

මෙවැනි බාධක නිසා කාර්මික සංවර්ධන මණ්ඩලය මෙම ක්‍රියාවලිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය හා එක්ව මෙම ව්‍යාපෘතිය දියුණු කර ඇත. තවද, "පිවිතුරු නිෂ්පාදන පරිවය ව්‍යාපෘති අරමුණු කිහිපයක් ඇතිව ආරම්භ කරන ලදී. පිවිතුරු නිෂ්පාදන පරිවය හරහා සම්පත් භාවිතය ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට පහසුකම් සැලසීම, සම්පත් අපතේ යාම අවම කිරීම සඳහා ප්‍රතිකාර්ය ක්‍රියාමාර්ග හෝ නිවාරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා මූල්‍ය සහාය සපයා දීම සහ කර්මාන්තය සඳහා ISO 14001 සහතිකකරණය ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම එම අරමුණු අතර වේ.

ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාකාරකම්.

1. පිවිතුරු නිෂ්පාදන සහ ISO 14001: පරිසර කළමනාකරණ ක්‍රමවේද 2015 පිළිබඳව කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් / ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් පුහුණු කිරීම සහ ඔවුන්ගේ හැකියා සංවර්ධනය කිරීම.
2. සම්පත් කාර්යක්ෂමතාවය (ජලය, ද්‍රව්‍ය සහ බලශක්තිය) වැඩි දියුණු කිරීම පිණිස යාපනය, මඩකලපුව, මහනුවර, හම්බන්තොට, රත්නපුර, ගම්පහ, කළුතර සහ මාතර යන දිස්ත්‍රික්ක ආවරණය කරමින් තෝරා ගත් කර්මාන්ත 15 ක් සංවර්ධනය කිරීම.
3. එම කර්මාන්ත 15 හි ISO 14001: 2015 ප්‍රමිති ක්‍රමවේදය සංවර්ධනය කිරීම.
4. එය අනුගමනය කිරීම සඳහා අනෙකුත් කර්මාන්ත දිරිමත් කිරීම.

4.2.5 කාර්මික සංවර්ධන මණ්ඩල නිලධාරීන් සඳහා ISO 14001:2015 පරිසර කළමනාකරණ ක්‍රමවේද උපදේශක සංවර්ධන පුහුණු වැඩසටහන

2017 මැයි මස 17, 18 සහ 19 යන දිනවල කැලණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයෙහි දී පැවති මෙම පුහුණු වැඩසටහන ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය විසින් පවත්වන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් 20 දෙනෙකු මෙම වැඩසටහනට සහභාගී වූහ.

මෙම පුහුණු වැඩසටහනෙහිදී පහත සඳහන් විෂයයන් ආවරණය කරන ලදී:

- පරිසර කළමනාකරණ ක්‍රමවේද ප්‍රමිතීන් පිළිබඳ දළ විශ්ලේෂණය සහ ISO 14001 පරිසර කළමනාකරණ ක්‍රමවේද සංවර්ධනය කිරීම පිළිබඳ හැඳින්වීම.
- සංවිධාන සංදර්භය සහ නායකත්ව සංවර්ධනය, සහ සංවිධානයක පරිසර ප්‍රතිපත්තිය.
- සංවිධානයක පාරිසරික අංග හඳුනා ගැනීම.
- පාරිසරික අවදානම් පාදක ප්‍රවේශය සහ ජීවන චක්‍ර දෘෂ්ටි කෝණය
- පාරිසරික අරමුණු සහ ක්‍රියාමාර්ග සැලසුම් කිරීම.
- ශ්‍රී ලංකාවේ පරිසර කළමනාකරණ ක්‍රමවේද සම්බන්ධ අනුකූලතා බැඳීම්.
- අධීක්ෂණය, ඇගයීම සහ විශ්ලේෂණය, අනුකූලතාවය ඇගයීම, අභ්‍යන්තර විගණන, අනුකූල නොවීම් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග.
- මෙහෙයුම් සැලසුම්කරණය සහ පාලනය.

4.2.6 කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.

ව්‍යාපෘතියෙහි කොන්දේසි සහ නියමයන් පිළිබඳව කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති මහින්ද ජිනසේන මහතා සහ ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානයේ සභාපති ගාමිණී ගුණසේකර මහතා අතර අවබෝධතා ගිවිසුමක් 2017.10.20 දින කොළඹ 02, හයිඩ් පාර්ක් කෝනර්හි පිහිටි යුනියන් කෙමිකල්ස් ලංකා පී.එල්.සී. සමාගමෙහි දී අත්සන් කරන ලදී.

4.2.7 ව්‍යාපෘතිය සඳහා කර්මාන්ත තෝරා ගැනීම

ඉදිරිපත් කරන ලද අයදුම් පත්‍ර පදනම් කර ගෙන, තේරීම් මණ්ඩලයක නිරීක්ෂණය සමග ඩෙස්ක්ටොප් ඇගයීම් ක්‍රමවේදය යොදා ගනිමින් කර්මාන්තකරුවන් 15 දෙනෙකු තෝරා ගන්නා ලදී.

ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද කර්මාන්ත පහත සඳහන් පරිදි වේ:

අංකය	දිස්ත්‍රික්කය	සමාගමේ නම
1	රත්නපුරය	සෙසිලියාන් ඇසොසියේට්ස් (පුද්) සමාගම
2	රත්නපුරය	ගල්පඩිතැන්න තේ කර්මාන්තශාලාව
3	යාපනය	ඇනායි ඇන්ඩ් සන්ස් (පුද්) සමාගම
4	මාතර	නිල්වලා තේ කර්මාන්තශාලාව (පුද්) සමාගම
5	මාතර	ට්‍රිලැන් එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම
6	මඩකලපුව	ඊස්ට් ලංකා පොලිසැක් (පුද්) සමාගම
7	ගම්පහ	ග්‍රීන්වේ ඒසියා ලංකා (පුද්) සමාගම
8	යාපනය	සාරා ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම
9	මාතර	මොරවක කෝරලේ තේ කර්මාන්ත ශාලාව
10	ගම්පහ	කාල්ටන් ස්වීට් හවුස් (පුද්) සමාගම
11	මහනුවර	පෙන්ටියම් 2000 ස්ටේෂනරීස් (පුද්) සමාගම
12	රත්නපුරය	මයික්‍රෝ සිලෝන් ඕගනික්ස් (පුද්) සමාගම
13	යාපනය	ඇනා ඉන්ඩස්ට්‍රීස්
14	කළුතර	ෆ(ර්)ස්ට් ෆර්නිචර් (පුද්) සමාගම
15	හම්බන්තොට	මලිඳු ඩෙයරි (පුද්) සමාගම

වගුව - *4.2.2*

4.2.8 ව්‍යවසායකත්ව ගම්මාන සහ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

ගම් මට්ටමෙන් කාන්තා ව්‍යවසායකයින් ශක්තිමත් කර ඔවුන්ට සහාය ලබාදීම අරමුණු කරමින් 2012 සහ 2013 වර්ෂවල අයවැය යෝජනා මගින් ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධනය කිරීම පිළිබඳ අවධාරණය කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ගම්මාන 5 ක් සංවර්ධනය කිරීම සඳහා රු. මි. 8.6 ක මුදලක් වෙන් කරන ලද අතර එයින් රු. මි. 5.49 ක් වැය කරන ලදී. මෙම ගම්මානවල ප්‍රතිලාභීන් 155 දෙනෙකු මෙම ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලැබූහ.

4.2.9 කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන

2005 වර්ෂයේ දී මෙම වැඩසටහන "කර්මාන්ත ගම්මාන දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන" ලෙස ආරම්භ කරන ලද අතර පසුව එය "නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීමේ වැඩසටහන වශයෙන්" නම් කරන ලදී. මෙම නව්‍ය සහ යෝධ ව්‍යාපෘතිය සඳහා 2005 වර්ෂයේදී රු.මි. 400 ක මුදලක් වෙන් කරන ලදී.

මෙම පස් අවුරුදු වැඩසටහන අතරතුරදී වර්ෂයකට කර්මාන්ත ගම්මාන 200 බැගින් නිම කිරීමට අපේක්ෂා කරන ලදී. කම්මල් වැඩ, කොහු කර්මාන්තය සහ මැටි කර්මාන්තය ආදී සාම්ප්‍රදායික කර්මාන්ත කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. එයින් පසුව අතින් සාදන කඩදාසි, කැපූ මල් සහ කරවල වැනි සාම්ප්‍රදායක නොවන කර්මාන්ත ද මෙම වැඩසටහනට හඳුන්වා දෙන ලදී.

යන්ත්‍ර සූත්‍ර සහ නිෂ්පාදන ක්‍රියාවලි හඳුන්වා දීම, නවීන ශිල්පීය ක්‍රම සමගින් ප්‍රතිලාභීන්ගේ හැකියා වැඩි දියුණු කිරීම සහ අලෙවිකරණ පහසුකම් සපයා දීම ආදිය මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණු වේ. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය නිම කිරීමට පෙර 2009 වර්ෂයේදී එම ව්‍යාපෘතියෙහි කාලය අවසන් විය. 2005 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා වන කාලය තුළ මෙම ව්‍යාපෘතිය සඳහා සමස්ත අරමුදල් වෙන් කිරීම රු. මි. 723.03 ක් වූ අතර තථ්‍ය වියදම රු. මි. 565.4 ක් විය.

2017 වර්ෂය තුළදී කාර්මික නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු. මි. 8.6 ක මුදලක් වෙන් කරන ලද අතර, පහත සඳහන් ගම්මාන පහ සංවර්ධනය කිරීම සඳහා රු.මි. 5.49 ක මුදලක් වැය කරන ලදී: කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කෝනවිලින්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල, කළුතර දිස්ත්‍රික්කයේ පාගොඩ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිරිබෝපුර, සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතූර්.



***රූපසටහන** 4.2.1* - **පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව** - *2017*

4.3 සැලසුම් අංශය

දේශීය කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වන සමස්ත උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම සැලසුම් අංශයේ වගකීම වේ. එයට අමතරව කාලීන වශයෙන් ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ ඇගයීම හරහා එම වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක වන බව සහතික කිරීම ද මෙම අංශයෙහි වගකීම වේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම පිණිස මෙම අංශය වෙත පහත සඳහන් උප ක්‍රියාකාරකම් පැවරී ඇත:

- ආයතනික සැලැස්මක් සකස් කිරීම මගින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනිවාර්ය අරමුණු වලට අනුකූලව ප්‍රතිපත්ති සහ උපාය මාර්ගික මාර්ගෝපදේශ සම්පාදනය කිරීම.
- ආයතනයෙහි අයවැය සහ ඉදිරි වර්ෂයෙහි සමස්ත ක්‍රියාත්මක සැලැස්මට අනුකූලව ප්‍රාග්ධන අයවැය සහ පුනරාවර්තන වියදම් අවශ්‍යතා සකස් කිරීමට පහසුකම් සැලසීම.
- ව්‍යාපාර/කර්මාන්ත සමීක්ෂණ පැවැත්වීමට සහ කර්මාන්ත/ආර්ථිකය සම්බන්ධ සංඛ්‍යා ලේඛන යාවත්කාලීන කිරීමට පහසුකම් සැලසීම සහ අදාළ ආංශික සංවර්ධන සැලසුම් සකස් කිරීමට සහාය වීම.

- විදේශීය අරමුදල් සැපයීම් සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සහ සංකල්ප පත්‍රිකා සකස් කිරීම.
- පවතින කර්මාන්ත ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදන කමිටුවලට කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහභාගීත්ව සහතික කිරීම සහ අවශ්‍ය විට ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ මාසික, කාර්තුමය සහ වාර්ෂික ප්‍රගති වාර්තා සකස් කිරීම.

4.3.1 විශේෂ පැවැරුම්

කර්මාන්ත දත්ත සංචිතය

සෑම දිස්ත්‍රික්කයක් ම ආවරණය කරමින් කර්මාන්ත 3,725 ක් පිළිබඳව සිදු කරන ලද කර්මාන්ත සමීක්ෂණයක් පදනම් කර ගෙන කර්මාන්ත දත්ත සංචිතයක් සකස් කරන ලදී.

2017 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණයේ ප්‍රගතිය

දිස්ත්‍රික්කය	සලකා බලන ලද සු.ම.ක. සංඛ්‍යාව	ලියාපදිංචි සු.ම.ක. සංඛ්‍යාව
කුරුණෑගල	850	259
මහනුවර	800	224
කළුතර	1,000	308
මාතලේ	500	159
ගාල්ල	690	167
රත්නපුරය	500	149
කෑගල්ල	600	528
ගම්පහ	1,250	272
යාපනය	400	223
කොළඹ	1,030	513
අනුරාධපුරය	300	98
පොළොන්නරුව	200	252
ත්‍රිකුණාමලය	300	105
බදුල්ල	600	59
මාතර	600	223
මොණරාගල	600	122
අම්පාර	350	74
මුලතිවු	200	-
මඩකලපුව	200	54
පුත්තලම	400	103
නුවරඑළිය	450	57
මන්නාරම	150	71
වවුනියාව	248	130
කිලිනොච්චිය	150	47
හම්බන්තොට	500	131
එකතුව	**12,868**	**4,328**

වගුව - 4.3.1

එයට අමතරව මෙම කාලපරිච්ඡේදය තුළදී තවත් සංඛ්‍යා ලේඛන ප්‍රකාශන තුනක් නිම කරන ලදී. "ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත - 2014, මූලික සමාජ-ආර්ථික තොරතුරු, සහ ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික ගිණුම්, ශ්‍රම බලකාය, ආනයන සහ අපනයන යන ක්ෂේත්‍ර පිළිබඳව තෝරා ගත් සමාජ-ආර්ථික දර්ශක" එම ප්‍රකාශන තුන වේ.

4.4 අලෙවි අංශය (MD)

දේශීය කර්මාන්තකරුවන්ට, විශේෂයෙන් ම තම ව්‍යාපාර වාණිජමය වශයෙන් වඩාත් ජීව්‍ය ලෙස වර්ධනය කර ගැනීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහ අනාගත ව්‍යවසායකයින්ට සහාය ලබා දෙන අතර ම කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සපයා දෙනු ලබන සේවාවන් ප්‍රවර්ධනය කිරීමෙහි වගකීම අලෙවි අංශයට පැවරී තිබේ.
තවද, දීර්ඝ කාලීන ව්‍යාපාර සම්බන්ධතා හරහා අදාළ නිෂ්පාදනවල සන්නාම ප්‍රතිරූපය ගොඩනගමින් අනාගත වෙළඳ පොළ සමග සම්බන්ධතා ගොඩ නැගීම සඳහා සහාය වීමේ වගකීම ද මෙම අංශයට පැවරී තිබේ.

මෙම අංශයට පැවරී තිබෙන කාර්යයන්

- කාර්මික ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ පැවැත්වීම / ජාතික ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගීවීම.
- දිවයින පුරා සිටින, තෝරා ගත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්/කර්මාන්තකරුවන් සඳහා මෙන්ම ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින් සඳහා ද ජාතික තිළිණ ප්‍රදානෝත්සවය සංවිධානය කිරීම.
- 'ලක්කම්' සහ 'ලක් නිපැයුම්' අලෙවි මධ්‍යස්ථානවල අලෙවි පහසුකම් සැපයීම
- උප කොන්ත්‍රාත් හුවමාරු සඳහා පහසුකම් සැලසීම
- වාත්තු වැඩ, ලුහු ඉංජිනේරු, කම්මල් වැඩ සහ අනෙකුත් ලෝහ වාත්තු සහ ශිල්පීය කර්මාන්තවල නියැළී සිටින කර්මාන්තකරුවන්ට සහනදායී මිල ගණන් යටතේ අමුද්‍රව්‍ය / අබලි ද්‍රව්‍ය සපයා දීම.
- කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශක සේවා සැපයීම.

4.4.1 ලක්කම් අලෙවි මධ්‍යස්ථානය

මෙම මධ්‍යස්ථානය විසින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ අලෙවි කළ හැකි නිෂ්පාදන තරගකාරී මිල ගණන් යටතේ විකිණීම සඳහා අලෙවි පහසුකම් සපයා දෙමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට මෙන්ම පුද්ගලික ව්‍යවසායකයින්ට ද පහසුකම් සලසා දෙනු ලබයි. එමෙන් ම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්

ගේ සහ පුද්ගලික ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන වල ඵලදායීත්වය ඉහළ නංවමින් එම නිෂ්පාදන සඳහා දිවයින පුරා වෙළඳ පොළ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මෙම අලෙවි මධ්‍යස්ථානය ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් සපයා දෙමින් එම භාණ්ඩ "ලක්කම් ලාංඡනය" යටතේ ප්‍රදර්ශනය කරමින් දේශීය මෙන්ම අන්තර් ජාතික වෙළඳ පොළෙහි ද එම භාණ්ඩ අලෙවි කිරීම සඳහා ඔවුන්ට පහසුකම් සපයා දෙයි. .

4.4.2 උප කොන්ත්‍රාත් හුවමාරුව

අලෙවි අංශය යටතේ ඇති උප කොන්ත්‍රාත් හුවමාරුව සඳහා 1982 වර්ෂයේ සිට රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල සම්බන්ධීකරණය ඇතිව ලෝක බැංකුවෙහි අරමුදල් සැපයීම ලබා දී තිබේ. කාර්මික සංවර්ධන මණ්ඩලය කර්මාන්තකරුවන් / සේවා සපයන්නන් වෙනුවෙන් මිල ගණන් ඉදිරිපත් කර ඔවුන් විසින් නිපදවනු ලබන භාණ්ඩ සපයා දීම මෙයට ඇතුළත් වේ. රාජ්‍ය ආයතන වලින් ඇණවුම් ලැබුණු භාණ්ඩ වලින් සමහරක් පහත සඳහන් පරිදි වේ: දැව, වානේ, කාර්යාලීය පුටු සහ සෝෆා, සම් වලින් නිපදවන ලද සපත්තු, සෙරෙප්පු සහ ගමන් මලු, රබර් ආශ්‍රිත අමතර කොටස්, ටී ෂර්ට්, තොප්පි, පාසල් බෑග්, ලිපි ද්‍රව්‍ය, ඇලුමිනියම් දොර, නාම පුවරු සහ බෙදා වෙන් කරන ද්‍රව්‍ය (පාටිෂන්) ආදිය.

4.4.3 ලෝහ අඛලි ව්‍යාපෘතිය

ලෝහ අඛලි ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය ආයතන වලින් යකඩ, යකඩ නොවන සහ වෙනත් ඒ ආශ්‍රිත ද්‍රව්‍ය මිලදී ගෙන එම ද්‍රව්‍ය විශේෂයෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි ලුහු ඉංජිනේරු අංශයේ කර්මාන්තකරුවන්ට නිලධාරී මණ්ඩලයක් විසින් පාලනය කරනු ලබන සහනදායී මිල ගණන් යටතේ අමුද්‍රව්‍ය ලෙස ලබා දෙන ලදී. ලෝහ වාත්තු කර්මාන්තයේ යෙදී සිටින බෝහෝ කර්මාන්තකරුවන් තම නිෂ්පාදන වෙළඳ පොළ තුළ වඩාත් තරගකාරී කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලැබූහ.

4.4.4 ප්‍රදර්ශන

සුළු හා මධ්‍ය පරිමාණ අංශය යටතේ සමස්ත දිවයිනෙන් ම කැපී පෙනෙන ව්‍යවසායකයින් හඳුනා ගැනීම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා දිස්ත්‍රික්ක, පළාත්, සහ ජාතික මට්ටමෙන් ප්‍රදර්ශන සංවිධානය කරයි. තවද, වැඩි වැඩියෙන් රැකියා අවස්ථා හඳුන්වා දීම සඳහා සහ පවතින තරගකාරී කර්මාන්ත වාතාවරණය තුළ සුළු පරිමාණ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා මෙම ප්‍රදර්ශන මගින් පහසුකම් සලසා දෙයි.

කාර්ය සාධනය	ලක්කම් අලෙවි මධ්‍යස්ථානය	උප කොන්ත්‍රාත්	අඛලි ලෝහ ව්‍යාපෘතිය	එකතුව (රු. මි.)
අලෙවි වටිනාකම (රු. මි.)	11.37	10.91	163.80	186.08
ආදායම (රු. මි.)	8.17	9.36	64.73	82.26
ඇනවුම් බෙදා හැරීම		21		
මිලදී ගත් ප්‍රමාණය (මෙ.ටො.)			1794	
බෙදා හරින ලද ප්‍රමාණය (මෙ.ටො.)			1680	
පහසුකම් සලසන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව	25	21	596	

වගුව 4.4.1 - අලෙවි අංශයේ කාර්යසාධනය – 2017



රූපසටහන 4.4.1 - සපයා දෙන ලද අලෙවිකරණ සේවා - 2017



රූපසටහන 4.4.2 - අලෙවිකරණ පහසුකම් හරහා උපයා ගන්නා ලද ආදායම – 2017

4.5 කාර්මික ජනපද අංශය (IED)

කාර්මික ජනපද ප්‍රදේශ තුළ පිහිටි, ප්‍රමාණවත් යටිතල පහසුකම් සහිත ඉඩම් සහ සාදා නිම කළ ගොඩනැගිලි දීර්ඝ කාලීන කල්බදු පදනම මත සපයා දෙන අතර ම මනා කාර්මික පරිසරයක් සහිත ස්ථානවල සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ස්ථාපනය කිරීමට කටයුතු කිරීම කාර්මික ජනපද අංශයෙහි ප්‍රධාන කාර්ය භාරය වේ.
තවද, කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ වරුන්ගේ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන්ගේ සහාය ඇතිව පෞද්ගලික අංශයට වඩාත් වැඩි අවස්ථා ලබා දෙමින් කාර්මික සංවර්ධන මණ්ඩලය එහි මෙහෙයුම් පුළුල් කිරීමට කටයුතු කරමින් සිටියි. 1970 වර්ෂයේ සිට සංවර්ධනය කර ඇති සමස්ත ඉඩම් ප්‍රමාණය අක්කර 302 ට ආසන්න වේ. එම ඉඩම් ප්‍රමාණය ඉඩම් කට්ටි 727 ට බෙදා වෙන් කර ඇති අතර මේ වන විටත් එම ඉඩම් කට්ටි කර්මාන්තකරුවන් 408 දෙනෙකු අතර බෙදා දී ඇත.
එම කර්මාන්තකරුවන් අතරින් 299 දෙනෙකු ඔවුන්ගේ කර්මාන්ත ආරම්භ කර රැකියා අවස්ථා 8097 ක් සපයා දී ඇත. තවත් කර්මාන්ත 40 ක් ඒවායෙහි කර්මාන්ත ශාලා ගොඩනැගිලි ඉදිකිරීමේ විවිධ අදියරවල තිබේ. එමෙන්ම කර්මාන්ත කටයුතුවලට යොදා නොගෙන පදිංචිය සඳහා යොදා ගෙන තිබෙන කර්මාන්ත ඒකක 69 ට අදාළ ගිවිසුම් අහෝසි කිරීමට මේ වන විටත් කටයුතු කර තිබේ.

තවද, සාදා නිම කර ඇති ගොඩනැගිලි 80 ක් අතරින් ගොනැගිලි 60 ක් කර්මාන්තකරුවන් අතර බෙදා දී ඇති අතර ඒ හරහා රැකියා අවස්ථා 1616 ක් උත්පාදනය කර ඇත.
වසර 30 ක් පුරා මෙරට පැවති සිවිල් යුද්ධය හේතුවෙන් යාපනය දිස්ත්‍රික්කයේ අච්චුවේලි කාර්මික ජනපදය සම්පූර්ණයෙන්ම විනාශ විය. 2013 සහ 2014 වර්ෂවලදී ඉන්දියානු රජය විසින් සපයා දෙන ලද ශ්‍රී ලංකා රුපියල් මිලියන 220 ක මූල්‍ය සහාය සහ ශ්‍රී ලංකා රජය විසින් සපයා දෙන ලද රුපියල් මිලියන 50 ක අමතර ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලයෙහි උපදේශකත්වය සහ අධීක්ෂණය යටතේ අච්චුවේලි කාර්මික ජනපදය නැවත ඉදි කරන ලදී. ඒ අනුව අච්චුවේලි කාර්මික ජනපදය නැවත වරක් කාර්මික ජනපදයක් ලෙස ක්‍රියාත්මක විය හැකි ආකාරයට අලුත්වැඩියා කර 2014 වර්ෂයේදී නැවත විවෘත කරන ලද.

කාර්මික ජනපද අංශයට පැවරී තිබෙන කාර්යයන්

- කාර්මික ජනපද ආරම්භ කිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම සඳහා වන මූලික සමීක්ෂණ සිදු කිරීම, එම ඉඩම් සංවර්ධනය කර කර්මාන්ත ඉදි කිරම සඳහා කර්මාන්තකරුවන් වෙත කල්බදු පදනම් මත ඉඩම් කට්ටි සහ ගොඩනැගැලි ලබා දෙමින් කාර්මික ජනපද ස්ථාපනය කිරීම.
- අදාළ ආයතනවලින් අවශ්‍ය අරමුදල් සහ අනුමැතීන් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම.
- පවතින කාර්මික ජනපද නඩත්තු කිරීම, ඒවායෙහි කාර්ය සාධනය අධීක්ෂණය කිරීම සහ කර්මාන්ත සංවර්ධනය කිරීම.

2017 වර්ෂය තුළදී කාර්මික ජනපද අංශය රේඛීය අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රු. මි. 65 ට ආසන්න මුදලක් කාර්මික ජනපදවල පවතින යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා වැය කරන ලද අතර ඒ යටතේ පහත සඳහන් කාර්මික ජනපදවල මායිම් තාප්ප, බෝක්කු සහ කාණු ආදිය ඉදි කරන ලදී.

නෝරාගන්නා ලද කාර්මික ජනපද කිහිපයක ඉටු කරන ලද කාර්යයන් පහත සඳහන් පරිදි වේ:

අනු අංකය	ක්‍රියාකාරකම	කාර්මික ජනපදයේ නම	මුදල (රු.)
01	කාණු සහ පදික වේදිකා ඉදි කිරීම සහ පවතින මායිම් වැට අලුත්වැඩියා කිරීම.	පල්ලෙකැලේ	16,000,000.00
02	මායිම් තාප්පය ඉදිකිරීම	පානළුව	2,980,000.00
03	විශාල ළිඳක් ඉදිකිරීම සහ නැපැල් කාර්යාල ගොඩනැගිල්ල සහ කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම.	අවිවුවේලි	3,835,250.00
එකතුව			**22,815,250.00**

වගුව - *4.5.1*

එයට අමතරව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් 2016/2017 කඩිනම් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ කාර්මික ජනපදවල යටිතල පහසුකම් නවීකරණය කිරීම, නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා රු. මි. 250 ක මුදලක් ලබා දෙන ලදී. එමගින් රජයේ ඉදිකිරීම් ආයතනවල සහාය ඇතිව ඉදිකිරීම් කටයුතු නිම කර ඇත.
මෙම වැඩසටහන යටතේ ප්‍රධාන වශයෙන් ම ප්‍රදේශ දහයක පිහිටි කාර්මික ජනපදවල යටිතල පහසුකම්

සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන ලද අතර ඒ පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ:

යටිනල පහසුකම් සංවර්ධනය කිරීමට ඇති කාර්මික ජනපද පිළිබඳ විස්තර

අනු අංකය	ක්‍රියාකාරකම	කාර්මික ජනපදයේ නම	මුදල (රු.)
01	අභ්‍යන්තර මාර්ග සහ කාණු ඉදිකිරීම	කලුදැවල	39,000,000.00
02	(අ) ට්‍රාන්ස්ෆෝමරයක් සවි කිරීම	පන්නල	2,750,000.00
	(ආ) 2 වැනි අදියර සංවර්ධනය කිරීම.	පන්නල	76,670,000.00
03	අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම සහ මාර්ග ඉදි කිරීම.	හොරණ	11,000,000.00
04	අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම සහ මායිම් වැට ඉදි කිරීම	පල්ලෙකැලේ	35,710,000.00
05	අභ්‍යන්තර මාර්ග සහ වැසිකිලි ඉදි කිරීම සහ ප්‍රධාන දොරටුව අලුත්වැඩියා කිරීම.	කොටගල	4,000,000.00
06	අභ්‍යන්තර මාර්ග සහ කාණු ඉදි කිරීම	පුස්සැල්ල	7,900,000.00
07	අභ්‍යන්තර මාර්ග ඉදි කිරීම.	වවුනියාව	11,000,000.00
08	(අ) අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම	ඒකල	31,000,000.00
	(ආ) මලාපවහන මාර්ගයේ ඉතිරි කොටස ඉදි කිරීම	ඒකල	5,825,000.00
09	(අ) 2 වැනි අදියර සංවර්ධනය කිරීම	නැගම්පහ	2,760.000.00
	(ආ) ඉඩම එළිපෙහෙලි කිරීම සහ මායිම් වැට ඉදි කිරීම	නැගම්පහ	5,130,000.00
10	අභ්‍යන්තර මාර්ග සහ කාණු ඉදි කිරීම සහ මායිම් වැට ඉදි කිරීම	බුත්තල	22,130,000.00
එකතුව			**252,115,000.00**

වගුව -*4.5.2*

4.5.1 කර්මාන්ත ඒකක ලබා ගෙන 2017 වර්ෂයේදී ආරම්භ කරන ලද කර්මාන්ත

ලබා දෙන ලද කර්මාන්තශාලා ඒකක සහ 2017 වර්ෂය සඳහා යෝජිත ආයෝජනය සහ රැකියා අවස්ථා සංඛ්‍යාව

අනු අංකය:.	කාර්මික ජනපදය	නිපදවනු ලබන නිෂ්පාදනය	යෝජිත ආයෝජන (රු. මි.)	යෝජිත රැකියා අවස්ථා සංඛ්‍යාව
01	අව්වුවේලි	නයිලෝන් පී.වී.සී. නිෂ්පාදන	100	90
02	ඒකල	වානේ ආශ්‍රිත නිෂ්පාදන	114.7	60
		වානේ ආශ්‍රිත නිෂ්පාදන	78.6	40
		ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන	15	10
		කම්බි ඇණ	108	37
		කම්බි ඇණ	20	10
		ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන	5	15
		ඇසුරුම්කරණ ද්‍රව්‍ය	15	28
03	කලුදැවල	ආහාර ආශ්‍රිත නිෂ්පාදන	3.2	10
		නවීන සෝෆා	17	20
04	ලුණුවිල	කොහු ආශ්‍රිත නිෂ්පාදන	25	28
05	පල්ලෙකැලේ	ආයුර්වේද නිෂ්පාදන	9.5	15
		Pet බෝතල්	10	30
		ඇසුම්කරණ ද්‍රව්‍ය	7	17
		සෙවිලි තහඩු	30	24
06	පුස්සැල්ල	ලුහු ඉංජිනේරු	12.3	29
		ලුහු ඉංජිනේරු	5.1	21
		සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන	3	8
07	වවුනියාව	රෙදි සෝදන සබන්	2	5
		සේවා මධ්‍යස්ථානය	5.7	8
එකතුව			**586.1**	**505**

වගුව - *4.5.3*

කාර්මික ජනපදවල 2017 වර්ෂයේදී ආරම්භ කරන ලද කර්මාන්ත, ඒවායෙහි ආයෝජනය, රැකියා අවස්ථා සංඛ්‍යාව සහ නිෂ්පාදන

අනු අංකය.	කාර්මික ජනපදය	නිපදවනු ලබන නිෂ්පාදනය	රැකියා අවස්ථා සංඛ්‍යාව	ආයෝජනය (රු. මි.)
01	බුත්තල	වානේ ආශ්‍රිත නිෂ්පාදන	145	70
02	ඒකල	වානේ ආශ්‍රිත නිෂ්පාදන	52	78.6
		ස්කිම් කෝට්	15	75
		ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන	6	120
03	ගලිගමුව	දැවමය ගෘහ භාණ්ඩ	6	13
04	කලුදෑවල	පොලිතින් නිෂ්පාදන	10	20
		මිනිරන් නිෂ්පාදන	15	32
05	ලුණුවිල	කොහු ආශ්‍රිත නිෂ්පාදන	32	142
06	පල්ලෙකැලේ	වාහන එකලස් කිරීම	10	90.8
		ආයුර්වේද නිෂ්පාදන	8	57
07	පන්නල	ඇසුරුම් කිරීම	16	125
		කාර්මික පොල් තෙල්	4	8.8
		රේඩියේටර්	10	50
08	පුස්සැල්ල	ලුහු ඉංජිනේරු	18	12.3
09	වවුනියාව	සේවා මධ්‍යස්ථානය	8	5.7
එකතුව			**355**	**900.2**

4.5.4 වගුව

නව ඉඩම් කට්ටි / සාදා නිම කළ ගොඩනැගිලි ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති, ශක්‍යතාවය සහිත කර්මාන්තකරුවන් 20 දෙනෙකු සම්මුඛ පරීක්ෂණ සැසි හරහා තෝරා ගන්නා ලදී.

4.5.2 කල් බදු ගිවිසුම් අත්සන් කිරීම

ඉඩම් / සාදා නිම කළ ගොඩනැගිලි සඳහා අදාළ කර්මාන්තකරුවන් සමග වසර 20-30 කාල පරිච්ඡේද සඳහා කල්බදු ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ අනුව 2017 වර්ෂය තුළ දී කල්බදු ගිවිසුම් 43 ක් අත්සන් කරන ලද අතර, එමගින් රු. මි. 0.67 ක ආදායමක් උපයා ගැනීමට හැකි විය.



රූපසටහන *4.5.1 - කාර්මික ජනපදවල ආදායම - 2017*

4.5.3 කුලී ආදායම් අය කර ගැනීම

කල්බදු යටතේ ලබා දී ඇති ඉඩම් සහ ගොඩනැගිලි සඳහා කුලී, ජල සැපයුම් ගාස්තු සහ භිග මුදල් අය කර ගැනීම් මගින් උපයා ගත් සමස්ත මාසික / වාර්ෂික ආදායම රු.මි. 66.6 ක් වූ අතර එය 2017 ඉන්වොයිස්ගත මුළු ආදායමෙන් 90% ක් විය. ආපසු ගෙවිය යුතු තුන් අවුරුදු තැන්පතු ලෙස කල්බදු වලින් අයකර ගනු ලබන මුදල් වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන වක්‍රීය අරමුදල් වල සමුච්චිත අගය 2017 වර්ෂය අවසානය වන විට රු. මි. 9.3 ක් විය.

4.5.4 පල්ලෙකැලේ කාර්මික ජනපදය ස්වර්ණ ජයන්තිය සමරයි

කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත් කාර්මික ජනපද 19 න් එකක් වන මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි පල්ලෙකැලේ කාර්මික ජනපදය 2017 නොවැම්බර් 17 වැනි දින එහි ස්වර්ණ ජයන්තිය සැමරුවේය.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජෙනරාල් සහ අධ්‍යක්ෂවරුන් මෙම උත්සවයට සහභාගී වූ අතර මෙම කාල පරිච්ඡේදය තුළදී ඉටු කරන ලද සේවාව අගය කරමින් නිලධාරීන්ට සහ කර්මාන්තකරුවන්ට සමරු තිළිණ ප්‍රදානය කරන ලදී.

මහනුවර, පල්ලෙකැලේ කාර්මික ජනපදයේ අනුග්‍රහය යටතේ දැනට විවිධ වර්ග හැට හතරකට (64) අයත් කර්මාන්ත ක්‍රියාත්මක වේ. මෙම කර්මාන්ත මගින් සෘජු රැකියා 2,800 ක් ද, වක්‍ර රැකියා අවස්ථා දහස් ගණනක් ද සපයා දී ඇත. තවද, එම කර්මාන්තකරුවන්ට ඔවුන්ගේ මෙහෙයුම් අන්තර් ජාතික මට්ටමට පුළුල් කිරීමට හැකි වන පරිදි නව තාක්ෂණයන් පිළිබඳව දැනුම ලබාදීම, වෙළඳ පොළ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා සහ තරගකාරී වෙළඳ පොළ තුළ ස්ථාවරව සිටීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීම පිණිස විදෙස් සංචාර සංවිධානය කිරීම ආදිය ද සිදු කරන ලදී.

දිවයින තුළ කාර්මික ජනපද පිහිටුවා ඇති ස්ථාන



4.6 ඉංජිනේරු අංශය (ED)

කර්මාන්තකරුවන්ගේ කර්මාන්ත සැලැස්ම දේශීය සහ ගෝලීය වශයෙන් ඉහළ වෙළඳ පොළ තරඟකාරීත්වයක් සහිත නිෂ්පාදනයක් සඳහා වඩාත් යෝග්‍ය බවට පත් කරන අතරම ඔවුන්ගේ "තාක්ෂණික සහ මෙහෙයුම්" හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා සහාය සපයා දීමේ වගකීම ඉංජිනේරු අංශයට පැවරී තිබේ. එයට අමතරව මෙම අංශය ඉංජිනේරු සහ තාක්ෂණික නිපුණත්වය අවශ්‍ය කරන සෑම අභ්‍යන්තර පැවරුමක් සඳහා ම අවශ්‍ය කරන මග පෙන්වීම සහ දායකත්වය සපයා දෙයි.

අභ්‍යන්තර අංශවල, විශේෂයෙන් ම දිවයින පුරා පිහිටා තිබෙන කාර්මික ජනපදවල සහ දිස්ත්‍රික් කාර්යාලවල කාර්යයන්ට සහාය වීමට හැකි වීම පිණිස ඉංජිනේරු අංශය පහත සඳහන් උප ඒකකවලින් සමන්විත වී තිබේ:

(අ). කටුබැද්ද ප්‍රධාන කාර්යාලය - ඉංජිනේරු වැඩපොළ, ඉංජිනේරු වාත්තු වැඩපොළ, අධ්‍යක්ෂ (ඉංජිනේරු) කාර්යාලය, (තාක්ෂණික තොරතුරු සහ උපදේශක සේවා, සහ තක්සේරු වාර්තා ආදිය සඳහා), සිවිල් ඉංජිනේරු සහ විදුලි ඉංජිනේරු සේවා යන අංශ මෙයට අයත් වේ.

(ආ). විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය - පැලියගොඩ

(ඇ). යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - පන්නල

(ඈ). පොදු සේවා මධ්‍යස්ථානය - මාතර

(ඉ). පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය - පමුණුව

4.6.1 මෙම අංශයෙහි ක්‍රියාකාරකම්

2017 වර්ෂයේදී ඉංජිනේරු අංශයෙහි ක්‍රියාකාරකම්

පහත සඳහන් කාර්යයන් අරමුණු කර ගෙන සැලසුම් කරන ලදී.

(අ) කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය තෝරා ගැනීමේදී, යන්ත්‍ර සූත්‍ර සැලසුම් කිරීමේදී / සංවර්ධනය කිරීමේදී සහ ඉංජිනේරු විෂයයන්හි තාක්ෂණය / ක්‍රියාවලි සංවර්ධනයේදී සහාය ලබා දීම.

(ආ). ඉල්ලීම් මත කර්මාන්තකරුවන්ට පිරිසැකසුම්, වාත්තු කිරීම්, සහ ලෝහ නිමා කිරීම් සේවා සැපයීම.

(ඇ). සියලුම ආයතනික සම්බන්ධවීම් වලදී අවශ්‍ය කරන සිවිල්, යාන්ත්‍රික සහ විදුලි ඉංජිනේරු සහාය සපයා දීම.

(ඈ) මූල්‍ය ආයතන විසින් කර්මාන්තකරුවන් වෙත ලබා දෙනු ලබන ණය පහසුකම් සඳහා යන්ත්‍ර සූත්‍ර තක්සේරු සපයා දීම සහ යකඩ සහ යකඩ අඩංගු නොවන ලෝහ, ලෝහ වාත්තු කිරීම්, රබර් නිෂ්පාදන, ලෝහ නිමා කිරීම්, ආහාර, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ විශේෂිත රසායනික ද්‍රව්‍ය සඳහා රසායනාගාර පරීක්ෂණ සේවා සපයා දීම අනෙකුත් ක්‍රියාකාරකම් අතර වේ.

(ඉ) කර්මාන්ත සඳහා මූලාකෘතික සහිතව පිරිමැසුම් සහිත, විශේෂිත යන්ත්‍ර සූත්‍ර සකස් කිරීම.

(ඊ) කාලීන කර්මාන්ත ගැටළුවලට විසඳුම් සෙවීමේදී වෘත්තීය ඉංජිනේරු සහාය සපයා දීම.

4.6.2 2017 වර්ෂයේ කාර්ය සාධනය

වර්ෂය තුළදී ඉටු කරනු ලබන ක්‍රියාකාරකම්වල භෞතික සහ මූල්‍ය ප්‍රතිඵල අනුව අංශයෙහි කාර්ය සාධනය මනිනු ලැබේ. අංශය විසින් උපයා ගන්නා ආදායම ප්‍රධාන වශයෙන්ම කම්හල, වාත්තු වැඩපොළ, විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය, රසායනාගාරය, යන්ත්‍ර සූත්‍ර තක්සේරු කිරීම් සම්බන්ධ කාර්යයන් ඉටු කර දීම සහ වාත්තු කිරීම සඳහා විවිධ ද්‍රව්‍ය අලෙවි කිරීම හරහා උපයා ගන්නා ආදායම වේ.

මෙම අංශයට අයත් විවිධ ඒකක විසින් බාහිර සේවා සපයා දීම මගින් උපයා ගත් ආදායම පිළිබඳ විස්තර 4.6.1 වගුවෙහි දක්වා ඇත. එයට අමතරව, ඉංජිනේරු අංශය අනෙකුත් අංශ වෙත සිවිල්, යාන්ත්‍රික සහ විදුලි නඩත්තු සේවා සපයා දීම ද සිදු කරයි.

මෙම අංශය විසින් උපයා ගන්නා ලද ආදායම පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි සාරාංශ කර ඇත (4.6.1 වගුව බලන්න.)

2017 වර්ෂයේදී නිම කරන ලද සේවා වෙනුවෙන් බාහිරින් උපයා ගත් ආදායම.

අනු අංකය	අංශය	දළ ආදායම (රු.) (වැට් සහ ජා.ගොඩ.බ. හැර)
01	ඉංජිනේරු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය, කටුබැද්ද	5,655,898.00
02	වාත්තු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය	3,363,656.00
03	තක්සේරු වාර්තා - ප්‍රධාන කාර්යාලය	2,456,085.86
04	යෝ.තා.ප.සං.ම., පන්නල	2,978,670.00
05	විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය, පැලියගොඩ	1,611,316.00
06	පො.සේ.ම. මාතර	1,331,707.00
07	පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය	344,067.00
එකතුව		**17,741,400.00**



රූපසටහන *4.6.1* **- ඉංජිනේරු අංශයෙහි ආදායම - 2017**



රූපසටහන *4.6.2* **- ඉංජිනේරු අංශය විසින් සපයා දෙන ලද සේවා - 2017**

අභ්‍යන්තර සේවා

ඉංජිනේරු අංශය යටතේ ඇති විවිධ ඒකක විසින් අභ්‍යන්තර වශයෙන් ඉටුකර ඇති කාර්යයන්හි වටිනාකම (සේවා පදනමෙන් පිරිවැය) පහත සඳහන් පරිදි වේ:

අනු අංකය	ඒකකය	නිම කරන ලද අභ්‍යන්තර කාර්යයන්හි වටිනාකම (රු.)
1	කම්හල – ප්‍රධාන කාර්යාලය	142,930.35
2	වාත්තු වැඩපොළ – ප්‍රධාන කාර්යාලය	509,574.89
3	සිවිල් ඉංජිනේරු සේවා – ප්‍රධාන කාර්යාලය	1,753,545.79
4	විදුලි ඉංජිනේරු සේවා – ප්‍රධාන කාර්යාලය	488,806.05
ඉහත අංශ වලින් සපයා දුන් අභ්‍යන්තර සේවාවල මුළු වටිනාකම		**2,894,857.08**

උපදේශක / ව්‍යාප්ති සේවා

උපදේශක සේවා:

2017 වර්ෂයේදී කර්මාන්තකරුවන් 60 දෙනෙකු වෙත තාක්ෂණික / ක්‍රියාවලි තොරතුරු පිළිබඳ උපදෙස් සහ සැලසුම් කිරීම සහ පිරිසැකසුම් පිළිබඳ උපදේශක සේවා සපයා දී ඇත. මේ අතරින් 06 ක් යෝ.තා.ප.සං.ම. මගින්ද, 14 ක් විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය මගින් ද, ඉතිරි 40 ප්‍රධාන කාර්යාලය මගින් ද සපයා දී ඇත.

යන්ත්‍ර සූත්‍ර / උපකරණ / ක්‍රියාවලි සංවර්ධනය

2017 වර්ෂයේදී දේශීය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම මත මෙම අංශය විසින් පහත සඳහන් යන්ත්‍ර සූත්‍ර සංවර්ධනය කර ඇත:

- ජංගම මැටි අනන යන්ත්‍රය
- පොලිතින් අපද්‍රව්‍ය මිටි බැඳීමේ යන්ත්‍රය
- නෙල්ලි යුෂ පෙරා ගැනීමේ යන්ත්‍රය

ජංගම මැටි අනන යන්ත්‍රය

පොලිතින් අපද්‍රව්‍ය මිටි බැඳීමේ යන්ත්‍රය

4.7 ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය (CEDACS)

පේෂකර්ම සහ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් ව්‍යවසාය සංවර්ධනය සඳහා කළමනාකරණ කුසලතා පිළිබඳ පුහුණුව සපයා දීමේ පුහුණු මධ්‍යස්ථානයක් ලෙස මෙම අංශය ස්ථාපනය කරන ලදී. මෙම මධ්‍යස්ථානය පුහුණු අංශය, පුස්තකාලය, තොරතුරු අංශය, තොරතුරු තාක්ෂණ ඒකකය සහ මුද්‍රණ අංශය යන උප ඒකක වලින් සමන්විත වේ.

මෙම අංශයෙහි ප්‍රධාන අරමුණු

- නව ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම
- පවතින කර්මාන්ත පුළුල් කිරීම සඳහා නව කළමනාකරණ ක්‍රමෝපායයන් හඳුන්වා දීම
- පුහුණුකරුවන් පුහුණු කිරීම (ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කළමනාකරණ උපදේශකත්ව)
- දේශීය කර්මාන්තකරුවන්ට තාක්ෂණික දැනුම සහ ව්‍යාපාරික අත්දැකීම් සපයාදීම.
- කාලීන වශයෙන් වැදගත් වන ව්‍යාපාර සහ කර්මාන්ත ක්ෂේත්‍ර පිළිබඳව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ අනාගත ව්‍යවසායකයින් දැනුවත් කිරීම.
- උපදේශණ සේවා සහ කාර්මික තොරතුරු සපයාදීම

4.7.1 ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය වෙත පැවරී ඇති ක්‍රියාකාරකම්

- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- ව්‍යාපාර නිර්මාණ වැඩසටහන් පැවැත්වීම.
- ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- ව්‍යවසායකයින් සඳහා වාණිජ කටයුතු සහ ව්‍යාපාර පිළිබඳ පුහුණුව සපයා දීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලය තුළ 'එස් 5' වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- අන්තර්ජාල සහ ඊමේල් සේවා සපයා දීම.
- ප්‍රකාශන අලෙවි කිරීම.
- පුස්තකාල එකතුව සංවර්ධනය කිරීම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි).
- පුස්තකාල ද්‍රව්‍ය ක්‍රියාවලි ගත කිරීම.
- කාර්මික තොරතුරු සංවිධානය කිරීම.
- කාර්මික සංවර්ධන මණ්ඩල සේවා දායකයින් මාර්ගගත දත්ත සංචිතයෙහි ලියාපදිංචි කිරීම.
- ප්‍රාදේශීය කාර්යාලවලට මාර්ගගතව ලියාපදිංචි වී ඇති සේවාදායකයින් පිළිබඳ විස්තර සපයා දීම.
- කර්මාන්තකරුවන්, සේවා දායකයින් සහ කා.සං.ම. කාර්ය මණ්ඩලය වෙත කර්මාන්ත තොරතුරු ප්‍රචාරණය කිරීම.
- පුස්තකාලයට අලුතින් එකතු වූ ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු බෙදා දීම.
- ග්‍රන්ථ නාමාවලි දත්ත, දේශීය යන්ත්‍ර සූත්‍ර සහ නිෂ්පාදන නිෂ්පාදකයින්, වාර්තා, ශ්‍රී ලංකා ප්‍රමිති, උපකාරක ආයතන සහ පනත් එකතුව පිළිබඳ දත්ත සංචිත පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.
- දේශීය සහ විදේශීය යන්ත්‍ර සූත්‍ර පිළිබඳ තොරතුරු සපයා දීම.
- "කර්මාන්ත" සඟරාව සහ කා.සං.ම. පුවත් සඟරාව සකස් කිරීම.
- අත්පොත්, පැකේජ, අත් පත්‍රිකා, සූචි, සහ පත්‍රිකා ආදී ප්‍රකාශන සම්පාදනය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- විමසීම් සහ පිළිතුරු සේවාව.
- යොමු කිරීම් සේවාව.
- ප්‍රදර්ශන, සංසද සහ වැඩමුළු ආදියට සහභාගී වීම සහ පුස්තකාල එකතුව යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය නවතම තොරතුරු එක් රැස් කර ගැනීම.

4.7.2 මහවැලි තරුණ තරුණියන් සඳහා ව්‍යාපාර නිර්මාණ වැඩසටහන්

ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය විසින් මහවැලි තරුණ තරුණියන් සඳහා තාක්ෂණ සංවර්ධනයන් සහ ව්‍යාපාර නිර්මාණ පිළිබඳ කළමනාකරණ හැකියා වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව ව්‍යවසායකත්ව සංවර්ධන සහ ව්‍යාපාර නිර්මාණ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී.

ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වර්ග සහ ඒ පිළිබඳ විස්තර පහත වගුවේ පෙන්වා ඇත:

අංශය වෙත පැවරී ඇති ක්‍රියාකාරකම්

වැඩසටහන් වර්ගය	ආරම්භ කළ දිනය	ස්ථානය
සිමෙන්ති ආශ්‍රිත සහ ෆයිබර් ග්ලාස් ව්‍යාපාර නිර්මාණය	2017 ජූලි 9-11	ඇරැවත්ත
සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ ව්‍යාපාර නිර්මාණය	2017 මැයි 19-21	තඹුත්තේගම
නිවාස වයරිං කිරීම පිළිබඳ රැකියා නිර්මාණ වැඩසටහන	2017 ජූලි 28-30	වැලිඔය
ජංගම දුරකථන අලුත්වැඩියාව පිළිබඳ රැකියා නිර්මාණ වැඩසටහන	2017 ජූලි 28-30	වැලිඔය

වැඩසටහන් වර්ගය	ආරම්භ කළ දිනය	ස්ථානය
නිවාස වයරිං කිරීම පිළිබඳ රැකියා නිර්මාණ වැඩසටහන	2017 අගෝස්තු 25-27	තුල්හිරියාව
සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ ව්‍යාපාර නිර්මාණය	2017 අගෝස්තු 25-27	තුල්හිරියාව
ව්‍යවසායකත්ව සංවර්ධනය	2017 ජූලි 14-15	බකමූණ
ඔබගේ ව්‍යාපාරය වැඩි දියුණු කර ගන්න	2017 මැයි 25-27	තඹුත්තේගම
බේකරි නිෂ්පාදන පිළිබඳ නිෂ්පාදන විවිධාංගීකරණ වැඩසටහන	2017 ජූනි 16-18	තඹුත්තේගම
ඔබගේ ව්‍යාපාර අදහස් උත්පාදනය කර ගන්න	2017 ජූනි 22-24	තඹුත්තේගම

වගුව - *4.7.1*

4.7.3 සමෘද්ධි ව්‍යවසායකයින් සඳහා කළමනාකරණ කුසලතා සංවර්ධනය

එයට අමතරව, ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය 2017 සැප්තැම්බර් 16 – 18 දිනවල බකමූණ ප්‍රදේශයේදී සමෘද්ධි ව්‍යවසායකයින් 20 දෙනෙකු සඳහා කළමනාකරණ කුසලතා සංවර්ධන පුහුණු වැඩසහනක් පවත්වන ලද අතර එමගින් ඔවුන්ගේ ව්‍යවසායකත්ව හැකියා සහ අලෙවිකරණය, වාර්තා තබා ගැනීම සහ ව්‍යාපාර සැලසුම්කරණය පිළිබඳ හැකියා වැඩි දියුණු කිරීමට හැකි විය. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් මෙම වැඩසටහන සංවිධානය කර ඒ සඳහා අරමුදල් සපයන ලදී.



රූපසටහන 4.7.1 - **අංශය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන් - 2017**

4.8 තාක්ෂණ සේවා අංශය (TSD)

තාක්ෂණ සේවා අංශය දැනට කර්මාන්තවල නියැළී සිටින කර්මාන්තකරුවන් සහ අනාගත කර්මාන්තකරුවන් විසින් ඉල්ලා සිටිනු ලබන පරිදි තාක්ෂණික ක්ෂේත්‍රයන්ට අදාළ පුහුණුව, උපදේශනය සහ අවශ්‍ය මගපෙන්වීම සපයා දී ඇත. මූලික වශයෙන්ම කර්මාන්ත නවීකරණය කර විවිධාංගීකරණය කිරීම සඳහාත්, ඒවායෙහි නිෂ්පාදනවල ගුණාත්මක භාවය සහ ක්‍රියාවලි කාර්යක්ෂමතාවය වෙළඳ පොළ තුළ වඩාත් තරගකාරී බවට පත් කිරීම සඳහාත් අවශ්‍ය තාක්ෂණය ලබා දෙනු ලැබේ. එයට අමතරව මෙම අංශය අවසර ලත් නිෂ්පාදන ප්‍රමිතීන් සහිත නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා සහාය ලබා දෙන අතර සමස්ත සේවාව ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරිගණක තාක්ෂණය පදනම් කර ගෙන පරිසර හිතකාමී පරිසරයක් තුළ සපයා දෙනු ලබයි.

<u>කාර්ය සාධන ජයග්‍රහණ</u>

තාක්ෂණ සේවා අංශයේ 2017 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම එම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල භෞතික සහ මූල්‍ය කාර්ය සාධනයට සහ ඒවායෙහි ඵලදායීත්වයට අදාළව මතිනු ලැබේ.

2017 වර්ෂය තුළදී මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ:

4.8.1 දේශීය සහ විදේශීය තාක්ෂණය ලබා ගැනීම

ගාල්ල දිස්ත්‍රික්කයේ කුරුඳු තෙල් නිෂ්පාදකයින් සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ සහාය ඇතිව පවත්වන ලද "අගය එකතු කළ කුරුඳු නිෂ්පාදන" පිළිබඳ තාක්ෂණය ලබාදීමේ වැඩසටහන හරහා කුරුඳු තෙල් ආශ්‍රිත බාම් සහ කුරුඳු තෙල් ආශ්‍රිත එයාර් ෆ්‍රෙෂ්නර් නිෂ්පාදනය කිරීම පිළිබඳ තාක්ෂණයන් ලබා ගන්නා ලදී. තවද, ගොනන්දූවෙහි පිහිටි ආහාර පර්යේෂණ ඒකකය විසින් පවත්වන ලද "අගය එකතු කළ බිම්මල් නිෂ්පාදන" පිළිබඳ වැඩමුළුව හරහා බිම්මල් පිටි, විස්කෝතු, සොසේජස්, මෝජු බයිට් සහ බිම්මල් සීනි සම්බල සකස් කිරීම පිළිබඳ නව තාක්ෂණයන් ලබා ගන්නා ලදී.

4.8.2 නිෂ්පාදන සංවර්ධන කටයුතු

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආහාර විද්‍යා සහ තාක්ෂණ අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඩබ්.එල්. ඉසුරු විජේසේකර මහතාගේ අධීක්ෂණය යටතේ "මුහුදු ශාක සුපෝෂිත විස්කෝතු", "කොස් ඇට දෝසි" සහ "විජල එළවළු සුප් මිශ්‍රණය" නැමති නව නිෂ්පාදන තුන සකස් කරන ලදී.

4.8.3 ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය යටතේ හරිත වාර්තාකරුවන්ගේ හැකියා සංවර්ධනය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ තාක්ෂණ සේවා අංශය මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය සමග එක්ව හරිත වාර්තාකරණ ක්‍රමවේදය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම පිණිස ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය යටතේ ලියාපදිංචිවී සිටින නිෂ්පාදන අංශයේ කර්මාන්තකරුවන් සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් සඳහා පුහුණු සැසියක් පවත්වන ලදී. මෙම වැඩසටහන 2017 මාර්තු මස 28 වැනි දින රාජගිරියේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු ශ්‍රවණාගාරයෙහිදී පවත්වන ලදී.

2017 වර්ෂයේදී, කර්මාන්ත විසින් ඉදිරිපත් කරනු ලබන හරිත වාර්තා තහවුරු කර මැනිය හැකි බාහිර ආයතනයක් ලෙස හරිත කා.සං.ම. පහත නම් සඳහන් කර්මාන්ත 05 සඳහා හරිත සංකල්පය හඳුන්වා දුන්නේය: ඊ.බී. ක්‍රීසි සහ සමාගම පී.එල්.සී., රසෝදා ඩෙයරි ප්‍රොඩක්ට්ස් පුද්. සමාගම, බෝපිටිය ඔටෝ එන්ටර්ප්‍රයිසස්, හැඩිගල්ල තේ කර්මාන්ත ශාලාව සහ කාල්ටන් ස්වීට් හවුස් පුද්. සමාගම.

4.8.4 සේවාදායක අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන් පැවැත්වීම

තාක්ෂණ සේවා අංශය තුළ සහ ඉන් පිටතදී කර්මාන්තකරුවන් 497 දෙනෙකුගේ සහභාගීත්වය ඇතිව සේවාදායක අවශ්‍යතාවය අනුව සකස් කළ කෙටි කාලීන පුහුණු වැඩසටහන් 17 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් මගින් උපයා ගන්නා ලද මුළු ආදායම රු. 1,150,238.19 ක් විය.

අංකය	වැඩසටහනෙහි නම	වැඩසටහනෙහි විස්තර	ආදායම (රු.)
01	"ආහාර කර්මාන්තය සඳහා යහපත් නිෂ්පාදන පරිවයන්" පිළිබඳ වැඩසටහන (2017 මාර්තු 29 – 30)	පරීක්ෂා කිරීම් සිදු කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරීන් 32 දෙනෙකු පුහුණු කිරීම සහ යහපත් නිෂ්පාදන පරිවය සහතිකකරණ මට්ටමට කර්මාන්ත නගා සිටුවීම මෙහි අරමුණ වේ.	127,587.00
02	"රෙදි සෝදන සබන් නිෂ්පානය" පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම (2017 ජූනි 30)	වැලිකඩ බන්ධනාගාරයේ නිලධාරීන් සඳහා මෙම වැඩසටහන පවත්වන ලදී.	23, 445.00
03	"කාබනික පොහොර නිෂ්පාදනය සහ ජීව වායු තාක්ෂණය" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 ජූලි 03 – 07)	මෙම වැඩසටහන පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල්වරයාගේ කාර්යාංශය විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව සේනපුර තෘතියික සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයෙහි නේවාසික පුනරුත්ථාපනලාභීන් සඳහා පවත්වන ලදී.	88,179.24
04	"පාසල් සිසුන් සඳහා කාබනික පොහොර නිෂ්පාදනය කිරීම" පිළිබඳ පුහුණු වැඩසටහන (වැඩසටහන් 02) (2017 මැයි 15 – 20)	මෙම වැඩසටහන මොණරාගල දිස්ත්‍රික්කයේ රාජකීය විද්‍යාලයෙහි සහ මහානාම විද්‍යාලයෙහි පාසල් සිසුන් සඳහා පවත්වන ලදී.	90,357.09
05	"පාසල් සිසුන් සඳහා කාබනික පොහොර නිෂ්පාදනය කිරීම" පිළිබඳ පුහුණු වැඩසටහන (වැඩසටහන් 02) (2017 ජූනි 17 – 26)	මෙම වැඩසටහන මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල මැදගම විද්‍යාලයෙහි සහ නාන්නපුරාව විද්‍යාලයෙහි පාසල් සිසුන් සඳහා පවත්වන ලදී.	155,609.16
06	"ආහාර ඇසුරුම්කරණය සහ ලේබල් කිරීම" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 අගෝස්තු 23)	මෙම වැඩසටහන රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉල්ලීම පරිදි සමෘධි ප්‍රතිලාභීන් සඳහා තාක්ෂණ සේවා අංශයෙහිදී පවත්වන ලදී.	10,350.00
07	"ක්ෂණික පළතුරු බීම, ජෑම් සහ කෝඩියල් නිෂ්පාදනය" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 අගෝස්තු 25)	මෙම වැඩසටහන රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉල්ලීම පරිදි සමෘධි ප්‍රතිලාභීන් සඳහා තාක්ෂණ සේවා අංශයෙහිදී පවත්වන ලදී.	17,457.00
08	"කාබනික පොහොර නිෂ්පාදනය සහ ජීව වායු තාක්ෂණය" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 සැප්තැම්බර් 03 - 06)	මෙම වැඩසටහන පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල්වරයාගේ කාර්යාංශය විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව සේනපුර තෘතියික සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයෙහි නේවාසික පුනරුත්ථාපනලාභීන් සඳහා පවත්වන ලදී.	89,417.10

අංකය	වැඩසටහනෙහි නම	වැඩසටහනෙහි විස්තර	ආදායම (රු.)
09	"ආහාර සැකසුම් තාක්ෂණය" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 ඔක්තෝබර් 13 - 14)	මෙම වැඩසටහන පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල්වරයාගේ කාර්යාංශය විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව සේනපුර තෘතියික සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයෙහි නේවාසික පුනරුත්ථාපනලාභීන් සඳහා පවත්වන ලදී.	79,350.00
10	"කෙසෙල් පෙති, මඤ්ඤොක්කා පෙති සහ බයිට් මිශ්‍රණ සෑදීම" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 ඔක්තෝබර් 23)	මෙම වැඩසටහන දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් සහභාගීවන්නන් 20 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සඳහා පවත්වන ලදී.	32,890.00
11	"අගය එකතු කළ කුරුඳු නිෂ්පාදන" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 ඔක්තෝබර් 27)	බටපොල ප්‍රදේශයේ කුරුඳු කර්මාන්තයේ නියැළී සිටින කර්මාන්තකරුවන් කණ්ඩායමක් සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය සමග එක්ව මෙම වැඩසටහන පවත්වන ලදී.	38,571.00
12	"රතු ගඩොල් නිෂ්පාදනය" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 ඔක්තෝබර් 220 - 22)	මෙම වැඩසටහන ගඩොල් නිෂ්පාදකයින් කණ්ඩායමක් සඳහා මන්නාරම සින්නපණ්ඩිවිරිවිවේන් මැටි ගඩොල් නිෂ්පාදන මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.	82,940.00
13	"සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 ඔක්තෝබර් 30 - 31)	මෙම වැඩසටහන කළුතර දිස්ත්‍රික්කයේ කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයෙහි ඉල්ලීම පරිදි කර්මාන්තකරුවන් කණ්ඩායමක් සඳහා පවත්වන ලදී.	29,000.00
14	"යෝගට්, පොප්සිකල්ස් සහ කිරි පුඩිං නිෂ්පාදනය" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 නොවැම්බර් 17)	මෙම වැඩසටහන මූලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෘහ විද්‍යා ගුරුවරුන් කණ්ඩායමක් සඳහා පවත්වන ලදී.	24,670.00
15	"ටයිටේනියම් මිශ්‍ර සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 නොවැම්බර් 18 - 19)	මෙම වැඩසටහන කාර්මික සංවර්ධන මණ්ඩලයේ කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලයේ ඉල්ලීම පරිදි කර්මාන්තකරුවන් කණ්ඩායමක් සඳහා කෑගල්ල තරුණ මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.	50,428.00
16	"කාබනික පොහොර නිෂ්පාදනය" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 නොවැම්බර් 29 - දෙසැම්බර් 11)	මෙම වැඩසහන "ගුරු ගෙදරට කලඑළියක්" නැමති වැඩසටහන යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ දුටුගැමුණු ජාතික පාසලේ සහ තණමල්විල ජාතික පාසලේ පාසල් සිසුන් කණ්ඩායමක් සඳහා පවත්වන ලදී.	204,957.60
17	"පොල්තෙල් නිෂ්පාදනය" පිළිබඳ පුහුණු වැඩසටහන (2017 දෙසැම්බර් 29)	මෙම වැඩසටහන කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය සංවර්ධන අංශය සමග එක්ව කුරුණෑගල දිස්ත්‍රික්කයේ කර්මාන්තකරුවන් කණ්ඩායමක් සඳහා පවත්වන ලදී.	28,475.00
එකතුව			**1,150,238.19**

4.8.5 කාර්මික සහතික පත්‍ර පාඨමාලා සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්

2017 වර්ෂයේදී කර්මාන්තකරුවන් 104 දෙනෙකුගේ සහභාගීත්වය ඇතිව දීර්ඝ කාලීන කාර්මික සහතික පත්‍ර පාඨමාලා 06 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන මගින් උපයා ගත් මුළු ආදායම රු. 1,975,450/- ක් විය.

අංකය	පාඨමාලාවේ නම	පාඨමාලා කාලය	ආදායම (රු.)
01	පරිගණක දෘඩාංග සහ ජාලකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (08 වැනි කණ්ඩායම)	2016 දෙසැ. 14 – 2017 මාර්තු	207,000.00
02	PLC සහ HMI වැඩසටහන්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	2017 මැයි 20, 27 සහ ජූනි 03 (දින 03)	126,500.00
03	කුළුබඩු සැකසුම් තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	2017 මැයි 27 - අගෝස්තු 05 (සෙනසුරාදා දින 10)	644,000.00
04	පරිගණක දෘඩාංග සහ ජාලකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (09 වැනි කණ්ඩායම)	2017 මැයි - ජූලි	286,350.00
05	පරිගණක දෘඩාංග සහ ජාලකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (10 වැනි කණ්ඩායම)	2017 ජූලි - 2017 ඔක්තෝබර්	270,000.00
06	බෝතල් කළ පානීය ජලය නිෂ්පාදනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	2017 නොවැ. 18 - දෙසැ. 16 (දින 05)	441,600.00
එකතුව			**1,975,450.00**

4.8.6 යෝග්‍ය විදේශීය සහ දේශීය තාක්ෂණය ලබා දීම

සුළු පරිමාණ කර්මාන්තකරුවන් 23 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සඳහා තාක්ෂණ සේවා මධ්‍යස්ථානයේදී "කිරි සැකසුම් කිරීමේ තාක්ෂණය" පිළිබඳ උසස් පුහුණු වැඩසටහනක් පවත්වන ලද අතර, එයින් උපයා ගත් ආදායම රු. 99,052 ක් විය. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් ඇතිව මෙම වැඩසටහන පවත්වන ලදී.

.

4.8.7 තාක්ෂණය ලබා දීමේ වැඩමුළු

තාක්ෂණ සේවා අංශයට සම්බන්ධ ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල්, කෙඳි සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන උප අංශ යටතේ තාක්ෂණය ලබා දීමේ වැඩසටහන් 90 ක් පවත්වන ලද අතර එමගින් රු. 4,764,362 ක ආදායමක් උපයා ගන්නා ලදී. මෙම වැඩසටහන් තුළින් පුද්ගලයින් 1,867 දෙනෙක් පුහුණු කරන ලදී.



රූපසටහන 4.8.1 - අංශය විසින් උපයා ගන්නා ලද ආදායම - 2017

4.8.8 කුළුබඩු සැකසුම් තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව -

කුළුබඩු සැකසුම් තාක්ෂණය සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර පිළිබඳව පරිපූර්ණ දැනුමක් ලබා දීම සඳහා මෙම වැඩසටහන පවත්වන ලදී. මෙම පාඨමාලාව තුළින් ක්‍රමානුකූල කුළුබඩු සැකසුම් කිරීම සහ ඒ ආශ්‍රිත ප්‍රමිතීන් පිළිබඳව අත්දැකීම් සහ පළපුරුද්ද ලබා ගැනීම සඳහා අවස්ථාවක් සපයා දීම පිණිස කුළුබඩු සැකසුම් කර්මාන්ත නැරඹීමේ සංචාරයක් ද සංවිධානය කරමින් එම ක්ෂේත්‍රය පිළිබඳ ක්‍රමානකූල දැනුමක් සපයා දීමට අරමුණු කරන ලදී.



රූපසටහන 4.8.2 - අංශය විසින් පුහුණු කරන ලද සහ සහාය ලබා දෙන ලද පුද්ගලයින් - 2017

4.9 සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLPF)

ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීම සඳහා 1998 වර්ෂයේදී මෙම මධ්‍යස්ථානය පිහිටුවන ලදී. ඒ අනුව මෙම අංශය කෙටි කාලීන සහ දිගු කාලීන පාඨමාලා පැවැත්වීම මගින් අදාළ තාක්ෂණික තොරතුරු ලබා දීම සහ කර්මාන්තයේ නියැළී සිටින සේවකයින්ගේ කුසලතා වැඩිදියුණු කිරීම සිදු කරයි. මෙය පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධ දේශීය කර්මාන්ත නගාසිටුවීමට උපකාරී වී තිබේ. මෙම අංශයේ ප්‍රධාන මධ්‍යස්ථානය මොරටුව, කටුබැද්දෙහි පිහිටා තිබෙන අතර ප්‍රදේශීය ඒකක දෙක වාරියපොළ සහ.

4.9.1 මෙම මධ්‍යස්ථානය විසින් සපයා දෙනු ලබන සේවාවන්

- පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණය ලබා දීමේ වැඩමුළු පැවැත්වීම.
- පාවහන් සැලසුම් කිරීම සහ මෝස්තර සැකසීම පිළිබඳ සහාය ලබා දීම.
- නව නිෂ්පාදන සහ නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ දැනුම සහ මෝස්තර සපයා දීම.
- වෙළඳ සහ යන්ත්‍ර සූත්‍ර තොරතුරු සපයා දීම
- මූලික අවදානම අඩු කිරීම සඳහා පහසුකම් සපයා දීම
- ක්ෂේත්‍රයේ සිටින සේවකයින්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා සහාය වීම.
- පුහුණු සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම:
  - සැලසුම් සහ මෝස්තර සකස් කිරීම
  - පාවහන්වල ඉහළ වැස්ම
  - සම් කැපීම
  - කාන්තා පාවහන් නිෂ්පානය
  - පිරිමි පාවහන් නිෂ්පාදනය
  - සම් භාණ්ඩ නිෂ්පාදනය

4.9.2 මෙම මධ්‍යස්ථානයෙන් ලබා ගත හැකි පහසුකම්

- සම් කැපීමේ යන්ත්‍රය
- පැලුම් යන්ත්‍රය
- සම් පටි කැපීමේ යන්ත්‍රය
- හැඩ කැපීමේ යන්ත්‍රය
- සම්පීඩකය සහ දියර විදීමේ කාමරය
- ඔපකිරීමේ සහ නිමාව ගැනීමේ යන්ත්‍රය
- පාවහන්වල අඩිය තද කිරීමේ යන්ත්‍රය
- ප්‍රතික්‍රියක යන්ත්‍රය

4.9.3 මෙම අංශය විසින් ඉටු කරන ලද ක්‍රියාකාරකම්

රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල අරමුදල් සැපයීම යටතේ අම්පාර, බදුල්ල, කොළඹ, ගාල්ල, කුරුණෑගල, මාතර, හම්බන්තොට, යාපනය, මඩකලපුව, පොළොන්නරුව සහ වවුනියාව යන දිස්ත්‍රික්කවලදී පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණය ලබා දීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන් වලින් බොහොමයක් ප්‍රාදේශීය සංවර්ධන අංශයේ සම්බන්ධීකරණය යටතේ සිදු කරන ලදී.

1) සේවකයින්ගේ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා සහ ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා දිවයින පුරා සිටින ව්‍යවසායකයින් සඳහා වැඩසටහන් 23 ක් පවත්වන ලදී. රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල සහාය ඇතිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර, එමගින් රු. 4,030,662 ක සමස්ත ආදායමක් උත්පාදනය කර ඇත.

2) පාවහන් නිෂ්පාදන අංශයේ සේවකයින් සඳහා ඉල්ලුම පදනම්ව සකස් කළ "පාවහන් සැලසුම් කිරීම සහ මෝස්තර නිර්මාණය" නම් වූ පුහුණු වැඩසටහන් 03 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන හරහා පාවහන් නිෂ්පාදන අංශයට නවීන මෝස්තර නිර්මාණ සහ පාවහන් සැලසුම් කිරීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ හසල දැනුමකින් සවිබල ගැන්වූ, ඉහළ නිපුණතාවයක් සහිත සැලසුම්කරුවන් සපයා දී ඇත. මෙම සමස්ත ව්‍යාපෘතිය මගින් රු. 583,472 ක මුදලක් උපයා ගන්නා ලදී.

3) බෑග් නිෂ්පාදන අංශය සඳහා බෑග් සැලසුම් කිරීම සහ මෝස්තර නිර්මාණය පිළිබඳ ඉල්ලුම මත පදනම්ව සකස් කළ පුහුණු වැඩසටහන් 03 ක් පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන් හරහා බෑග් නිෂ්පාදන ක්ෂේත්‍රයට නවීන මෝස්තර නිර්මාණය කිරීමේ සහ සැලසුම් සකස් කිරීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ මනා දැනුමක් සහිත, ඉහළ කුසලතාවයෙන් පිරි, තාක්ෂණික වශයෙන් විධිමත් නිෂ්පාදකයින් හඳුන්වා දී තිබේ. මෙම සමස්ත ව්‍යාපෘතිය මගින් රු. 396,473 ක් උපයා ගෙන ඇත.

4) දේශීය සහ විදේශීය වෙළඳ පොළ සමග තරග කිරීමට හැකි වනු පිණිස සුළු පරිමාණ පාවහන් නිෂ්පාදකයින්ගේ නිෂ්පාදනවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම.

5) කාර්මික සංවර්ධනය මණ්ඩලය වෙත ලබා දුන් ප්‍රාග්ධන අයවැය මගින් ක්‍රියාත්මක කළ විශේෂ ව්‍යාපෘති යටතේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමේ පුහුණු වැඩසටහන් පහක් පවත්වන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාලවල සහාය ඇතිව කුරුණෑගල, බදුල්ල, මඩකලපුව සහ කොළඹ දිස්ත්‍රික්කවල එම වැඩසටහන් පවත්වන ලදී.

6) අනෙකුත් අමාත්‍යාංශ සහ අදාළ ආයතන සමග එක්ව විවිධ කමිටුවලට සහභාගී වී ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලීන්ට දායකත්වය සපයා දී ඇත. මෙම උපදේශක කමිටු සැසි අතරතුරදී ශ්‍රී ලංකාවේ පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී.

7) විවිධ රාජ්‍ය ආයතනවල පාවහන් සහ සම්භාණ්ඩ අවශ්‍යතා මිලදී ගැනීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවලට සහභාගී වීම.

8) තරුණ උපාධිධාරීන් මෙම අංශය වෙත ආකර්ෂණය කර ගැනීමේ අරමුණ ඇතිව, මෝස්තර නිර්මාණය කිරීමේ විෂයය හා සම්බන්ධ විශ්වවිද්‍යාල සිසුන් සඳහා පහසුකම් සපයා දෙන ලද අතර, ඔවුන්ගේ ප්‍රායෝගික ව්‍යාපෘති සඳහා කර්මාන්ත අත්දැකීම් ලබා දෙන ලදී.

9) පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ක්‍රියාවලියට සහාය වීම පිණිස ඔවුන්ට පිරිසැකසුම් පහසුකම් සපයා දෙන ලදී. කර්මාන්තකරුවන් 131 දෙනෙකු සඳහා සේවා සපයා දීම වෙනුවෙන් රු. 192,186 ක මුදලක් උපයා ගෙන ඇත.

10) කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පුහුණුව ලැබ පාවහන් කර්මාන්ත ආරම්භ කිරීමට උනන්දුවෙන් සිටින ව්‍යවසායකයින්ට මූලික අවදානම අඩු කර ගැනීම සඳහා සහනදායී පහසුකම් සපයා දී ඇත.

11) ශ්‍රී ලංකාවෙහි සිටින පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින් සහ පුහුණු ආයතන පිළිබඳ දත්ත සංචිතයක් පවත්වාගෙන යාම.

12) පාවහන් නිෂ්පාදනය සහ බෑග් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් දහ අට (18) පොළොන්නරුව සහ වවුනියාව පුනරුත්ථාපන මධ්‍යස්ථානවලදී පවත්වන ලද අතර පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල්වරයා විසින් එම වැඩසටහන් සඳහා අරමුදල් සපයා දෙන ලදී.

13) මෑත කාලයේදී සේවයෙන් විශ්‍රාම ලැබූ ශ්‍රී ලංකා යුද හමුදාවේ සෙබළුන් සඳහා වැඩමුළු සහ ක්ෂේත්‍ර සංචාර සංවිධානය කරන ලදී. එමගින් ඔවුන්ට පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයේ රැකියා අවස්ථා උදා කර දෙමින්, ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කර, ජාතික ආර්ථිකයට ඔවුන්ගේ හැකියාවන්හි දායකත්වය ලබා දීමට ද හැකිවී තිබේ.

14) 2017 වර්ෂය තුළදී මෙම මධ්‍යස්ථානය විසින් උපයා ගත් මුළු ආදායම රු.5,782,437 ක් වේ.

4.10 රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය (RPD & SC)

1980 වර්ෂයේදී ලෝක බැංකු ආධාර යටතේ පැලියගොඩ ස්ථාපනය කරන ලද රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ රබර් ආශ්‍රිත කර්මාන්ත වලට සහාය ලබා දෙයි. රබර් ආශ්‍රිත නිෂ්පාදන සිදුකරන කර්මාන්තකරුවන් 200 ට ආසන්න පිරිසක් දීර්ඝ කාලයක් පුරා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සපයා දෙනු ලබන සේවා ලබා ගනිමින් මෙම මධ්‍යස්ථානයෙහි නිත්‍ය සේවාදායකයින් ලෙස සිටින අතර ඔවුන් නිෂ්පාදන සංවර්ධන සහ පරීක්ෂණ පහසුකම්, ව්‍යාප්ති සහ උපදේශක සේවා, ගැනුම්කරුගේ ඉල්ලීම අනුව ස්වභාවික සහ කෘතිම රබර් සංයෝග කිරීම සහ රසායනික ද්‍රව්‍ය සහ අනෙකුත් සැකසුම්කාරක සිල්ලර වශයෙන් අලෙවි කිරීම වැනි සේවාවන් ලබා ගනිති.

මෙම මධ්‍යස්ථානය විසින් 2017 වර්ෂය තුළදී සපයා දෙන ලද සේවාවන් පිළිබඳ විස්තර සහ ඒවායෙහි කාර්ය සාධනය පහත වගුවේ සාරාංශ කර ඇත.

මෙම මධ්‍යස්ථානය විසින් සපයා දෙන ලද සේවාවන් පිළිබඳ විස්තර සාරාංශය

	සේවා	මිනුම් දර්ශකය	සංඛ්‍යාව
(අ)	තාක්ෂණය ලබා දීම	සේවා දායකයින් සංඛ්‍යාව	38
(ආ)	පරීක්ෂණ පහසුකම් (අපනයන වෙළඳ පොළ සඳහා රබර් නිෂ්පාදන නිපදවනු ලබන කර්මාන්තකරුවන්ට පරීක්ෂණ පහසුකම් සපයා දීම ද මෙයට ඇතුළත් වේ.)	ඉටු කළ වැඩ සංඛ්‍යාව	135
(ඇ)	උප කොන්ත්‍රාත් අවස්ථා	වැඩ සංඛ්‍යාව	02
(ඈ)	නිෂ්පාදන සංවර්ධනය සහ විවිධාංගීකරණය	වැඩ සංඛ්‍යාව	27
(ඉ)	තාක්ණික උපදේශකත්වය	සංඛ්‍යාව	86

වගුව - **4.10.1**

4.10.1 සංවර්ධන ක්‍රියාකාරකම්:

මෙම මධ්‍යස්ථානය **2017** වර්ෂයේදී පහත සඳහන් සංයෝග සැලසුම් කිරීම් සහ සකස් කිරීම්, ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම් සහ නිෂ්පාදන සංවර්ධන කටයුතු සිදු කර ඇත.

වර්ෂය තුළදී සිදු කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් - **2017**

අ)	සංයෝග සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම
	ඉටු කරන ලද විශේෂ නිෂ්පාදන වැඩ
i	බ්‍රේක් සිලින්ඩර් බූට්
ii	ඔනන් කමින්ස් ජෙනරේටර් සඳහා මවුන්ටිං ෂූ
iii	ටයර් ට්‍රෙඩ්
iv	ප්‍රෙෂර් ස්විච් ඩයෆ්‍රම්
v	ඔයිල් සීල්
vi	මෙඩිකල් මැට්
vii	බ්ලෝ පයිප්
viii	යෝගා මැට්
ix	ගෑස් සීල්
x	රබර් මවුන්ට්
xi	ටී/බොක්ස් වෑල්ව්
xii	සීල්

ආ)	ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ ක්‍රියාකාරකම් - සහතික **146**	
	විශේෂ නිෂ්පාදන	සහතික පත් ගණන
i	ටයර් ට්‍රෙඩ්	72
ii	සොලිඩ් ටයර්	10
iii	රබර් බීඩිං ෆෙන්ඩර්ස්	02
iv	ඔයිල් ප්‍රතිරෝධී ආරක්ෂක සපත්තු	04
v	එක්සර්සයිස් රබර් බෑන්ඩ්	02
vi	රබර් මවුන්ට්	10
vii	ලේටෙක්ස් ග්ලව්ස්	02
viii	වෝටර් සීල්	06
ix	ටයර් ෆ්ලැප්	10
x	රබර් බෑන්ඩ්	02
xi	රබර් මැට්	02
xii	රබර් ගෑස්කට්	03
xiii	ටයර් රීබිල්ඩිං	16
xiv	ඔයිල් සීල්	05

ඇ)	ප්‍රධාන නිෂ්පාදන සංවර්ධන වැඩ
	නිෂ්පාදනයේ නම
i	රබර් ගෑස්කට්
ii	වෝටර් සීල්
iii	ඩස්ට් සීල්
iv	ෆුඩ් ග්‍රේඩ් සීල්
v	බාත් කැප්
vi	හයිඩ්‍රොලික් සීල්
vii	ෆුට් වෑල්ව්
viii	බෙයරිං පිල්
ix	මැට්
x	වෝටර් සීල්
xi	ටයර් ෆ්ලැප්
xii	ටයර් ට්‍රෙඩ්

වගුව - **4.10.2**

මෙම මධ්‍යස්ථානය විසින් නව කර්මාන්තකරුවන් ප්‍රවර්ධනය කිරීම පිණිස සහ දැනට සිටින කර්මාන්තකරුවන් විසින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම පිණිස වියළි රබර් සහ රබර් කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ නිරූපණ වැඩසටහන් **23** ක් පවත්වා ඇත.

එමෙන්ම මෙම මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය විසින් පවත්වන ලද රබර් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට සහභාගී වූ සිසුන් සඳහා රසායනාගාර ප්‍රායෝගික පන්ති පවත්වා ඇත.

මෙම මධ්‍යස්ථානය මෙම වර්ෂය තුළදී ස්වයං මූල්‍ය සපයාගන්නා ඒකකයක් බවට පත්වමේ අරමුණ ඉටු කර ගැනීම උදෙසා සතුටුදායක ප්‍රගතියක් අත්කර ගෙන තිබේ. මෙම වර්ෂය තුළ දී තාක්ෂණික සහ වාණිජ මෙහෙයුම් වලින් උපයාගත් වැට් සහ ජාතිය ගොඩනැගීමේ බදු රහිත ආදායම රුපියල් මිලියන **20.5** ක් විය.

භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවි කිරීම - 2017

අංකය	භාණ්ඩය	ප්‍රමාණය (කි.ග්‍රෑ)	අලෙවි වටිනාකම (රු.)	එකතුව (රු.)
(01)	රබර් සංයෝග විකිණීම - කි.ග්‍රෑ.	27,900.97	15,414,534.32	
(02)	නැවත ඇඹරීම ද ඇතුළුව ඇඹරුම් ගාස්තු	15,615.18	282,286.29	
(03)	සංයෝග කරන ලද රබර් කිරි (L3) - ගැලුම්	1,654.00	2,255,170.00	
(04)	කේන්ද්‍රාපසාරී රබර් කිරි (C.Latex) - ගැලුම්	444.25	568,896.74	
(05)	රසායනික ද්‍රව්‍ය	1,009.00	600,630.73	
(06)	කෙම්ලොක්– ලීටර්	30.80	183,926.20	
(07)	පොලිතින් – කි.ග්‍රෑ.	317.73	112,684.97	
(08)	අපකිරණ රසායනික සංයෝග	369.00	193,218.00	
	උප එකතුව			**19,611,347.25**
(09)	සේවා			
	(9.1) ව්‍යාප්ති සහ උපදේශක		216,212.50	
(10)	නිරූපණ / වැඩමුළු / උප කොන්ත්‍රාත්			
	(10.1) තත්ත්ව පාලන සහ රසායනාගාර පරීක්ෂණ		387,622.61	
	(10.2) භාණ්ඩ සංවර්ධන		128,546.76	732,381.87
	එකතුව			**20,343,729.12**
	2% ජාතිය ගොඩනැගීමේ බද්ද			406,874.58
	15% වැට්			3,112,590.56
	බදු සහිත මුළු එකතුව			**23,456,319.68**



රූපසටහන 4.10.1 - රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය විසින් සපයා දෙන ලද සේවා - 2017

මූල්‍ය ප්‍රකාශන

- **විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**
- **විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**
- **හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය**
- **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**
- **වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනට විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

	සටහන	2017	2016
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	14	1,451,043,622	1,350,056,061
ක්‍රියාත්මක කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ		33,744,045	19,280,725
ස්ථාවර තැන්පත්	15	59,764,317	54,003,793
		1,544,551,984	1,423,340,579
ජංගම වත්කම්			
බඩු තොග (තොග සහ ක්‍රියාත්මක කෙරෙමින් පවතින වැඩ)	16	22,150,901	30,900,030
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු (ණය ගැතියෝ)	17	19,269,861	26,035,847
වෙනත් ජංගම වත්කම්	18	108,821,480	77,333,136
පූර්ව ගෙවීම්	19	32,913,210	14,420,904
විශේෂ ව්‍යාපෘති	20	6,676,099	-
මුදල් සහ මුදල් හා සමාන දෑ	21	108,805,600	194,895,214
		298,637,150	343,585,131
මුළු වත්කම්		1,843,189,134	1,766,925,710
නිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධන සංචිත			
ශුද්ධ රජයේ ප්‍රදාන	22	289,185,401	282,787,422
ප්‍රාග්ධන සංචිත		6,243,013	6,243,013
පවරා දෙන ලද වත්කම්වල වටිනාකම	23	13,447,061	13,447,061
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය	24	988,387,631	961,817,782
වෙනත් රජයේ ප්‍රදාන	25	391,692,201	342,657,514
		1,688,955,307	1,606,952,792
රජයේ ප්‍රදාන		1,930,291,117	1,930,291,117
සමුච්චිත පාඩු	26	(2,203,038,173)	(2,154,331,321)
		(272,747,056)	(224,040,204)
මුළු නිමිකම්		1,416,208,251	1,382,912,588
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	27	149,510,467	137,072,925
විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන	28	15,508,332	35,863,915
සංස්ථාවට ගෙවිය යුතු හිඟ	29	-	12,939,579
		165,018,798	185,876,418
ජංගම වගකීම්			
රජයට ගෙවිය යුතු හිඟ	30	84,059	83,814
සංස්ථාවට ගෙවිය යුතු හිඟ	31	27,469,211	27,097,701
බැංකු ණය ශේෂ	21	38,761,209	42,376,612
ප්‍රතිපාදන සහ උපචිත වියදම්	32	195,647,606	128,578,576
		261,962,085	198,136,703
		1,843,189,134	1,766,925,710

අධ්‍යක්ෂ - මුදල් - වයි.ජේ. හසන්

"පිටු අංක 05 සිට 11 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 12 සිට 22 දක්වා ඇති සටහන් මෙම ප්‍රකාශන සම්පූර්ණවීම සඳහා අවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත්කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන්නේය."

මහින්ද ජීනසේන	**බී.එන්.පී. මෙන්ඩිස්**
සභාපති	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත .)

	සටහන්	2017	2016
ආදායම	**05**	283,928,764	166,992,951
අලෙවි සහ සේවා පිරිවැය	**06**	(187,867,297)	(135,446,906)
දළ ලාභය		**96,061,468**	**31,546,045**
වෙනත් ආදායම්	**07**	89,522,766	102,363,963
රජයේ පුනරාවර්තන ප්‍රදාන	**08**	278,000,000	286,000,000
පරිපාලන වියදම්	**09**	(490,715,818)	(439,742,618)
අලෙවි බෙදා හැරීම් වියදම්	**10**	13,993,716	(7,978,261)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල		**(13,137,868)**	**(27,810,871)**
මූල්‍ය පිරිවැය	**11**	(4,990,928)	(2,218,712)
බදු ගෙවීමට පෙර ශුද්ධ ආදායම / (පාඩුව)		(18,128,796)	(30,029,583)
වෙනත් විස්තීර්ණ ආදායම්	**12**	605,676	28,873,913
වර්ෂය සඳහා ශුද්ධ ආදායම / (පාඩුව)		**(17,523,120)**	**(1,155,669)**
අති විශේෂ අයිතම	**13**	-	(510,690)
අති විශේෂ අයිතමවලට පසු මුළු විස්තීර්ණ (පාඩුව) / ආදායම		**(17,523,120)**	**(1,666,359)**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

	ශුද්ධ රජයේ දායක මුදල	ප්‍රාග්ධන සහ සංචිත	පවරාදෙන ලද වත්කම් වටිනාකම	ප්‍රත්‍යාගණන අතිරික්තය	වෙනත් රජයේ ප්‍රදාන	රජයේ ප්‍රදාන	සමුච්චිත අතිරික්තය / හිඟය	එකතුව
2016 ජනවාරි 01 දිනට ශේෂය	277,910,082	6,243,013	13,447,061	999,334,417	165,498,930	1,930,291,117	(2,175,923,392)	**1,216,801,232**
පෙර වර්ෂයේ ගැළපීම්	-	-	-	-	-	-	23,258,430	**23,258,430**
වර්ෂය සඳහා ලාභය	-	-	-	-	-	-	(1,666,359)	**(1,666,359)**
ප්‍රත්‍යාගණන අතිරික්තය සඳහා ගැළපීම්	-	-	-	(37,516,635)	-	-	-	**(37,516,635)**
රජයේ ප්‍රදාන	45,000,000	-	-	-	202,192,297	-	-	**247,192,297**
ප්‍රදාන ක්‍රමක්ෂය (පෙර වර්ෂය)	-	-	-	-	(39,034)	-	-	**(39,034)**
ප්‍රදාන ක්‍රමක්ෂය	(40,122,661)	-	-	-	(9,994,678)	-	-	**(50,117,339)**
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**282,787,422**	**6,243,013**	**13,447,061**	**961,817,783**	**357,657,514**	**1,930,291,117**	**(2,154,331,322)**	**1,397,912,592**
2017 ජනවාරි 01 දිනට ශේෂය	282,787,422	6,243,013	13,447,061	961,817,783	357,657,514	1,930,291,117	(2,154,331,322)	**1,397,912,592**
විශේෂ ව්‍යාපෘතියට මාරු කිරීම්	-	-	-	-	(15,000,000)	-	-	**(15,000,000)**
	282,787,422	6,243,013	13,447,061	961,817,783	342,657,514	1,930,291,117	(2,154,331,322)	**1,382,912,592**
පෙර වර්ෂයේ ගැළපීම්	-	-	-	-	-	-	(31,183,732)	**(31,183,732)**
වර්ෂය සඳහා ලාභය	-	-	-	-	-	-	(17,523,120)	**(17,523,120)**
පෙර වර්ෂයේ ගැළපීම්	-	-	-	26,569,849	-	-	-	**26,569,849**
රජයේ ප්‍රදාන	55,000,000	-	-	-	66,953,882	-	-	**121,953,882**
ප්‍රදාන ක්‍රමක්ෂය	(48,602,021)	-	-	-	(17,919,195)	-	-	**(66,521,216)**
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	**289,185,400**	**6,243,013**	**13,447,061**	**988,387,632**	**391,692,201**	**1,930,291,117**	**(2,203,038,174)**	**1,416,208,255**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

වර්ෂය සඳහා ශුද්ධ (පාඩුව)/ආදායම		**(17,523,120)**
මූල්‍ය නොවන අයිතම සඳහා ගැළපීම්		
ක්ෂයවීම්	44,772,522	
ණය සහ අත්තිකාරම් සඳහා වෙන් කිරීම්	5,201,003	
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	(66,521,216)	
බොල් සහ අඩමාන ණය	(14,303,301)	
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	20,005,711	(10,845,279)
		(28,368,399)
ගෙවන ලද විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		(7,568,169)
		(35,936,568)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්		
තොග (වැඩිවීම / අඩුවීම)	8,749,129	
ණයගැතියෝ සහ ලැබිය යුතු මුදල් (වැඩිවීම) / අඩුවීම	21,069,287	
අනෙකුත් ශුද්ධ ජංගම වත්කම් (වැඩිවීම) / අඩුවීම	(26,287,341)	
ශුද්ධ පූර්ව ගෙවීම් (වැඩිවීම) / අඩුවීම	(18,492,306)	
රජයට ගෙවිය යුතු මුදල් වැඩිවීම / (අඩුවීම)	245	
සංස්ථාවට ගෙවිය යුතු මුදල් වැඩිවීම / (අඩුවීම)	(12,568,069)	
ණය හිමියෝ සහ උපචිත ගාස්තු (වැඩිවීම) / අඩුවීම	67,069,029	39,539,974
මෙහෙයුම් තුළින් ජනිත වූ මුදල්		**3,603,406**
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනිතවූ මුදල් ගලනයන්		
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	(5,760,524)	
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ මත ආයෝජනය කළ මුදල	(14,463,320)	
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම / ඉදිකිරීම	(140,039,987)	(160,263,831)
		(156,660,424)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ගලනයන්		
රජයෙන් ලැබුණු ප්‍රදාන	121,953,882	
විශේෂ ව්‍යාපෘතිවල ආයෝජන	(47,767,670)	74,186,212
		(82,474,213)
එකතු කළා: 2017.01.01 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ		152,518,603
2017.12.31 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ		**70,044,390**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 සාමාන්‍ය තොරතුරු

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 1969 අංක 36 දරණ ලංකා කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාගත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙම මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, අංක 615, ගාලු පාර, කටුබැද්ද යන ලිපිනයෙහි පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට සහාය වීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යය වේ.

2 වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 සකස් කිරීමේ පදනම සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම

මණ්ඩලයෙහි මූල්‍ය ප්‍රකාශන උපචිත ගිණුම්කරණ පදනම සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මතය යටතේ සකස් කර ඇත. අඛණ්ඩභාවය පදනමකින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර, මෙම කාල පරිච්ඡේදය පුරාවට අනුකූල වන ලෙස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගෙන ඇත.

2.2 දේපළ, පිරියත සහ උපකරණ

සියලුම දේපළ, පිරියත සහ උපකරණ මුල් අවස්ථාවේදී පිරිවැයට වාර්තා කර ඓතිහාසික පිරිවැයෙන් ක්ෂයවීම් අඩුකර සඳහන් කරනු ලැබේ. අදාළ අයිතම අත්පත් කර ගැනීම සඳහා සෘජුව ම දරණ ලද පිරිවැය ඓතිහාසික පිරිවැයට ඇතුළත් වන අතර, අයිතමය අත්පත් කර ගන්නා අවස්ථාවේ හෝ කිසියම් කාලපරිච්ඡේදයක් ඇතුළත තොග උපදවීම හැර වෙනත් කාර්යයන් සඳහා එම කාල පරිච්ඡේදය තුළ එම අයිතමය භාවිතා කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනයක් දරණු ලබන බැඳීම් වන එම අයිතම ගලවා ඉවත්කර එම අයිතමය තිබූ ස්ථානය යළි යථා තත්ත්වයට පත් කිරීම සඳහා මූලිකව ඇස්තමේන්තු කරන පිරිවැය ද ඓතිහාසික පිරියවැයට ඇතුළත්වේ.

වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී, ධාරණ වටිනාකමෙහි යම් වෙනස්වීමක් සිදුවුව හොත්, එය පූර්වයෙන් වියදමක් ලෙස හඳුනාගන්නා ලද එම වත්කමටම අදාළ පූර්ව ප්‍රත්‍යාගණන අඩුවීමකට අදාල නොවන්නේ නම්, එය සෘජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලැබේ. මෙවැනි අවස්ථාවලදී, වැඩිවීම පූර්වයෙන් ලියා ගෙන ඇති ප්‍රමාණයට ආදායමක් ලෙස හඳුනා ගෙන තිබේ. ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කමක ධාරණ වටිනාකම අඩුවූ විට, එම අඩුවීම එම වත්කමට අදාළ පූර්ව වැඩිවීමක් ප්‍රතිවර්තන නොකරන්නේ නම් එය වියදමක් ලෙස හඳුනා ගනු ලබන අතර එවැනි අවස්ථාවකදී එම අඩුවීම එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි දරණු ලබන මුදල ඉක්මවා නොයන මට්ටමට අදාළ ප්‍රත්‍යාගණන අතිරික්තයක් තිබේ නම් එම අතිරික්තයෙන් එය අය කරනු ලැබේ. වත්කමකට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි කිසියම් ශේෂයක් ඉතිරිවී තිබේ නම්, එය එම වත්කම ඉවත් කිරීමෙහිදී හෝ බැහැර කිරීමෙහිදී සෘජුවම සමුච්චිත ලාභයට / (අලාභයට) මාරු කරනු ලැබේ.

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් භාවිතා කිරීම සඳහා සූදානම්ව තිබීම ආරම්භ වූ දිනයේ සිටම ක්ෂයවීම් අඩුකිරීම ආරම්භ වන අතර එම අයිතමය ඉවත් කරන තුරු, එම කාල පරිච්ඡේදය තුළ එම උපකරණය ප්‍රයෝජනයට නොගෙන තිබුණ ද, අඛණ්ඩව ක්ෂයවීම් අඩු කරනු ලැබේ. ක්ෂයවීම සරල රේඛීය පදනමකින් දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයේ ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට අය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කිරීම සිදු නොකෙරේ. ඇස්තුමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් පහත සඳහන් පරිදි වේ.

(අා) ක්ෂයවීම්

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් භාවිතා කිරීම සඳහා සූදානම්ව තිබීම අරම්භ වූ දිනයේ සිටම ක්ෂයවීම් අඩු කිරීම ආරම්භ වන අතර එම අයිතමය ඉවත් කරන තුරු, එම කාල පරිච්ඡේදය තුළ එම උපකරණය ප්‍රයෝජනයට නොගෙන තිබුණ ද, අඛණ්ඩව ක්ෂයවීම් අඩු කරනු ලැබේ. ක්ෂය වීම සරල රේඛීය පදනමකින් දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයේ ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට අය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කිරීම සිදු නොකෙරේ. ඇස්තුමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් පහත සඳහන් පරිදි වේ.

1	ඉඩම් වැඩි දියුණු කිරීම හා ගොඩනැගිලි	2.5%
2	පරිගණක මෘදුකාංග	7.0%
3	පිරියත සහ යන්ත්‍ර සූත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, කාර්යාලයීය උපකරණ, විද්‍යාගාර උපකරණ, ලීබඩු සහ සවිකිරීම්, පාපැදි, විවිධ වත්කම්, උපයෝජ්‍ය සේවා, PABX සේවා සහ වෙනත් වත්කම්	10.0%
4	පරිගණක සහ මෝටර් වාහන	20.0%
5	මෙවලම්, පොත්, ගමන් මලු	25.0%

වත්කම්වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් සෑම ශේෂපත්‍ර දිනයකදීම සමාලෝචනය කර යෝග්‍ය වන්නේ නම් ගැලපීම් සිදු කරනු ලැබේ.

වත්කමක ධාරණ වටිනාකම එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි නම් එකෙනෙහිම එම වත්කමෙහි ධාරණ වටිනාකම එහි නැවත අයකර ගත හැකි වටිනාකමට ලියා තබනු ලැබේ.

බැහැරකිරීමේදී සිදුවන ලාභය / පාඩුව බැහැරකිරීමෙන් ලබන මුදල ධාරණ වටිනාකම හා සංසන්දනය කිරීමෙන් නිරණය කරනු ලැබේ. මේවා ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර තිබේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.3.1 පහත සඳහන් ඉඩම් කා.සං.ම. විසින් පරිහරණය කරනු ලබන නමුත් මණ්ඩලයට එම ඉඩම්වල නීත්‍යානුකූල හිමිකමක් නොමැති නිසා මණ්ඩලය ඒවා ප්‍රාග්ධනිත කර නැත.

අංකය	ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කය	වර්ගඵලය			භාවිතා කරන කාර්යය	බුක්තිය ලබා ගත් දිනය	අත්පත් කර නොගැනීමට හේතුව	අත්පත් කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය
		අක්කර	රූඩ	පර්චස්				
1	අනුරාධපුර		1	20	ප්‍රාදේශීය කාර්යාලය	1971 සිට	රජයේ ඉඩමකි	බදු ගිවිසුමක් මගින් අයිතිය පවරා දී ඇත
					පොදු සේවා මධ්‍යස්ථානය		රජයේ ඉඩමකි	බුක්තිය ලබා දී ඇත, එහෙත් අයිතිය පවරා දී නැත
2	පොළොන්නරුව		3	26.6	ප්‍රාදේශීය කාර්යාලය සහ සංචාරක බංගලාව	1992 සිට	රජයේ ඉඩමකි	දිස්ත්‍රික් ලේකම් වෙත භාර දී ඇත.
3	මාතර	1	1	6.2	ප්‍රාදේශීය කාර්යාලය සහ පොදු සේවා මධ්‍යස්ථානය			අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් - මාතර විසින් ලිපියක් මගින් මණ්ඩලයට බුක්තිය පවරා දී ඇත.
4	හම්බන්තොට				ප්‍රාදේශීය කාර්යාලය	2006 සිට	ඉඩම සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත	
					සම්භාණ්ඩ මධ්‍යස්ථානය - විතාරන්දෙනිය			ඉඩම අත්පත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්ට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත
5	මොණරාගල			48	ප්‍රාදේශීය කාර්යාලය		රජයේ ඉඩමකි	ඉඩම භාවිතා කිරීම සඳහා ලිපියක් මගින් මණ්ඩලයට බුක්තිය ලබා දී ඇත.
6	බදුල්ල			80	"ගම් උදා" මධ්‍යස්ථානය - මහියංගනය	1997 සිට		සමෘද්ධි බැංකුව - මහියංගනය විසින් ලබා දී ඇති ලිපියක් මගින් මණ්ඩලයට බුක්තිය පවරා දී ඇත.
7	කොළඹ	හෙක්. 1.2953			ප්‍රධාන කාර්යාලය		අයිතිය: කුඩා කර්මාන්ත දෙපා.	ඉඩම අත්පත් කර ගැනීම සඳහා අදාළ ආයතනවලට ලිපියක් මගින් ඉල්ලීම් කර ඇත.
					නවබිම මධ්‍යස්ථානය			
8	කොළඹ	හෙක්. 0.4046			රබර් සංවර්ධන මධ්‍යස්ථානය	1980 සිට	99 අවුරුදු බදු පදනම මත	
9	අම්පාර				ප්‍රාදේශීය කාර්යාලය		රජයේ ඉඩමකි	ලිපියක් මගින් පවරා දී ඇත
10	කොළඹ	13	2	6	කාර්මික ජනපදය - පානඵව	2006 සිට		අත්පත් කර ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් කැබිනට් පත්‍රිකාවක් සකස් කර ඇත.
11	බද්දේගම	1	2	0.5	කාර්මික ජනපදය	1992 සිට		ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට ඉඩම් පවරා දීම සඳහා කා.සං.ම. සහ ඉ.ප්‍ර.කො. අතර සාකච්ඡා පවත්වා ඇත.
12	බෙලිඅත්ත	10	0	29.2	කාර්මික ජනපදය	1995 සිට		

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.4 මූල්‍ය වත්කම්

2.4.1 වර්ගීකරණය

කාර්මික සංවර්ධන මණ්ඩලය මූල්‍ය වත්කම් අත්පත් කරගත් කාර්යය පදනම් කර ගෙන එහි මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු මුදල් වශයෙන් වර්ග කර ඇත.

ණය සහ ලැබිය යුතු මුදල්

ණය සහ අය විය යුතු මුදල් සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ප්‍රකාශ නො කළ ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ඒවා ශේෂ පත්‍ර දිනෙන් පසු මාස 12 කට වැඩි කල් පිරීම් හැරෙන්නට වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ වශයෙන් ජංගම වත්කම්වල ඇතුළත් කර ඇත.

2.4.2 මූල්‍ය වත්කම් හඳුනාගැනීම

ණය සහ ලැබිය යුතු මුදල් ආරම්භක අවස්ථාවේදී සාධාරණ වටිනාකමට ගනු දෙනු පිරිවැය එකතු කළ අගයට හඳුනා ගනු ලබන අතර ඉන් පසුව සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ගෙන යනු ලැබේ.

2.4.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනා ගත් වටිනකම් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවර වත්කම උපලබ්ධි කර වගකීම පියවීමේ චේතනාවක් ඇති විට මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම ශේෂ පත්‍රයේ වාර්තා කරනු ලැබේ.

2.4.4 මූල්‍ය වත්කම් හානිකරණය

(අ) ක්‍රමක්ෂය කළ පිරිවැයට ගෙන යනු ලබන වත්කම් (ණය සහ ලැබිය යුතු මුදල්)

සෑම වාර්තා කිරීමේ කාල පරිච්ඡේදයක් අවසානයේදී ම කාර්මික සංවර්ධන මණ්ඩලය එහි මූල්‍ය වත්කමකට හෝ මූල්‍ය වත්කම් වලට හානි සිදු වී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවූ සිද්ධීන් (අලාභ සිද්ධි) එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස එම වත්කම් හානිකරණය වී ඇති බවට වෛෂයික සාක්ෂි ඇත්නම් පමණක් සහ එම අලාභ සිද්ධිය (සිද්ධීන්) විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්ට බලපෑමක් ඇති කරන්නේ නම් කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් හානි වී ඇති බවට සලකනු ලබන අතර මණ්ඩලය හානිකරණ පාඩු දරනු ලැබේ.

හානිකරණයට අදාළ වෛෂයික සාක්ෂි පවතින්නේ ද යන්න කාර්මික සංවර්ධන මණ්ඩලය මුලින් ම තක්සේරු කරයි.

ණය සහ ලැබිය යුතු මුදල් සඳහා අලාභයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකමෙහි සහ වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්හි (දැනට අලාභය දරා නොමැති අනාගත ණය අලාභ හැර) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස මනිනු ලැබේ. වත්කමෙහි ධාරණ අගය අඩු කරනු ලබන අතර අලාභයෙහි වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

පසුව එළඹෙන කාල පරිච්ඡේදයකදී හානිකරණ අලාභයෙහි වටිනාකම අඩුවන්නේ නම් සහ එම අඩුවීම වෛෂයිකව හානිකරණය හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමකට (ණයගැතියාගේ ණය ශ්‍රේණිගත කිරීමෙහි වර්ධනයක් වැනි) අදාළව විය හැකි නම්, පූර්වයෙන් හඳුනා ගන්නා ලද හානිකරණ අලාභය ප්‍රතිවර්ත කිරීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ පරීක්ෂා කිරීම 2.10 වැනි සටහනෙහි විස්තර කර ඇත.

2.5 මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම්වලට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ ණයට ගැනීම් ඇතුළත් වේ. අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් ආරම්භක අවස්ථාවේදී ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනා ගනු ලබන අතර ඉන් පසුව, වට්ටම් කිරීමෙහි ප්‍රතිඵලය නොසැළකිය හැකි මට්ටමේ නොමැති නම්, සඵල පොළී ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ඒවා මනිනු ලබන අතර එවිට ඒවා පිරිවැයට සඳහන් කරනු ලැබේ.

2.6 තොග

තොග වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තක්සේරු කරනු ලැබේ. පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමය යොදා ගනිමින් පිරිවැය තීරණය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහිදී තොග විකිණිය හැකි මිලෙන් නිම කිරීමේ ඇස්තමේන්තු කළ පිරිවැය සහ විකිණීම සිදු කිරීම සඳහා අවශ්‍ය කරන පිරිවැය අඩු කළ විට ලැබෙන මිලයි. තොග ඒවායේ වර්තමාන පිහිටීමට සහ තත්ත්වයට ගෙන ඒමට දරණ ලද පිරිවැය පහත සඳහන් පරිදි ගණන් ගනු ලැබේ:

අමුද්‍රව්‍ය	- පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට
නිම් භාණ්ඩ	- පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට
ක්‍රියාත්මක කෙරෙමින් පවතින වැඩ	- සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම් කර ගත් නිෂ්පාදන පොදු කාර්යවලින් යෝග්‍ය කොටසක පිරිවැයට.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.7 වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියේදී විකුණන ලද භාණ්ඩ සඳහා හෝ ඉටු කරන ලද සේවා සඳහා ගනුදෙනුකරුවන් ගෙන් අය වීමට ඇති මුදල් වේ. එක් වර්ෂයක් හෝ එයට අඩු කාලයක් තුළ අය කර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී එයටත් වැඩි කාලයක් නම්), එම මුදල් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. නො එසේ නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබිය යුතු දේ වලට අදාළ මුල් කොන්දේසි අනුව අය වීමට ඇති සියලුම වටිනාකම් අය කර ගැනීමට නොහැකි වනු ඇතැයි වෛෂයික සාක්ෂි ඇති විට, වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ ප්‍රතිපාදනයක් පිහිටුවනු ලැබේ. ණයගැතියාගේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බංකොලොත් භාවයට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඉඩ තිබීම, ගෙවීම් පැහැර හැරීම හෝ කඩ කිරීම ආදිය වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බව පෙන්නුම් කරන සාධක වේ. ප්‍රතිපාදනයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකම සහ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කළ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්හි වර්තමාන වටිනාකම අතර වෙනස වේ. ප්‍රතිපාදන පහත සඳහන් පරිදි ගණනය කරනු ලැබේ. වසර 5 ට වැඩි නම් 100% ප්‍රතිපාදනය කරනු ලබන අතර අනෙක්වා සඳහා 10% කි.

2.8 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දේ ට අත ඉතුරු මුදල්, බැංකුවල ඇති ඒක්ෂණ තැන්පතු, මාස තුනක හෝ එයට අඩු මුල් කල් පිරීමේ කාලයක් සහිත අනෙකුත් කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයක් සහිත ආයෝජන සහ බැංකු අයිරා ඇතුළත් වේ. බැංකු අයිරා ශේෂ පත්‍රයේ ජංගම වගකීම්වල ණය ගැනුම් යටතේ පෙන්වා ඇත.

2.9 ප්‍රතිපාදන

කාර්මික සංවර්ධන මණ්ඩලයට අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳියාවක් ඇති විට, එම බැඳියාව බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලායාමක් සිදුවීම අවශ්‍ය විය හැකි විට සහ බැඳියාවෙහි වටිනාකම විශ්වාසනීය ලෙස තක්සේරු කළ හැකි විට ඒ සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

2.10 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

ශේෂ පත්‍රයෙහි වෙනත් ගෙවිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් වන්නේ ඉල්ලූ විට හෝ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට නියමිතව ඇති ගෙවිය යුතු දෑ වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති අයිතම වන්නේ ශේෂ පත්‍ර දිනයෙහි සිට එක් වර්ෂයකට වැඩි කාල පරිච්ඡේදයකදී ගෙවීමට නියමිතව ඇති වගකීම් වේ.

2.11 නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම යන්නෙන් අදහස් කරන්නේ සේවකයෙකු විශ්‍රාම ගැනීමේ දී එම සේවකයාට ලැබෙන ප්‍රතිලාභයෙහි වටිනාකම වන අතර එය සාමාන්‍යයෙන් සේවය කර ඇති වසර ගණන සහ වන්දිය වැනි සාධක එකක් හෝ වැඩි ගණනක් මත රඳා පවතී. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම 1983 අංක 12 දරණ පනත යටතේ ලබාදෙන පාරිතෝෂිකයෙන් සමන්විත වේ.

නිර්වචිත ප්‍රතිලාභ බැඳියාව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිත කර වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ප්‍රතිලාභ ගෙවනු ලබන ව්‍යවහාර මුදලින් බලපවත්වන රජයේ බැඳුම්කරවල පොළී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තු කරන ලද සහ කල් පිරීම සඳහා අදාළ විශ්‍රාම බැඳියාවෙහි කොන්දේසිවලට ආසන්න වන කොන්දේසි සහිත අනාගත මුදල් ගලායාම් වට්ටම් කරමින් නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවෙහි වර්තමාන වටිනාකම තීරණය කරනු ලැබේ.

අත්දැකීම් ගැලපීම් සහ ආයුගණක උපකල්පනයන්හි වෙනස්කම් මගින් හටගන්නා ආයුගණක ලාභ සහ පාඩු එම ලාභ හෝ පාඩු හටන්නා කාල පරිච්ඡේදය තුළ පරිපූර්ණ ආදායමෙහි ස්කන්ධයට අය කිරීම හෝ බැර කිරීම සිදු කරනු ලැබේ.

සැලස්මෙහි සිදු කරන වෙනස්කම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා (පැවරීමේ කාල පරිච්ඡේදය) සේවයේ රැඳී සිටින සේවකයින්ට කොන්දේසික නොවන්නෙහි නම් අතීත සේවා පිරිවැය එකෙනෙහි ම පරිපූර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. මෙසේ කිරීමෙහිදී, අනීත සේවා පිරිවැය පැවරීමේ කාල පරිච්ඡේදය පුරා සරල රේඛීය පදනමකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.12 නිර්වචිත දායක සැලැස්ම

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලුම ස්ථිර සහ කොන්ත්‍රාත් සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි සහ සේවක භාරකාර අරමුදලෙහි සාමාජිකයින් වන අතර, ඒ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අනුපිළිවෙලින් එවැනි සේවකයින්ගේ මූලික වේතනය හෝ වැටුප සහ ජීවන වියදම් දීමනා වලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවනු ලබයි.

2.13 ආයෝජන

ආයෝජන තනි ආයෝජන පදනම්න් තීරණය කරන ලද පිරිවැයට ගෙන යනු ලැබේ.

2.14 රජයේ ප්‍රදාන

රජයෙන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනා ගනු ලබන අතර මෙහිදී ප්‍රදානය ලැබෙනු ඇති බවට සහ කණ්ඩායම ඒ සම්බන්ධිත සියලු කොන්දේසිවලට එකඟ වනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇත.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන මගින් හිලව් කිරීමට අපේක්ෂිත පිරිවැය සමග ගැළපීමට අවශ්‍ය කරන කාල පරිච්ඡේදය පුරා එම ප්‍රදාන ආදායම් ප්‍රකාශනයෙහි විලම්භනය කර හඳුනා ගනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණවලට අදාළ රජයේ ප්‍රදාන විලම්බනය කරන ලද රජයේ ප්‍රදාන ලෙස ජංගම නොවන වත්කම්වල ඇතුළත් කර ඇති අතර අදාළ වත්කම්වල අපේක්ෂිත ජීවිත කාලය පුරා සරල රේඛීය පදනමකට ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.15 පරිත්‍යාග

පරිත්‍යාග යනු සාමාන්‍යයෙන් අන්‍යෝන්‍ය නොවන මාරුකිරීම් වේ. කෙසේ වුවත්, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රදායකයා වෙත නාම මාත්‍ර ප්‍රතිෂ්ඨාව ලබා දෙන අවස්ථා තිබිය හැක. එවැනි පරිත්‍යාග සඳහා, ප්‍රදායකයින් වෙත ලබාදී ඇති ප්‍රතිෂ්ඨාව අසාධාරණ හුවමාරු ගණුදෙනුවක් ප්‍රතිඵලය වන තරමට ලැබුණු පරිත්‍යාගයෙහි ප්‍රතිෂ්ඨාවට වඩා සැළකිය යුතු තරමින් අඩු නම්, ඒවා ලැබුණු පරිත්‍යාග ලෙස හඳුනා ගත යුතුය.

2.16 ආදායම් හඳුනාගැනීම

(අ). විකුණන ලද භාණ්ඩ සහ ඉටුකරන ලද සේවා

අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරා දී ඇති විට භාණ්ඩ අලෙවි කිරීමෙන් උපයා ගත් ආදායම, ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. අයවීමට ඇති ප්‍රතිෂ්ඨාව, ආශ්‍රිත පිරිවැය අයකර ගැනීම හෝ භාණ්ඩ ආපසු එවිය හැකි වීම පිළිබඳ සැළකිය යුතු අවිනිශ්චිතතාවයන් තිබේ නම් කිසිදු ආදායමක් හඳුනා ගනු නො ලැබේ.

(ආ). පොළී ආදායම

පොළී ආදායම කාල ප්‍රමාණ පදනමකින් හඳුනා ගනු ලැබේ.

ආදායම කාර්මික සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍ය ක්‍රියා පටිපාටියෙහිදී ලැබුණු හෝ භාණ්ඩ හා සේවා අලෙවි කිරීම නිසා ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවන්හි සාධාරණ වටිනාකම් වලින් සමන්විත වේ. ආදායම අගය එකතු කිරීමේ බද්ද, ප්‍රතිලාභ, ප්‍රතිදාන සහ වට්ටම්වල ශුද්ධ වටිනාකම ලෙස පෙන්වා ඇත.

2.1 වියදම් හඳුනාගැනීම

(අ). මෙහෙයුම් වියදම්

වියදම් උපචිත පදනමකින් හඳුනා ගනු ලැබේ. කාල පරිච්ඡේදය සඳහා ලාභය ගණනය කිරීමේදී සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහිදී සහ කාර්යක්ෂම තත්ත්වයෙන් දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමෙහිදී දරණ ලද සියලුම වියදම් ආදායමට අය කරනු ලැබේ.

(ආ). ශුද්ධ මූල්‍ය පිරිවැය

ශුද්ධ මූල්‍ය පිරිවැය ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලබන ණයට ගැනීම් සඳහා ගෙවිය යුතු පොළිය, ආයෝජනය කරන ලද අරමුදල් වලින් ලැබිය යුතු පොළිය, සහ විදේශ විනිමය ලාභ සහ පාඩු වලින් සමන්විත වේ.
ණයට ගැනීම් සම්බන්ධයෙන් දරණ ලද සියලු පොළී සහ අනෙකුත් පිරිවැය ශුද්ධ මූල්‍ය පිරිවැයෙහි කොටසක් ලෙස වියදම් දරා ඇත.

3 මූල්‍ය අවදානම් කළමනාකරණය

3.1 මූල්‍ය අවදානම් සාධක

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය උපකරණ බැංකු ණය, කෙටි කාලීන තැන්පතු සහ මුදල් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණවල ප්‍රධාන අරමුණ වන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ මෙහෙයුම්වල ද්‍රවශීලතාවය ඉහළ නැංවීම සහ පවත්වා ගෙන යාම සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංචිත මත ලැබෙන ප්‍රතිලාභය උපරිම කිරීමයි. කාර්මික සංවර්ධන මණ්ඩලයට එහි ව්‍යාපාර ක්‍රියාකාරකම් වලින් සෘජුව ම ඇති වන ලැබිය යුතු වෙළඳ සහ ගෙවිය යුතු වෙළඳ ආදී වශයෙන් වූ වෙනත් විවිධ මූල්‍ය උපකරණ ද තිබේ.
කාර්මික සංවර්ධන මණ්ඩලය විවිධ වූ මූල්‍ය අවදානම් රැසකට නිරාවරණය වී ඇත. විදේශ විනිමය අවදානම්, ණය අවදානම්, පොළී අනුපාත අවදානම් සහ ද්‍රවශීලතා අවදානම් මෙයට අයත් වේ. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආර්ථික දර්ශනය සහ මෙම අවදානම් වලට එහි ඇති නිරාවරණය පදනම් කර ගෙන කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කලට විවිධ අවදානම් කළමනාකරණ ක්‍රමෝපායයන් අනුමත කරයි.

(i) පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොළී අනුපාත වල සිදුවන වෙනස්කම් නිසා මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ගලනයන් උච්චාවචනය විය හැකි වීමේ අවදානමයි. කාර්මික සංවර්ධන මණ්ඩලය වෙළඳපොළ පොළී අනුපාත වෙනස් වීමේ අවදානමට ඇති නිරාවරණය මූලික වශයෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි පාවෙන අනුපාත සහිත ණය බැඳීම්වලට අදාළව වේ. කාර්මික සංවර්ධන මණ්ඩලය දෛනිකව මුදල් ගලනයන් අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම, ණයට ගැනීම් අවම මට්ටමක තබා ගැනීම, සහ ණයට ගැනීම් සහ තැන්පතු සඳහා වාසිදායක අනුපාතයන් ගිවිස ගැනීම ආදී ක්‍රම මගින් එහි පොළී අනුපාත අවදානම කළමනාකරණය කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලය විචල්‍ය පොළී අනුපාත යටතේ ණය ලබාගෙන නොමැති නිසා 2017 දෙසැම්බර් 31 වැනි දිනට කාර්මික සංවර්ධන මණ්ඩලය පොළී අනුපාත අවදානමකට නිරාවරණය වී නැත.

(ii) ණය අවදානම

මුදල් සහ මුදල් හා සමාන දෑ, ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, සහ බැංකු සහ මූල්‍ය ආයතන වල ඇති තැන්පතු මෙන්ම නිහ ලැබිය යුතු දෑ සහ සිදු කළ ගනුදෙනු ද ඇතුළත්ව විදේශ ගනුදෙනුකරුවන්ට ඇති ණය නිරාවරණයන් ආදියෙන් ණය අවදානම ඇතිවේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

3 මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)

3.1 මූල්‍ය අවදානම් සාධක (ඉතිරි කොටස)

සාමාන්‍යයෙන් ණය ආවදානමට ලක්වන මූල්‍ය වත්කම්වල උපරිම අවදානම් තත්ත්වයන් ඒවායේ ධාරණ වටිනාකම් වලට සමාන වේ. උපරිම අවදානම් තත්ත්වයන් පහත සඳහන් වගුව මගින් පෙන්වා ඇත (2017.12.31 දිනට).

අවදානම් නිරාවරණය	වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු වටිනාකම්	මුදල් සහ මුදල් හා සමාන දෑ	එකතුව
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	19,269,861	-	-	19,269,861
මුදල් සහ මුදල් හා සමාන දෑ	-	-	108,805,600	108,805,600
	19,269,861	**-**	**108,805,600**	**128,075,460**

3.2 ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ දී කාර්මික සංවර්ධන මණ්ඩලයේ අරමුණු වන්නේ කොටස්කරුවන්ට ප්‍රතිලාභ ලබාදීම සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ප්‍රයෝජන සලසා දීම පිණිස ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යාමට කාර්මික සංවර්ධන මණ්ඩලය සතු හැකියාව ආරක්ෂා කිරීමත් ප්‍රාග්ධන පිරිවැය අඩු කිරීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යූහයක් පවත්වා ගැනීමත්ය.

කර්මාන්තයේ නියැළී සිටින අනෙකුත් කර්මාන්තකරුවන් හා අනුකූලව, කාර්මික සංවර්ධන මණ්ඩලය තෝලන අනුපාතය පදනමින් ප්‍රාග්ධනය අධීක්ෂණය කරයි. මෙම අනුපාතය මුළු හිමිකම්වලින් මුළු ණයට ගැනීම් ලෙස ගණනය කරනු ලැබේ. මුළු ණය ගැනුම්වලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්වා ඇති පරිදි ජංගම නොවන සහ ජංගම ණයට ගැනීම් ඇතුළත් වේ. මුළු හිමිකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති පරිදි මුළු හිමිකම ලෙස ගණනය කරනු ලැබේ.

2017 දෙසැම්බර් 31 දිනට තෝලන අනුපාතය පහත සඳහන් පරිදි විය.

	2017	2016
මුළු ණයටගැනීම්	426,980,883	384,013,122
මුළු හිමිකම්	1,416,208,251	1,382,912,588
තෝලන අනුපාතය	**30.15%**	**27.77%**

දිගු කාලීන ණය කිසිවක් ලබා ගෙන නොනිබුණි. කෙසේ වෙතත්, රු.මි. 50.0 ක ස්ථාවර තැන්පතුව ඇපයට තබා 2.5% ක අමතර පොළී අනුපාතයකට රු.මි. 45.0 ක අයිරා පහසුකමක් ලබා ගෙන තිබුණි. මේ මගින් අනිරික්ත අරමුදල් ආයෝජනය කිරීම හරහා පොළිය ලබා ගැනීම මගින් අමතර ආදායමක් උපයා ගැනීමට මෙයින් අපට පහසුකම් සැලසුණි.

4 අවිනිශ්චිතතාවයන් සහ විනිශ්චයන් තක්සේරු කිරීමේ ප්‍රධාන මූලාශ්‍ර පිළිබඳ තොරතුරු

තක්සේරු සහ විනිශ්චයන් අඛණ්ඩව ඇගයීම් කරනු ලැබේ. ඒවා ඓතිහාසික අත්දැකීම් සහ පවතින වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කළ හැකි, අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ද ඇතුළත් අනෙකුත් සාධක මත පදනම්ව ඇත.

4.1 ඉතා වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන

කාර්මික සංවර්ධන මණ්ඩලය අනාගතය සම්බන්ධ ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කරයි. එයින් ප්‍රතිඵල වන ගිණුම්කරණ ඇස්තමේන්තු ස්වභාවයෙන්ම අදාළ සත්‍ය ප්‍රතිඵලවලට සමානවන්නේ කලාතුරකිනි. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණික ගැළපීමක් සිදුකිරීමට හේතු වන සැලකිය යුතු අවදානමක් සහිත ඇස්තමේන්තු සහ උපකල්පනයන් පහත අනාවරණය කර ඇත.

(අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ආයුගණන පදනමකින් තීරණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) තීරණය කිරීමේදී යොදාගනු ලබන උපකල්පනවලට වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක අනුපාතය, මරණ අනුපාතිකය, කාර්ය භාරයෙන් ඉවත්වී මේ සහ ආබාධිත වීමේ අනුපාතයන් සහ විශ්‍රාම ගැනීමේ වයස ඇතුළත් වේ. මෙම උපකල්පනවලට සිදුකරනු ලබන කිසියම් වෙනස්කමක් මගින් නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල ධාරණ වටිනාකම මත බලපෑමක් ඇති කරනු ඇත.

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය භාවිතා කරමින් ස්වායත්ත ආයුගණකයින් අනුව ගණනය කරනු ලැබේ. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන වටිනාකම ආයුගණක තක්සේරුකරු විසින් නිසි පොළී අනුපාත යොදා ගනිමින් ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලායෑම් වට්ටම් කිරීමෙන් තීරණය කරනු ලැබේ.

විශ්‍රාම බැඳීම් සඳහා වන අනෙකුත් ප්‍රධාන උපකල්පන පවතින වෙළඳපොළ තත්ත්වයන් මත ද රඳා පවතී. අමතර තොරතුරු 26 වැනි සටහනෙහි සඳහන් කර ඇත.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

4.1 ඉකා වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන (ඉතිරි කොටස)

(ආ) දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලයන්

කාර්මික සංවර්ධන මණ්ඩලය ව්‍යාපාර සැලැස්ම සහ ක්‍රමෝපායයන්, අපේක්ෂිත භාවිත මට්ටම සහ අනාගත තාක්ෂණික වැඩි දියුණු කිරීම් වැනි සාධක පදනම් කර ගෙන දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කරයි. ඉහත සඳහන් කළ සාධක වල සිදුවන වෙනස්කම් හේතුවෙන් මෙම ඇස්තමේන්තුවල ඇතිවිය හැකි වෙනස්කම් මෙහෙයුම්වල අනාගත ප්‍රතිඵල වලට ප්‍රමාණික ලෙස බලපෑ හැකිය. දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලයෙහි අඩුවීමක් සිදුවීම මගින් වාර්තා කර ඇති ක්ෂය අය කිරීම් වැඩි විය හැකි අතර දේපළ, පිරියත සහ උපකරණ අඩුවිය හැක.

4.2 අවිනිශ්චිත වගකීම්

මුදල් වර්ෂය අවසානය වන විට මණ්ඩලයට එරෙහිව අධිකරණයේ පවරා තිබූ, විභාග කර අවසන්වී නොමැති නඩු 06 ක් තිබුණි. කෙසේ වෙතත්, නීති අංශයට අනුව, මෙම නඩුවල ප්‍රතිඵලය ලෙස කිසිදු වන්දියක් ගෙවීමට සිදු වීමේ හැකියාවක් නොතිබුණි. එබැවින් ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කිරීමේ වගකීමක් පැන නැඟී නොතිබුණි.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

05 ආදායම

	2017	2016
5 a විකුණුම්		
විකුණුම්	33,317,192	45,426,556
විකුණුම් (යකඩ නොවන ව්‍යාපෘතිය)	159,591,517	43,044,099
විකුණුම් ආදායම - කැස්පර්	2,303,535	2,367,605
ප්‍රකාශන අලෙවි කිරීම	315,090	370,538
	195,527,334	**91,208,797**
5 b සේවා		
කුලී - කාර්මික ජනපද	53,354,903	47,464,835
ජල ගාස්තු	6,857,973	8,249,446
වැඩිපුර අයකිරීම්	2,536,507	1,441,306
පුහුණු වැඩසටහන්	20,119,680	15,009,485
ව්‍යාපෘති වාර්තා	2,341,673	749,305
සේවා ගාස්තු	3,190,695	2,869,778
	88,401,431	**75,784,154**
	283,928,764	**166,992,951**
06 විකුණුම් සහ සේවා පිරිවැය		
විකුණුම් පිරිවැය - සෘජු ද්‍රව්‍ය	22,765,427	21,128,543
විකුණුම් පිරිවැය - කාර්මික ජනපද	5,550,817	5,216,142
විකුණුම් පිරිවැය - යකඩ නොවන අබලි ව්‍යාපෘතිය	109,707,224	39,547,446
විකුණුම් පිරිවැය - සෘජු ශ්‍රමය	2,748,122	4,166,340
විකුණුම් පිරිවැය - සෘජු නොවන ද්‍රව්‍ය	3,060,601	4,532,258
පාරිභෝජ්‍ය ඉංජිනේරු අමුද්‍රව්‍ය	-	20,175
අලෙවි පිරිසැකසුම් පිරිවැය	310,277	-
පිරියත සහ යන්ත්‍රසූත්‍ර නඩත්තු කිරීම	1,055,784	829,268
විදුලිය	3,119,129	3,773,047
පිරියත සහ යන්ත්‍රසූත්‍ර ක්ෂය	1,438,790	1,488,166
ඉඩම් වැඩිදියුණු කිරීම් ක්ෂය	5,720,723	3,737,708
ගොඩනැගිලි ක්ෂය	7,213,999	1,721,109
උපයෝගිතා සේවා ක්ෂය	853,700	183,782
ඉංජිනේරු වැඩ ගාස්තු	248,903	7,000
උප කොන්ත්‍රාත් ගාස්තු	81,240	1,012,363
කාර්මික ජනපද නඩත්තු කිරීම	1,692,191	1,636,570
රසායනාගාර උපකරණ නඩත්තු කිරීම	17,400	79,890
උපකරණ සහ අමතර කොටස් නඩත්තු කිරීම	52,167	99,585
ප්‍රවාහන ගාස්තු	1,327,033	1,461,914
පුහුණු වැඩසටහන්	19,745,704	13,690,206
විශේෂ ව්‍යාපෘති සඳහා වියදම්	1,158,065	31,115,394
	187,867,297	**135,446,906**
07 වෙනත් ආදායම්		
මාරු කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන	66,521,216	50,117,342
විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන	137,863	31,115,394
ව්‍යාපෘති පරිපාලන පිරිවැය අයකර ගැනීම්	495,804	-
ස්ථාවර සහ කෙටි කාලීන තැන්පතු පොළිය	13,009,324	8,840,975
විවිධ ආදායම්	1,876,656	5,112,657
කොමිස් (උප කොන්ත්‍රාත් හුවමාරු)	572,220	454,974
කොමිස් - ලක්කම් මධ්‍යස්ථානය	1,942,053	2,096,776
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,706,908	1,180,025
ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු	22,000	42,900
ලක්කම් ශාලා ගාස්තු	20,000	15,000
නොතාරිස් ගාස්තු	702,601	239,400

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

07 වෙනත් ආදායම් (ඉතිරි කොටස)

	2017	2016
දඩ	51,242	53,152
වෙබ් අඩවි පළකිරීම් ආදායම්	109,725	4,500
සංචාරක බංගලා ගාස්තු	222,176	185,045
ස්ථාවර වත්කම් අලෙවි කිරීම	-	294,491
ඉතිරිකිරීම් පොළිය	69,690	164,493
රසායනාගාර පරීක්ෂණ සඳහා සේවා ගාස්තු	379,365	582,151
කාර්ය මණ්ඩල ණය පොළිය	1,683,923	1,469,935
ප්‍රදර්ශන ආදායම	-	394,754
	89,522,766	**102,363,963**

08 ප්‍රදාන

	2017	2016
ආදායම් ප්‍රදාන	278,000,000	286,000,000

09 පරිපාලන වියදම්

	2017	2016
මූලික වැටුප්	186,856,568	152,472,365
සභාපතිවරයාගේ චේතනය	900,000	900,000
විශේෂ දීමනාව 5%	34,112,581	60,895,032
ජීවන වියදම් දීමනාව	48,744,758	47,431,632
වෙනත් දීමනා	15,830,188	7,314,780
සේ.අ.අ. දායකත්වය	28,604,422	24,027,982
සේ.නි.හා.අ. දායකත්වය	7,151,105	6,006,998
ජීවනා වියදම් දීමනාව සඳහා සේ.අ.අ. හිග	1,738,982	-
මණ්ඩලයේ සේවකයින් සඳහා ප්‍රසාද දීමනා	1,341,000	890,000
පාරිතෝෂික	20,611,388	18,844,059
පුහුණු දීමනා	1,248,800	1,001,525
දෛනිකව ගෙවනු ලබන සහ මුරකරු දීමනා	3,856,706	4,426,052
භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්	14,438,949	12,469,739
අතිකාල	10,980,737	9,535,239
නිවාඩු දින ගෙවීම්	1,377,403	868,338
ගමන් වියදම් (දේශීය)	5,891,021	6,110,539
ගමන් වියදම් (විදේශීය)	530,246	378,790
නවාතැන් වියදම්	127,900	148,500
ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	4,900,154	3,255,518
ඉන්ධන වියදම්	5,061,587	5,459,909
නිල ඇඳුම්	1,760,771	1,953,230
සේවක වන්දි	-	495,000
ඉඩම් නඩත්තු කිරීම	381,066	534,935
ගොඩනැගිලි නඩත්තු කිරීම	2,091,139	2,472,568
පිරියත සහ යන්ත්‍රසූත්‍ර නඩත්තු කිරීම	543,073	494,984
පරිගණක සහ උපාංග නඩත්තු කිරීම	625,737	588,798
මෝටර් වාහන නඩත්තු කිරීම	4,671,901	4,018,726
කාර්යාල නඩත්තු කිරීම් වියදම්	22,040	-
කාර්යාල උපකරණ නඩත්තු කිරීම	1,490,579	1,720,051
ලී බඩු, සවිකිරීම් සහ කාර්යාල උපකරණ නඩත්තු කිරීම	39,458	355,314
බයිසිකල් නඩත්තු කිරීම	2,000	15,390
PABX සේවා නඩත්තු කිරීම	-	3,020
විවිධ වත්කම් නඩත්තු කිරීම	37,399	23,633
ජල සැපයුම් නඩත්තු කිරීම	257,167	4,785
වෙබ් සහ ජාලකරණය නඩත්තු කිරීම	120,788	289,500
විදුලි බලය	7,631,202	7,428,569
දුරකථන ගාස්තු	4,954,029	5,131,864
ආරක්ෂක ගාස්තු ගෙවීම්	19,649,067	21,159,414

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

පරිපාලන වියදම් (ඉතිරි කොටස)		
තැපැල් සහ විදුලි පණිවුඩ	833,869	941,030
ජල ගාස්තු	783,238	1,006,228
කුලී, ගාස්තු සහ බදු	6,155,005	3,713,841
රක්ෂණ	1,151,970	1,513,777
පුවත්පත් සහ සඟරා	778,491	807,151
අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු	616,000	719,600
වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා දායකත්වය	819,000	782,500
විගණන ගාස්තු	864,000	1,242,000
වෛද්‍ය පරීක්ෂණ ගාස්තු	4,980	277,500
සුභසාධනය	1,768,707	1,837,887
විනෝදාස්වාද	1,012,369	825,541
වෙළඳ දැන්වීම්	2,810,839	4,445,885
නීති ගාස්තු	168,093	208,223
වෙළඳ පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ ආදිය සඳහා ගාස්තු	481,833	221,230
මණ්ඩලයේ සේවකයින් සඳහා දේශීය පුහුණු	2,088,205	1,058,800
වෘත්තියවේදී ආයතනවල සාමාජික ගාස්තු (දේශීය සහ විදේශීය)	85,093	33,103
බලපත්‍ර ගාස්තු	235,308	226,605
ප්‍රවර්ධන වියදම්	34,225	35,670
ප්‍රදර්ශන වියදම්	410,754	216,644
පර්යේෂණ සහ සංවර්ධන	68,840	93,000
තක්සේරු සහ මැනුම් වියදම්	809,834	456,120
උපදේශක ගාස්තු	5,867	-
ශක්‍යතා අධ්‍යයන	-	75,200
ප්‍රකාශන	249,513	91,642
ඡායාරූප	1,530	34,228
කම්කරු නඩු සඳහා වෙන් කිරීම්	-	341,018
ණය සහ අත්තිකාරම් සඳහා වෙන් කිරීම්	5,201,003	-
එස් 5 වැඩසටහන සඳහා වියදම්	265,674	-
ජා.ගො.බ. වියදම් - ලක්කම්	208,029	209,886
විවිධ වියදම්	307,854	392,205
ලියාපදිංචි ගාස්තු	177,198	100,452
වැඩිපුර අයකිරීම්	-	26,119
කර්මාන්තශාලා පොදු කාර්ය පිරිවැය නැවත වෙන් කිරීම්	(1,389,789)	(1,978,163)
සාමාන්‍ය පොදු කාර්ය පිරිවැය නැවත වෙන් කිරීම්	(1,670,812)	(2,715,184)
ශ්‍රම පිරිවැය නැවත වෙන් කිරීම්	(2,748,122)	(3,922,831)
ඉඩම් වැඩිදියුණු කිරීම් ක්ෂයවීම්	223,729	230,034
ගොඩනැගිලි ක්ෂයවීම්	4,515,798	3,467,391
පිරියත සහ යන්ත්‍රසූත්‍ර ක්ෂයවීම්	1,124,556	938,921
පරිගණක උපාංග ක්ෂයවීම්	5,245,855	3,912,971
රසායනාගාර උපකරණ ක්ෂයවීම්	1,100,380	816,319
මුද්‍රණ යන්ත්‍ර ක්ෂයවීම්	212,965	191,737
මෝටර් වාහන ක්ෂයවීම්	11,268,333	2,440,000
කාර්යාල උපකරණ ක්ෂයවීම්	2,935,774	2,459,037
ගමන් මලු ක්ෂයවීම්	20,261	24,660
ලීබඩු සහ සවිකිරීම් ක්ෂයවීම්	1,040,121	1,217,424
බයිසිකල් ක්ෂයවීම්	9,977	9,724
උපකරණ සහ අමතර කොටස් ක්ෂයවීම්	607,706	562,065
පුස්තකාල පොත් ක්ෂයවීම්	381,776	290,072
PABX සේවා ක්ෂයවීම්	161,778	271,109
උපයෝගිතා සේවා ක්ෂයවීම්	252,883	173,093
විවිධ වත්කම් ක්ෂයවීම්	340,204	216,307
පරිගණක මෘදුකාංග ක්ෂයවීම්	103,214	78,066
	490,715,818	**439,742,618**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

10 අලෙවි සහ බෙදාහැරීම් පිරිවැය	2017	2016
බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම්	14,303,301	(7,701,369)
අලෙවිකරණ වියදම්	(309,585)	(276,892)
	13,993,716	**(7,978,261)**

11 මූල්‍ය පිරිවැය	2017	2016
බැංකු ගාස්තු	232,362	405,362
බැංකු අයිරා පොළී	4,758,566	1,813,350
	4,990,928	**2,218,712**

12 වෙනත් විස්තීර්ණ ආදායම්	2017	2016
වර්ෂය සඳහා ආයුගණක ලාභය (පාඩුව)	605,676	28,873,913
	605,676	**28,873,913**

13 අති විශේෂ අයිතම	2017	2016
ගංවතුර පාඩුව - රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය - පෑලියගොඩ		
රක්ෂණ ලැබීම්	-	398,806
හානි පිරිවැය	-	(909,496)
ශුද්ධ ලාභය / (පාඩුව)	-	**(510,690)**
වර්ෂය තුළ සේවයේ යෙදී සිටි සාමාන්‍ය සේවක සංඛ්‍යාව		
ස්ථිර	**475**	**473**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

14 2017.12.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

	ඉඩම්	ඉඩම් වැඩි දියුණු කිරීම්	ගොඩනැගිලි	පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ සවිකිරීම්	මුද්‍රණ යන්ත්‍ර සූත්‍ර	JICA ව්‍යාපෘති වත්කම්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය						
ආරම්භක ශුද්ධ පොත් අගය / ප්‍රත්‍යාගණනය කළ අගය	763,367,687	-	410,722,216	45,671,000	1,213,500	(3)
පෙර වර්ෂයේ ගැළපීම් (පිරිවැය)	-	-	7,751,162	(592,480)	-	-
පෙර වර්ෂයේ ගැළපීම් (සමුච්චිත ක්ෂය)	-	(4,835,176)	(105,649)	-	-	-
පෙර වර්ෂයේ ගැළපීම් වලින් පසු ආරම්භක ශුද්ධ පොත් වටිනාකම	763,367,687	(4,835,176)	418,367,728	45,078,520	1,213,500	(3)
එකතු කිරීම්	-	50,850,394	1,008,999	9,922,229	-	-
බැහැර කිරීම්	-	-	-	-	-	-
ක්ෂය ගාස්තු (සටහන 9)	-	(3,967,742)	(5,188,500)	(2,427,088)	(191,737)	-
ප්‍රත්‍යාගණනය මත ක්ෂය	-	(2,287,500)	(6,444,924)	-	-	-
බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂය	-	-		-	-	-
අවසාන ශුද්ධ පොත් අගය	763,367,687	39,759,976	407,743,303	52,573,661	1,021,763	(3)
2016 දෙසැම්බර් 31 දිනට						
පිරිවැය	767,716,095	50,850,394	466,248,221	55,000,749	1,213,500	228,842,382
සමුච්චිත ක්ෂය	(4,348,408)	(11,090,418)	(58,504,918)	(2,427,088)	(191,737)	(228,842,385)
ශුද්ධ පොත් අගය	763,367,687	39,759,976	407,743,303	52,573,661	1,021,763	(3)
2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය						
ආරම්භක ශුද්ධ පොත් අගය / ප්‍රත්‍යාගණනය කළ අගය	763,367,687	39,759,976	407,743,303	52,573,661	1,021,763	(3)
පෙර වර්ෂයේ ගැළපීම් (පිරිවැය)	-	-	-	(3,649,417)	-	-
පෙර වර්ෂයේ ගැළපීම් (සමුච්චිත ක්ෂය)	-	-	-	2,035,057	-	-
පෙර වර්ෂයේ ගැළපීම් වලින් පසු ආරම්භක ශුද්ධ පොත් වටිනාකම	763,367,687	39,759,976	407,743,303	50,959,300	1,021,763	(3)
එකතු කිරීම්	-	111,030,465	9,182,287	1,159,623	905,000	-
බැහැර කිරීම්	-	-	-	-	-	-
ක්ෂය ගාස්තු (සටහන 9)	-	(5,944,452)	(11,729,797)	(2,563,346)	(212,965)	-
අවසාන ශුද්ධ පොත් අගය	763,367,687	144,845,989	405,195,792	49,555,577	1,713,798	(3)
2017 දෙසැම්බර් 31 දිනට						
පිරිවැය	767,716,095	161,880,859	475,430,508	52,510,954	2,118,500	228,842,382
සමුච්චිත ක්ෂය	(4,348,408)	(17,034,870)	(70,234,716)	(2,955,378)	(404,702)	(228,842,385)
ශුද්ධ පොත් අගය	763,367,687	144,845,989	405,195,792	49,555,577	1,713,798	(3)

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

14 2017.12. 31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

	කාර්යාල උපකරණ	රසායනාගාර උපකරණ	ගමන් මලු	ලීබඩු සහ සවිකිරීම්	බයිසිකල් පිරිවැය	උපකරණ සහ අමතර කොටස්	පුස්තකාල පොත්
2016 දෙසැ							
ආරම්භක ශුද්ධ							
පෙර වර්ෂයේ							
පෙර වර්ෂයේ							
පෙර වර්ෂයේ ගැ							
ඇතු කිරීම්							
හැර කිරීම්							
ක්ෂය ගාස්තු (							
ප්‍රත්‍යාගණනය							
බැහැර කළ ව							
අවසාන ශුද්							
2016 දෙසැ							
ිවැය							
ුවිචිත ක්ෂය							
ශුද්ධ පොත්							
2017 දෙසැ							
ආරම්භක ශුද්ධ							
පෙර වර්ෂයේ							
පෙර වර්ෂයේ							
පෙර වර්ෂයේ ගැ							
ඇතු කිරීම්							
හැර කිරීම්							
ෂය ගාස්තු (සටහන 9)							
අවසාන ශුද්ධ පොත් අගය							
2017 දෙසැම්බර් 31 දිනට							
ිවැය							
ුවිචිත ක්ෂය							
ශුද්ධ පොත් අගය							

	කාර්යාල උපකරණ	රසායනාගාර උපකරණ	ගමන් මලු	ලීබඩු සහ සවිකිරීම්	බයිසිකල් පිරිවැය	උපකරණ සහ අමතර කොටස්	පුස්තකාල පොත්
මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය							
ධ පොත් අගය / ප්‍රත්‍යාගණනය කළ අගය	5,657,000	-	52,513	5,456,750	250,000	-	543,102
ගැළපීම් (පිරිවැය)	717,994	-	-	-	-	-	3,500
ගැළපීම් (සමුච්චිත ක්ෂය)	(2,560)	-	-	-	-	929,373	(875)
ළපීම් වලින් පසු ආරම්භක ශුද්ධ පොත් වටිනාකම	6,372,434	-	52,513	5,456,750	250,000	929,373	545,727
	6,536,106	6,055,545	22,800	2,407,130	-	876,769	697,667
	(22,568)		(2,400)	(274,700)	-	-	-
සටහන 9)	(2,459,037)	(816,319)	(24,660)	(1,217,424)	(9,724)	(562,065)	(290,072)
මත ක්ෂය	-	-	-	-	-	-	-
ත්කම් සඳහා සමුච්චිත ක්ෂය	2,257	-	993	-	-	-	-
ධ පොත් අගය	10,429,192	5,239,226	49,246	6,371,756	240,276	1,244,077	953,322
මාර්තු 31 දිනට							
	12,888,531	6,055,545	1,291,405	7,589,180	250,000	1,806,142	12,897,248
	(2,459,340)	(816,319)	(1,242,159)	(1,217,424)	(9,724)	(562,065)	(11,943,926)
අගය	10,429,192	5,239,226	49,246	6,371,756	240,276	1,244,077	953,322
මාර්තු 31 දිනට අවසන් වර්ෂය							
ධ පොත් අගය / ප්‍රත්‍යාගණනය කළ අගය	10,429,192	5,239,226	49,246	6,371,756	240,276	1,244,077	953,322
ගැළපීම් (පිරිවැය)	6,724,519	-	-	(875,500)	-	-	-
ගැළපීම් (සමුච්චිත ක්ෂය)	(2,934,502)	-	-	87,550	-	-	-
ළපීම් වලින් පසු ආරම්භක ශුද්ධ පොත් වටිනාකම	14,219,209	5,239,226	49,246	5,583,806	240,276	1,244,077	953,322
	3,168,268	3,015,480	14,800.00	1,384,344	36,860.00	503,413	383,923
ෂය ගාස්තු (සටහන 9)	(2,935,774)	(1,100,380)	(20,261)	(1,040,121)	(9,977)	(607,706)	(381,776)
අවසාන ශුද්ධ පොත් අගය	14,451,703	7,154,326	43,785	5,928,029	267,159	1,139,783	955,469
2017 දෙසැම්බර් 31 දිනට							
ිවැය	22,781,318	9,071,025	1,306,205	8,098,024	286,860	2,309,555	13,281,171
ුවිචිත ක්ෂය	(8,329,616)	(1,916,699)	(1,262,420)	(2,169,995)	(19,701)	(1,169,771)	(12,325,702)
ශුද්ධ පොත් අගය	14,451,703	7,154,326	43,785	5,928,029	267,159	1,139,783	955,469

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

14 2017.12.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

	PABX සේවා	උපයෝජ්‍යතා සේවා	විවිධ වත්කම්	පරිගණක සහ සංනිවේදන උපකරණ	පරිගණක මෘදුකාංග	මෝටර් වාහන	එකතුව
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය							
ආරම්භක ශුද්ධ පොත් අගය / ප්‍රත්‍යාගණනය කළ අගය	860,476	1,036,947	1,702,205	7,487,409	-	53,316,001	**1,297,336,805**
පෙර වර්ෂයේ ගැළපීම් (පිරිවැය)	-	91,367	(1,134,974)	-	-	-	**6,836,568**
පෙර වර්ෂයේ ගැළපීම් (සමුච්චිත ක්ෂය)	2,000	(9,821)	-	(62,489)	-	(13,920,000)	**(18,005,196)**
පෙර වර්ෂයේ ගැළපීම් වලින් පසු ආරම්භක ශුද්ධ පොත් වටිනාකම	862,476	1,118,493	567,231	7,424,920	-	39,396,001	**1,286,168,174**
එකතු කිරීම්	-	5,845,151	335,460	11,779,375	1,008,801	-	**97,346,425**
බැහැර කිරීම්	-	-	-	-	-	-	**(299,668)**
ක්ෂය ගාස්තු (සටහන 9)	(271,109)	(356,875)	(216,307)	(3,912,971)	(78,066)	(2,440,000)	**(24,429,696)**
ප්‍රත්‍යාගණනය මත ක්ෂය	-	-	-	-	-	-	**(8,732,424)**
බැහැර කළ වත්කම් සඳහා සමුච්චිත ක්ෂය	-	-	-	-	-	-	**3,249**
අවසාන ශුද්ධ පොත් අගය	591,367	6,606,768	686,384	15,291,324	930,735	36,956,001	**1,350,056,060**
2016 දෙසැම්බර් 31 දිනට							
පිරිවැය	4,308,731	21,800,528	902,691	19,179,534	1,996,651	56,154,501	**1,716,992,028**
සමුච්චිත ක්ෂය	(3,717,364)	(15,193,760)	(216,307)	(3,888,210)	(1,065,916)	(19,198,500)	**(366,935,968)**
ශුද්ධ පොත් අගය	591,367	6,606,768	686,384	15,291,324	930,735	36,956,001	**1,350,056,060**
2017 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය							
ආරම්භක ශුද්ධ පොත් අගය / ප්‍රත්‍යාගණනය කළ අගය	591,367	6,606,768	686,384	15,291,324	930,735	36,956,001	**1,350,056,060**
පෙර වර්ෂයේ ගැළපීම් (පිරිවැය)	-	-	(581,022)	(1,618,580)	-	-	**-**
පෙර වර්ෂයේ ගැළපීම් (සමුච්චිත ක්ෂය)	-	-	58,025	1,342,967	-	5,131,000	**5,720,097**
පෙර වර්ෂයේ ගැළපීම් වලින් පසු ආරම්භක ශුද්ධ පොත් වටිනාකම	591,367	6,606,768	163,387	15,015,711	930,735	42,087,001	**1,355,776,157**
එකතු කිරීම්	-	3,785,595	60418.60	4,143,726	1,054,485	211,300	**140,039,987**
බැහැර කිරීම්	-	-	-	-	-	-	**-**
ක්ෂය ගාස්තු (සටහන 9)	(161,778)	(1,106,583)	(340,204)	(5,245,855)	(103,214)	(11,268,333)	**(44,772,522)**
අවසාන ශුද්ධ පොත් අගය	429,589	9,285,780	(116,398)	13,913,582	1,882,006	31,029,968	**1,451,043,622**
2017 දෙසැම්බර් 31 දිනට							
පිරිවැය	4,308,731	25,586,123	382,087	21,704,680	3,051,136	56,365,801	**1,857,032,014**
සමුච්චිත ක්ෂය	(3,879,142)	(16,300,343)	(498,485)	(7,791,098)	(1,169,130)	(25,335,833)	**(405,988,393)**
ශුද්ධ පොත් අගය	429,589	9,285,780	(116,398)	13,913,582	1,882,006	31,029,968	**1,451,043,622**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

15 ස්ථාවර තැන්පතු

	2017	2016
ලංකා බැංකුව - ඉඩම ශාඛාව	54,346,182	50,025,000
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය	5,418,136	3,978,793
	59,764,317	**54,003,793**

16 තොග සහ ක්‍රියාත්මක කරමින් පවතින වැඩ

	2017	2016
ඉංජිනේරු අමුද්‍රව්‍ය - (ප්‍ර/කා)	822,233	868,765
මුද්‍රණ අමුද්‍රව්‍ය	150,977	171,729
ලිපිද්‍රව්‍ය	3,032,894	2,036,129
වෙනත් අමුද්‍රව්‍ය	2,271,734	2,281,915
තොග - ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය	5,498,945	11,278,520
උප ගබඩාව - වාත්තු වැඩපොළ	2,891,293	3,870,395
උප ගබඩාව - රබර්	3,334,318	4,218,673
උප ගබඩාව - සම්භාණ්ඩ	98,447	352,323
උප ගබඩාව - පො.සේ.ම. - මාතර	566,982	158,009
උප ගබඩාව - විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය	1,331,900	1,258,138
උප ගබඩාව - යෝ.තා.ප.සං.ම. - පන්නල	605,817	892,962
උප ගබඩාව - දිවිනැගුම	17,000	17,000
උප ගබඩාව - කිතුල් සංවර්ධන වැඩසටහන	243,662	272,527
පිත්තල මධ්‍යස්ථානය - පිළිමතලාව	237,371	129,582
ක්‍රියාත්මක කරමින් පවතින වැඩ - සෘජු ද්‍රව්‍ය (ප්‍ර/කා)	1,091,119	1,411,614
ක්‍රියාත්මක කරමින් පවතින වැඩ - සෘජු ශ්‍රමය	240,709	383,379
ක්‍රියාත්මක කරමින් පවතින වැඩ - සාමාන්‍ය පොදු කාර්ය	268,802	285,120
ක්‍රියාත්මක කරමින් පවතින වැඩ - කර්මාන්ත ශාලා පොදු කාර්ය	106,856	198,652
නිමි භාණ්ඩ	291,612	-
යකඩ අඩංගු නොවන ලෝහ අබලි	2,096,786	3,863,155
චලනය නොවන තොග හානිකරණය සඳහා වෙන්කිරීම්	(1,584,236)	(1,584,236)
යල්පිනූ තොග හානිකරණය සඳහා වෙන් කිරීම්	(1,464,321)	(1,464,321)
	22,150,901	**30,900,030**

17 වෙළෙඳ සහ අනෙකුත් අයවිය යුතු දෑ

	2017	2016
විවිධ ණයගැතියෝ - ප්‍රධාන කාර්යාලය	264,713	264,713
විවිධ ණයගැතියෝ - සම්භාණ්ඩ	18,270	18,270
විවිධ ණයගැතියෝ - ඉංජිනේරු	607,062	604,611
විවිධ ණයගැතියෝ - ඉංජිනේරු - කම්හල	6,135,571	19,881,863
විවිධ ණයගැතියෝ - රබර් අංශය	1,335,201	1,612,460
විවිධ ණයගැතියෝ - යෝ.තා.ප.සං.ම. - පන්නල	1,485,799	1,843,934
විවිධ ණයගැතියෝ - වි.ලෝ.ම.	73,272	73,272
විවිධ ණයගැතියෝ - මුද්‍රණ	374,061	374,061
විවිධ ණයගැතියෝ - විදුලි	248,334	701,826
විවිධ ණයගැතියෝ - වාත්තු වැඩපොළ	1,042,207	4,739,535
විවිධ ණයගැතියෝ - සිවිල්	2,155,803	2,155,803
විවිධ ණයගැතියෝ - ලක් නිපැයුම්	42,120	42,120
විවිධ ණයගැතියෝ - පො.සේ.ම. - මාතර	939,153	346,492
විවිධ ණයගැතියෝ - පො.සේ.ම. අනුරාධපුර	15,025	15,025
ණයගැතියෝ - ආපසු එවූ වෙක්පත්	209,398	209,398
බදුකාර ණයගැතියෝ	30,096,011	33,227,904
විවිධ ණයගැතියෝ	406,707	406,707
	45,448,707	66,517,993
අඩුකළා: බොල් සහ අඩමාන ණය හානිකරණය සඳහා වෙන්කිරීම්	(26,178,846)	(40,482,147)
	19,269,861	**26,035,847**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

18 වෙනත් ජංගම වත්කම්

	2017	2016
උත්සව අත්තිකාරම්	407,300	364,800
උත්සව අත්තිකාරම් හානිකරණ පාඩුව සඳහා වෙන් කිරීම්	(141,050)	-
මෝටර් සයිකල් ණය	1,175,405	333,748
මෝටර් සයිකල් ණය හානිකරණ පාඩුව සඳහා වෙන් කිරීම්	(195,960)	-
බයිසිකල් අත්තිකාරම්	116,304	129,254
බයිසිකල් ණය හානිකරණ පාඩුව සඳහා වෙන් කිරීම්	(2,504)	-
ආපදා ණය	47,643,990	39,320,914
ආපදා ණය හානිකරණ පාඩුව සඳහා වෙන් කිරීම්	(342,209)	-
විශේෂ ණය අත්තිකාරම් (ගංවතුර)	1,324,764	-
අඩු කළා: විලම්බිත කාර්ය මණ්ඩල පිරිවැය	(37,226,305)	(37,226,305)
පූර්වයෙන් ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය (IFR ගැළපීම්)	37,226,305	37,226,305
විශේෂ අත්තිකාරම් පොත	13,100	11,500
අනෙකුත් දෙපාර්තමේන්තු වලින් ලැබිය යුතු	421,933	421,933
උපකොන්ත්‍රාත් භූවමාරු	429,823	863,057
රඳවා ගැනීමේ බදු	2,423,630	2,016,777
ලැබිය යුතු වැට්	51,363,240	28,944,779
කිතුල් - අලෙවිකරණ	281,675	281,675
යකඩ නොවන ලෝහ - පාලන ගිණුම	-	742,661
ආර්ථික සේවා ගාස්තු	170,872	170,872
රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු	3,731,167	3,731,167
	108,821,480	**77,333,136**

19 තැන්පතු සහ පූර්ව ගෙවීම්

	2017	2016
ඇප තැන්පතු	253,460	241,132
පූර්ව ගෙවීම්	42,115,041	18,853,860
පූර්ව ගෙවීම් හානිකරණය සඳහා වෙන්කිරීම්	(11,673,095)	(7,226,319)
පූර්ව ගෙවීම් අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය	192,206	192,206
කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය	928,370	871,275
කාර්ය මණ්ඩල හානිකරණය සඳහා වෙන්කිරීම්	(635,977)	(560,073)
කාර්ය මණ්ඩල ඉන්ධන අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය	232,212	292,312
කාර්ය මණ්ඩල අත්තිකාරම් හානිකරණය සඳහා වෙන්කිරීම්	(232,212)	(235,612)
ලැබිය යුතු වෙනත් තැන්පතු	1,187,725	1,576,503
ගමන් වියදම් අත්තිකාරම් (විදේශීය)	-	190,620
කලින් ගෙවූ කුලිය සහ වෙනත් වියදම්	545,480	225,000
	32,913,210	**14,420,904**

20 විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන

	2017	2016
ISO 14001 සහතිකය ලබා ගැනීම සඳහා සු.ම.ක. වලට පහසුකම් සැලසීම (නියාමන ව්‍යාපෘතිය)	1,152,971	-
ව්‍යවසායකත්ව සංස්කෘතිය සහ කුසලතා සංවර්ධන ව්‍යාපෘතිය	1,977,770	-
දිවියට උදානය	3,545,357	-
	6,676,099	**-**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

21 මුදල් සහ බැංකු ශේෂ

ගිණුම් කේතය		ගිණුම් අංකය	2017	2016
	බැංකු ගිණුම - ලක් නිපැයිම් - පොළොන්නරුව		-	11,605
185200	ජංගම ගිණුම - IRDP - මාතර	00022667-9	-	2,076
185010	ජංගම ගිණුම - ඉඩම - මොරටුව	682974	(38,761,209)	(40,960,624)
185110	ජංගම ගිණුම - පැලියගොඩ - ර.නි.සං.සේ.ම.	4064199	125,366	967,295
185020	ජංගම ගිණුම - ප්‍රාග්ධන ප්‍රදාන බැංකු ගිණුම	683231	751,982	(1,415,987)
185030	බැංකු ශේෂය - ඉංජිනේරු අංශය	683144	46,510	516,176
185180	බැංකු ශේෂය - ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය	4204245	454,396	5,248,932
185070	බැංකු ශේෂය - යකඩ නොවන ලෝහ	682519	25,647,206	321,639
185060	බැංකු ශේෂය - ප්‍රාදේශීය අංශය (කිතුල්)	683237	4,929,617	32,971,946
185412	ලංකා බැංකුව - "ඉඩම" අබලි ව්‍යාපෘතිය ඉතිරි කිරීම් ගිණුම	7271240	194,868	187,240
185090	ජංගම ගිණුම - මහජන බැංකුව	100153657035	7,361,875	48,610,950
185415	ජංගම ගිණුම - ලක්කම් අලෙවි මධ්‍යස්ථානය	7153282	2,053,989	1,127,322
185015	ජංගම ගිණුම - හර බද්ද නිදහස් කිරීම		4,024,074	2,368,416
185125	දිස්ත්‍රික් කාර්යාලය - බැංකු ගිණුම (ප්‍රාදේශීය)		20,892	307,717
185413	ඉතිරි කිරීම් ගිණුම - CESS අරමුදල	9123868	1,582,752	1,525,279
	කෙටි කාලීන තැන්පතු		58,400,907	100,013,581
	ලැබිය යුතු කෙටි කාලීන තැන්පතු පොළිය		608,408	646,305
	අග්‍රිම ගිණුම		22,308	4,669
	විශේෂ අග්‍රිම - අයකැම්		23,379	23,379
	මාර්ගස්ථ මුදල්		2,544,531	28,148
	මාර්ගස්ථ මුදල් - ලෝහ අබලි ව්‍යාපෘතිය		12,540	12,540
			70,044,390	**152,518,603**
	හර ශේෂ		108,805,600	194,895,214
	ණය ශේෂ		(38,761,209)	(42,376,612)
	මුදල් සහ මුදල් හා සමාන දෑ		**70,044,390**	**152,518,603**

22 ශුද්ධ රජයේ දායකය

	2017	2016
2017 ජනවාරි 01 දිනට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	282,787,422	277,910,082
2017 වර්ෂය තුළදී ලැබුණු ප්‍රදාන	55,000,000	45,000,000
මාරු කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන	(48,602,021)	(40,122,661)
	289,185,401	**282,787,422**

23 මාරු කරන ලද වත්කම්වල වටිනාකම

	2017	2016
1969 පෙර කා.සං.ම.	4,403,441	4,403,441
කාර්මික ජනපද සංස්ථාව	9,043,620	9,043,620
	13,447,061	**13,447,061**

24 ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය

	2017	2016
ඉදිරියට ගෙනා ශේෂය	961,817,782	999,334,417
ප්‍රත්‍යාගණන අතිරික්තය	26,569,849	(37,516,635)
	988,387,631	**961,817,782**

25 වෙනත් රජයේ ප්‍රදාන

	2017	2016
Cess අරමුදල	10,500,000	10,500,000
Sirap අරමුදල - ගොඩනැගිලි	24,541,653	25,388,919
ප්‍රදාන - ර.නි.සං.සේ.ම., පැලියගොඩ, සඳහා ඉන්ජෙක්ෂන් මෝල්ඩිං යන්ත්‍රය	8,406,159	9,318,027
අමාත්‍යාංශ අරමුදල් - අච්චුවේලි	25,926,815	22,834,039
අමාත්‍යාංශ අරමුදල් කාර්මික ජනපද	262,043,880	260,126,686
යකඩ නොවන ලෝහ	10,000,000	10,000,000
අමාත්‍යාංශ අරමුදල් - තා.සේ. අංශය රසායනාගාරය	3,952,137	4,489,843
පානලුව කාර්මික ජනපදය	28,821,558	-
ප්‍රතීතනය ලත් ආහාර රසායනාගාරය	17,500,000	-
	391,692,201	**342,657,514**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

26 රජයේ ප්‍රදාන

	2017	2016
ශේෂය	1,930,291,117	1,930,291,117
සමුච්චිත පාඩු	(2,154,331,321)	(2,175,923,391)
ගැළපීම්	(31,183,732)	23,258,430
ඉදිරියට ගෙනා නිහය	(17,523,120)	(1,666,359)
සමුච්චිත පාඩු	**(2,203,038,173)**	**(2,154,331,321)**
	(272,747,056)	**(224,040,204)**

27 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා ගෙන ඇති මුදල් පහත සඳහන් කර ඇති පරිදි තීරණය කරනු ලැබේ.

	2017	2016
අරමුදල් සපයා නොමැති බැඳීම්වල වර්තමාන වටිනාකම	149,510,467	137,072,925
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වගකීම	**149,510,467**	**137,072,925**

වර්ෂය තුළ නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් වලනය පහත සඳහන් පරිදි වේ:

	2017	2016
ජනවාරි 01 දිනට	137,072,925	155,623,529
වර්තමාන සේවා පිරිවැය	9,125,230	8,045,317
පොළී පිරිවැය	11,486,158	10,798,742
පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක පාඩුව / (ලාභය)	(605,676)	(28,873,913)
	157,078,636	**145,593,675**
ගෙවන ලද ප්‍රතිලාභ	(7,568,169)	(8,520,751)
දෙසැම්බර් 31 දිනට	**149,510,467**	**137,072,925**

යොදා ගන්නා ලද ප්‍රධාන ආයුගණක උපකල්පන පහත සඳහන් පරිදි වේ:

	2017	2016
වට්ටම් අනුපාතය	9.50%	7.00%
අනාගත වැටුප් වැඩිවීම්	5.00%	5.00%
කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය	2.70%	4.06%
විශ්‍රාම යෑමේ වයස	60	60

28 විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන

	2017	2016
ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය	11,793,229	20,726,052
තොග මිලදී ගැනීම - යාපනය	-	137,863
අමාත්‍යාංශ අරමුදල් - Robot Arm	2,804,780	15,000,000
ආහාර අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට පහසුකම් සැලසීම, ඇසු	910,322	-
	15,508,332	**35,863,915**

29 මණ්ඩල සහ සංස්ථාවලට ගෙවිය යුතු

	2017	2016
ගෙවිය යුතු හිඟ සේ.අ.අ.	-	12,939,579
	-	**12,939,579**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

	2017	2016
30 රජයට ගෙවිය යුතු		
දේශීය ආදායම් කොමසාරිස්	28,879	28,879
දේශීය ආදායම් කොමසාරිස්, මුද්දර ගාස්තු	55,180	54,935
	84,059	**83,814**

	2017	2016
31 මණ්ඩල සහ සංස්ථා වෙත ගෙවිය යුතු		
ශ්‍රී ලංකා මහ බැංකුව - සේ.අ.අ.	5,632,953	3,988,778
ගෙවිය යුතු සේ.අ.අ. හිඟ	12,939,579	16,174,480
ගෙවිය යුතු සේ.නි.හා.අ. හිඟ	8,128,549	6,389,567
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	768,130	544,877
	27,469,211	**27,097,701**

	2017	2016
32 වෙළඳ සහ වෙනත් ණය හිමියෝ, වෙන් කිරීම් සහ උපචිත වියදම්		
වෙළඳ ණය හිමියෝ	54,773,145	5,560,107
සේවක පරිත්‍යාග	700	8,695
උප කොන්ත්‍රාත් භුවමාරු	-	25,639
ජාතිය ගොඩනැගීමේ බදු 2%	6,064,996	3,338,717
ගෙවිය යුතු කාර්ය මණ්ඩල අඩු කිරීම්	8,707	11,207
ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු	156,827	106,779
මැතිවරණ කොමසාරිස්	-	54,446
විවිධ ණයහිමියෝ	3,072,949	3,072,949
වෙනත් ණය හිමියෝ	40,883	40,883
විවිධ ණයහිමියෝ - ප්‍රධාන කාර්යාලය	2,918,974	1,925,374
විවිධ ණය හිමියෝ - යකඩ නොවන ලෝහ	-	124,787
නිරාකරණය කිරීමට නියමිතව තිබෙන තැන්පතු	831,674	1,093,683
ගෙවිය යුතු වැටුප්	8,606	(12,590)
ලක් නිපැයුම් අලෙවි සහ ප්‍රදර්ශන මධ්‍යස්ථානය - ණය හිමියෝ	89,753	89,753
ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු අත්තිකාරම්	1,829,800	3,614,812
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	-	32,320
ඇප තැන්පතු	253,460	241,132
ආපසු ගෙවිය යුතු තැන්පතු - කාර්මික ජනපද	57,766,295	50,730,932
බෞද්ධ සංගමය පාලන ගිණුම - ප්‍රධාන කාර්යාලය	-	4,230
සකසුරුවම් සමිතිය පාලන ගිණුම	-	36,510
අනෙකුත් දෙපාර්තමේන්තු පාලන ගිණුම	-	69,221
ගෙවිය යුතු සත පාලන ගිණුම - ප්‍රධාන කාර්යාලය	-	2,376
වෘත්තීය සමිති පාලන ගිණුම	-	4,979
රක්ෂණ පාලන ගිණුම	-	1,178,882
ගනුදෙනුකරුවන් වැඩිපුර ගෙවීම්	-	2,734,019
වෛද්‍ය යෝජනා ක්‍රමය	2,717,504	2,816,609
කම්කරු නඩු සඳහා වෙන්කිරීම්	4,747,407	4,747,407
උප කොන්ත්‍රාත් ණය හිමියෝ	614,420	2,202,546
උපචිත වියදම්	55,293,896	39,261,285
ලක්කම් ණය හිමියෝ	2,021,433	3,433,936
ප්‍රදර්ශනය සම්බන්ධ ගෙවියු යුතු මුදල්	2,436,177	2,026,951
	195,647,606	**128,578,576**

මණ්ඩලයේ අදහස්

දැක්වීම පිණිස

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } අයිඑම්යූ/ඒ/අයිඩීබී/1/17/25 මබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2018 ඔක්තෝබර් 05 දින

Chairman's Office
12 OCT 2018
Industrial Development Board of Ceylon

සභාපති

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ 38 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුමත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයෙහි 32 වගන්තිය ප්‍රකාරව, ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකල යුතුය. එහෙත් රොබෝ තාක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා අමාත්‍යාංශය මගින් 2016 හා 2017 වර්ෂවලදී ලබා දී තිබූ රු.60,000,000 ක ප්‍රදාන හා එම මුදල් වැය කර මිලදීගෙන තිබූ රු.57,195,219 ක වත්කම් එකිනෙකට හිලව්කර රු.2,804,781 ක ශුද්ධ ශේෂය පමණක් ජංගම නොවන වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන ප්‍රදාන රු.57,195,210 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08

ප්‍රමිත 42 ඡේදය ප්‍රකාරව, අස්තිත්වයක් විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි වරද සිදුවූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවත් එපරිදි කටයුතු කිරීමකින් තොරව ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ශේෂයන්ට ගැලපීම් කර 2016 වර්ෂයේ සංසන්දනාත්මක අගයන් ඉදිරිපත්කර තිබුණි. තවද, ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව, පෙර කාලපරිච්ඡේද වැරදි සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙලිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

(i) ප්‍රමිතයෙහි 36 වගන්තිය පරිදි ස්ථාවර වත්කම් අයිතමයන් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම් පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කල යුතු වුවද, ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමේදී පිළිවෙලින් රු.39,163,047 ක හා රු.155,469,122 ක වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ii) යන්ත්‍ර උපකරණ, මුද්‍රණ යන්ත්‍ර, කාර්යාල උපකරණ බයිසිකල් හා පරිගණක ප්‍රත්‍යාගණන වටිනාකම රු.65,735,659 ක් ගිණුම්ගත කර තිබුණද, පිරිවැය මත ක්ෂය ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය රු.881,401 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18**

ඉල්ලුම්කල නිෂ්පාදනයන් සිදුකර භාරදී නොතිබියදී ප්‍රමිතයෙහි 14 වගන්තියට පටහැනි ලෙස ඉන්වොයිස් වටිනාකම රු.3,902,217 ක් වූ නිෂ්පාදනයන් සමාලෝචිත වර්ෂයේ විකුණුම් ලෙසද ඊට අදාළ පිරිවැය රු.2,225,726 ක් විකුණුම් පිරිවැය ලෙසද ගිණුම්ගතකර තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20**

රජයේ ප්‍රදාන වශයෙන් වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.1,964,238,178 ක්වූ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය ප්‍රමිතයේ 12 ඡේදය ප්‍රකාරව, ක්‍රමානුකූල පදනමක් මත ලියාහැරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39**

ප්‍රමිතයෙහි 46(අ) වගන්තිය ප්‍රකාරව, වෙළඳ පොලී අනුපාතයට අඩුවෙන් දෙන ලද සේවක ණය, සඵල පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගත යුතු අතර වෙළඳ පොලී අනුපාතය හා ණය සඳහා ලැබෙන පොලී අනුපාතය අතර වෙනස සේවක පිරිවැය ලෙස හඳුනාගෙන නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී විශේෂ ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ රු.30,600,174 ක පුනරාවර්තන ප්‍රදාන සහ එම ව්‍යාපෘති සඳහා දරන ලද රු.36,365,951 ක වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ගැලපීම් කිරීමකින් තොරව ප්‍රදාන ගිණුමක් හරහා ගැලපීම් කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත්තු සඳහා ගෙවීම් කිරීමේදී සමාලෝචිත වර්ෂයේදී අඩුකරන ලද රඳවාගත් මුදල් රු.3,062,748 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) බුත්තල කාර්මික ජනපදයේ අභ්‍යන්තර මාර්ග, කානු පද්ධතිය සකස් කිරීම හා වැට ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවලට අදාලව සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද එකතු කල අගය මත බදු රු.1,644,239 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඈ) අනුරාධපුර නැගම්පහ කාර්මික ජනපදයේ ඉඩම සුද්ද කිරීම හා වැට ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවට අදාළව ගෙවියයුතු වියදම් රු.993,089 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාලව ක්ෂයවීම් ලෙස වැරදීමකින් ප්‍රත්‍යාගණන සංචිතයට හර කර තිබූ රු.11,051,161 ක් සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි.

(ඊ) වර්ෂ ගණනාවක සිට ප්‍රදාන ලෙස ලැබී තිබූ තොග අයිතමවල වටිනාකම් ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්මික ජනපද අංශයේ වාර්තා අනුව කාර්මික ජනපද 13 කින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු ශේෂය රු. 15,277,733 ක් වුවද ගිණුම් අංශයේ වාර්තා අනුව එය රු.36,150,400 ක් වූයෙන් රු. 20,872,667 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට තොග වටිනාකම් රු.9,494,613 ක් වුවද, භෞතික සත්‍යාපන වාර්තා අනුව තොග ශේෂය රු.8,594,832 ක් වූයෙන් රු.899,781 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු එකතු කල අගය මත බදු රු.51,363,240 ක් වුවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබන එකතු කල අගය මත බදු වාර්තා අනුව එම වටිනාකම් රු.29,408,699 ක් වූයෙන් රු. 21,954,541 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙනත් ලැබිය යුතු වත්කම් ලෙස 2013 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල සිට පැවත එන ශේෂ 04 ක එකතුව රු.1,304,303 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්මික ජනපදවලින් හා ණය ගැතියන්ගෙන් ලැබිය යුතු රු.45,448,707 ක ශේෂයෙන් වර්ෂ 05 ක් ඉක්මවූ ශේෂය රු.24,037,750 ක් වූ අතර මුළු ලැබිය යුතු වටිනාකමින් සියයට 66 ක් එනම් රු.30,096,011 ක් කාර්මික ජනපදවලින් අයවිය යුතු කුලී වටිනාකමින් සමන්විත වී තිබුණි.

(ඇ) වර්ෂ පහකට පෙර සිට පැවත එන සේවක අත්තිකාරම් රු. 928,370 ක් නිරවුල් කර නොතිබුණි.

(ඈ) අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව ගෙවා තිබූ රු.5,402,511 ක අත්තිකාරම් මුදලක් නිරවුල් කර නොතිබුණි.

(ඉ) කාර්මික ජනපද කර්මාන්තකරුවන් වෙත වර්ෂ 05 කට පෙර සිට ගෙවිය යුතුව පැවති රු. 3,072,949 ක ණයගිමි ශේෂය අදාල කර්මාන්තකරුවන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂය හා ඊට පෙර වර්ෂවලට අයත් රු.2,761,479 ක හා සමාලෝචිත වර්ෂයට අදාල රු.3,303,517 ක ජාතිය ගොඩනැගීමේ බදු මුදල දේශීය අදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(උ) 2016 වර්ෂයේ සිට ව්‍යාපෘති වියදම් වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශයෙන් අයවිය යුතු රු.3,731,167 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ 2012 හා 2014 වර්ෂවලදී අගරු වී තිබූ රු.209,398 ක චෙක්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 189 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.18,128,796 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.30,029,583 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.11,900,787 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් රු.50,973,200 කින් වැඩි වී තිබුණද, දළ ලාභය රු.64,515,423 කින් ඉහළ යාම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.84,728,727 ක් වූ ඌනතාවය 2015 වර්ෂයේ දී රු.27,259,111 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණද, නැවතත් 2016 හා 2017 වර්ෂවලදී පිළිවෙලින් රු.30,029,583ක හා රු.18,128,796 ක ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. 68,532,050 ක් ව පැවති දායකත්වය 2017 වර්ෂයේදී රු.213,500,294 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 සැලසුම් කිරීම

2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර තිබුණ ද 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව එය පිළියෙල කර නොතිබුණි.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

(අ) මණ්ඩලය විසින් ප්‍රධාන කාර්ය සාධක දර්ශක 05ක් (KPI) හඳුනාගෙන ඊට අදාලව ක්‍රියාකාරකම් සැලසුම් කර තිබුණද අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වී නොතිබූ බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය තුළ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් 400 ක ගේ ආදායම වර්ධනය කිරීම හා රැකියා අවස්ථා 2000ක් උත්පාදනය කිරීමට අපේක්ෂා කර තිබුණද, කර්මාන්තකරුවන් 187 ක ගේ පමණක් මුළු ආදායම වර්ධනය වී තිබූ අතර, රැකියා අවස්ථා 675 ක් පමණක් උත්පාදනය වී තිබුණි.

(ii) ජනපදවල කඩකාමර හෝ ඉඩම් බදු දීම මගින් නව ව්‍යාපාරික ස්ථාන 125ක් ඇති කර ඉන් රැකියා 500 ක් උත්පාදනය කිරීමට අපේක්ෂා කර තිබුණද, ව්‍යාපාර ස්ථාන 29 ක් ආරම්භ කර රැකියා අවස්ථා 444 ක් පමණක් උත්පාදනය කර තිබුණි. සැලසුම්කල ව්‍යාපාරික ස්ථාන සියල්ලම ආරම්භ කරනු ලැබුවේ නම් විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් උත්පාදනය කර ගැනීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය විය.

(iii) සමාලෝචිත වර්ෂය තුළ සේවා නියුක්තිකයන් 600 ක් පුහුණු කිරීමට සැලැසුම් කර තිබූ නමුත් සේවා නියුක්තිකයන් 198 දෙනෙකුට පමණක් පුහුණුවීම් ලබාදී තිබුණි.

(iv) විදේශ වෙළඳපොල හඳුන්වා දීමේ කාර්ය සාධන දර්ශකය යටතේ කර්මාන්ත 100ක නිෂ්පාදන 25ක් අපනයනය කිරීමට අපේක්ෂා කලද, කර්මාන්ත 15ක නිෂ්පාදන 12කට පමණක් විදේශ වෙළඳපොල හඳුන්වා දී තිබුණි.

(ආ) රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ 2017 වර්ෂය සඳහා සැලසුම්කල ක්‍රියාකාරකම් 11 ක් අතරින් ක්‍රියාකාරකම් 08 ක අපේක්ෂිත ඉලක්ක ළඟා කරගෙන නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බද්දේගම කාර්මික ජනපදය පිහිටුවා ඇති ඉඩම සඳහා පිඹුරුපත් සැකසීම හා මැනුම් කටයුතු සඳහා රු.15,576 ක් හා ඉඩම අත්පත් කර ගැනීම සඳහා අත්තිකාරම් ලෙස රු.500,000 ක් 2007 වර්ෂයේ ගෙවා ඇතත් විගණන දිනය වූ 2018 ජූලි 31 දින දක්වාම එම ඉඩම පවරාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී " foundry plant " නමැති උපකරණය මිලදී ගැනීම සඳහා රු.මිලියන 16 ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබී තිබූ නමුත් එම උපකරණය ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීම පමණක් 2018 සැප්තැම්බර් 12 දින වනවිට සිදුකර තිබුණි.

(ඇ) 2017 වර්ෂය තුළ පැවැත්වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 5 තුළදීම අය නොවන ණයගැති ශේෂ, සේවක අත්තිකාරම් අය කරගැනීම හා පොත්පත් යාවත්කාලීන කිරීම පිළිබඳ තීරණ ගෙන ඇතත් එම ගැටළු නිරාකරනය වී නොතිබුණි.

4.3 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ රබර් නිෂ්පාදන කටයුතු සඳහා සෘජුව අවශ්‍යවන යන්ත්‍ර 64 කින් යන්ත්‍ර 26 ක් වසර ගණනාවක සිට ක්‍රියාවිරහිත වී තිබුණි. තවද තත්ත්ව පාලන විද්‍යාගාරය (QC Lab) සතුව භාවිතයට ගත නොහැකි තත්ත්වයේ අක්‍රීය උපකරණ 20ක් තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී රු.9,318,026 කට මිලදී ගනු ලැබූ රබර් ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රය මගින් රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තවල නියැලෙන ප්‍රතිලාභීන් 250 කට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම තුළින් කර්මාන්තකරුවන්ට තම නිෂ්පාදනවලට අවශ්‍ය සාම්පල් සකස් කර දීම අරමුණ වී තිබුණි. එසේ වුවද, 2016 සහ 2017 වර්ෂවලදී අභ්‍යාසලාභීන් 17 දෙනෙකු පමණක් පුහුණු කර තිබීම හා එක් ආයතනයකින් පමණක් ඇණවුමක් ලබාගෙන එයද පරීක්ෂණ මට්ටමේ පැවතීම හේතුවෙන් ඉහත අරමුණු කරා ලහා වීම දුර්වල මට්ටමක පැවතුණි.

(ඇ) ගම්මාන සංවර්ධන වැඩ සටහන යටතේ ව්‍යවසායකයින් සඳහා බෙදා දීමට 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මිලදී ගෙන තිබූ වටිනාකම රු.4,130,850 ක් වූ තොග 2018 සැප්තැම්බර් 18 දින වන විටත් බෙදා හැර නොතිබුණි.

4.4 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ අනුමත කාර්යමණ්ඩලයේ තනතුරු 728 ක් අතුරින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවති තනතුරු සංඛ්‍යාව 249 ක් වූ අතර ඒ තුළ ඇතුලත් ඉහළ කළමනාකරණ මට්ටමේ අනුමත තනතුරු 12 න් තනතුරු 05ක්ම පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. තවද, 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයතුලදී අනුමත තනතුරු 08 ක් වෙනුවෙන් නිලධාරීන් 69 දෙනෙකු කොන්ත්‍රාත් හා දෛනික දීමනා පදනම මත බඳවා ගෙන මාසිකව රු.2,236,324 ක් ගෙවා තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය තුල අන්තර්ගත නොවූ උපදේශක තනතුරු 04 ක් සඳහා 2015 හා 2016 වර්ෂවලදී නිලධාරීන් බඳවා ගෙන 2017 දෙසැම්බර් 31 දින දක්වා රු.4,152,023ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.

5. තිරසාර සංවර්ධනය

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාලව මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තා හා ගිණුම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාස 03 ක ප්‍රමාද කාලයකින් පසුව 2018 මැයි 21 දින ඉදිරිපත්කර තිබුණි.

6.2 ප්‍රසම්පාදනයන්

2016/2017 කාලපරිච්ඡේදය වෙනුවෙන් ආරක්ෂක සේවා ලබාගැනීම සඳහා 2016 මාර්තු 15 දින සිදුකර තිබූ ලංසු කැඳවීමට අනුව ලංසු ඇගයීම් කමිටුව විසින් අවම මිල සහිත ලංසු 3 ක් නිර්දේශ කර තිබියදී කිසිදු හේතු දැක්වීමකින් තොරව ප්‍රසම්පාදන කමිටුව විසින් එම මිල ගණන් ප්‍රතික්ෂේප කර, 2016 අගෝස්තු 18 දින නැවත ලංසු කැඳවා තිබුණි. ඒ අනුව දෙවැනි වර ලැබී තිබුණු ලංසු ඇගයීම් කිරීමේදී සුළු බැහැරවීම් ලෙස සැලකිය හැකි ගිණුම් වාර්තා ලබානොදීම වැනි හේතු දක්වා ලංසු 3 ක් සහ අදාල සියළු විස්තර ඉදිරිපත්කර තිබියදී ඒවා නොමැති සේ සලකා තවත් ලංසු 10 ක්ද ප්‍රතික්ෂේප කර, 19 වන මිල සහිත ලංසුව, ජයග්‍රාහී ලංසුකරු ලෙස ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබීම විගණනයේදී ගැටළුකාරී විය. තවද

එම තෝරාගත් ලංසුකරු මාස 2 ක කාලයක් පමණක් සේවා සපයා තිබුණු අතර එම ගෙවූ මිල හා මුල් ලංසු කැඳවීමේ මිල ගණන් සමග සැසඳීමේදී මාස 2 ක් සඳහා රු.769,683 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

6.3 අයවැය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 වගන්තිය ප්‍රකාරව අනුමත අයවැය එළඹෙන වර්ෂයේ මාස 03කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු වුවද මණ්ඩලය විසින් 2016 හා 2017 වර්ෂය තුළ රජයේ දායකත්වය, ආයතනයේ ඉපැයීම් හා සමස්ත වියදම් ඇතුලත් කර වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබූ අතර භාණ්ඩාගාර ප්‍රදාන සඳහා වැය ඇස්තමේන්තුවක් පමණක් පිළියෙල කර තිබුණි.

6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2015 හා 2016 වර්ෂයන් සඳහා වූ වාර්ෂික වාර්තා 2018 ජූලි වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

6.5 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නවබිම ගබඩා පරිශ්‍රයේ (Yard) ගබඩා කර තිබූ කිලෝග්‍රෑම් 1,500 ක් වූ අබලි තොග භෞතිකව සත්‍යාපනය සිදු කර ඇතත් එම වටිනාකම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පානළුව කාර්මික ජනපදයට ඉඩම් අත්පත්කර ගැනීම සඳහා 2016 සැප්තැම්බර් මාසයේදී අමාත්‍යාංශයෙන් රු.මිලියන 25 ක් ලැබී තිබුණද, මෙම වාර්තාවේ දින වනවිටත් ඉඩම් පවරාගෙන නොතිබුණි.

(ඇ) දීර්ඝ කාලයක සිට භුක්ති විඳින ප්‍රධාන කාර්යාල ඉඩම ඇතුළුව දිස්ත්‍රික්ක 10 ක පවත්වාගෙන යන ප්‍රාදේශීය කාර්යාල හා වෙනත් මධ්‍යස්ථාන පවත්වාගෙන යන ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම වත්කම්වල අගය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ)	මූල්‍ය පාලනය	(i)	බැංකු සැසඳුම් නියමිත දිනට ඉදිරිපත් නොකිරීම.
		(ii)	විවිධ අංශවල මූල්‍ය ගනුදෙනුවලට අදාල ලියකියවිලි ගිණුම් අංශය විසින් කාර්යක්ෂමව රැස් නොකිරීම.
(ආ)	ණයගැති පාලනය	(i)	ශේෂ සනාථ ලබා නොගැනීම.
		(ii)	ලේඛන යාවත්කාලීන නොකිරීම.
(ඇ)	තොග පාලනය	(i)	තොග ලේඛන යාවත්කාලීන නොකිරීම.
		(ii)	හානි වූ තොග ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු නොකිරීම.
		(iii)	ඇතැම් තොග අයිතම සම්බන්ධයෙන් ලෙජර්කාඩ් හා බින් කාඩ්පත් ශේෂ අතර අසමානතාවයන් පැවතීම.
		(iv)	අලෙවි අංශය විසින් ක්‍රමානුකූලව පොත්පත් පවත්වා ගෙන නොතිබීම හා භාණ්ඩ නිකුත් කිරීමේදී පවත්නා තොග සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් කර නොතිබීම.
		(v)	මිල අධික තොග නිසි පරිදි ගබඩා කර නොතිබීම හා ගබඩාව අවට ආරක්ෂක විධි විධාන යොදා නොතිබීම.
(ඇ)	ලේඛන පවත්වාගෙන යාම	හානි පාඩු ලේඛනය යාවත්කාලීන නොකිරීම.	

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති